

වාර්ෂික වාර්තාව
හා මූල්‍ය ප්‍රකාශන

2020

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

දැක්ම

"යාවජීව අධ්‍යාපනයේ විශිෂ්ඨත්වය, කාර්යක්ෂම බව හා සාධාරණත්වය මඟින් විවෘත හා දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ ආසියාවේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම"

මෙහෙවර

"විවෘත දුරස්ථ අධ්‍යාපනය මඟින්, උසස් තත්වයක පවත්නා වූ ද, ලද හැකි වූ ද, ජීවිතයට අදාළ වූ ද අධ්‍යාපනයකට පිවිසීමේ ඉඩකඩ සලසා දීම හා දැනුම අඟයන සමාජයක් තුළ ඇත්තා වූ අභියෝගයනට මුහුණ දීමට සමත්, යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීම"

ආයතනික අරමුණු

2016 සිට 2020 දක්වා කාල පරිච්චේඡ්දය තුළ විශ්වවිද්‍යාලයේ ආයතනික අරමුණු පහත දැක්වේ.

1. විවෘත හා දුරස්ථ ඉගෙනුම් තුළින් උසස් ගුණාත්මකභාවය හා අදාළ අධ්‍යාපනය සැලසීම

2. සිසුන්ගේ ජීවන කුසලතා දියුණු කරගැනීම සහ වෘත්තීය අභිලාශයන් සාක්ෂාත් කරගැනීමට සිසුන්ගේ හැකියාව වැඩි දියුණු කිරීම.

3. ශිෂ්‍යත්ව, පර්යේෂණ සහ නවෝත්පාදන පිළිබඳ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීම.

4. අධ්‍යාපන ප්‍රවේශය පුළුල් කිරීම හා යාවජීව ඉගෙනුම් සඳහා අවස්ථා වර්ධනය කිරීම.

5. ඵලදායි හා කාර්යක්ෂම ශාස්ත්‍රීය වාතාවරණයක් විශ්ව විද්‍යාලය තුළ නිර්මාණය කිරීම.

6. උසස් ගුණාත්මකභාවයෙන් යුත් පරිපාලන සේවාවක් සහතික කිරීම.

7. ජාතික හා සමාජීය සංවර්ධනය කෙරෙහි ආයතනික වගකීම් ඉටු කිරීම.

උපකුලපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ශිෂ්‍යයින් සඳහා පදනම් අදියරේ සිට ආචාර්ය උපාධි අදියර දක්වා තම අධ්‍යාපන කටයුතු සිදු කළ හැකි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවෘත හා දුරස්ථ ඉගෙනුම් ආයතනය වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් රජයේ ජාතික විශ්වවිද්‍යාල 15න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නෛතික, ආයතනික හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. විශ්වවිද්‍යාලය අනුගමනය කරන ඉගැන්වීම් ක්‍රමවේදවල ස්වභාවය සහ අප සතුව ඇති යටිතල පහසුකම් හේතුවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය දිවයින පුරා විසිරී සිටින විශාල ශිෂ්‍යයින් ප්‍රමාණයකට සේවා සැපයිය හැකි තත්වයක පවතී. වර්තමානය වන විට, දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9කින් හා අධ්‍යයන මධ්‍යස්ථාන 19කින් සේවාවන් ලබා ගන්නා 40,000කට අධික ශිෂ්‍යයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ඉගෙනුම් ලබයි.

විශ්වවිද්‍යාලයේ මෙහෙවර වන්නේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේදයන් හරහා උසස් තත්වයේ, දැරිය හැකි හා අදාළ අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීම මෙන්ම දැනුම් සමාජයක අභියෝගයන්ට මුහුණ දීම සඳහා යාවජීව ඉගෙනුම් අවස්ථා වැඩි දියුණු කිරීමත්ය. මෙම මෙහෙවර සාක්ෂාත් කරගැනීම උදෙසා, විශ්වවිද්‍යාලය විසින් සෑමවිටම ශිෂ්‍යයින් තම ප්‍රධාන කේන්ද්‍රය කරගනිමින් බොහෝ ක්‍රමවේදයන් අනුගමනය කරයි.

විශ්වවිද්‍යාලය විසින් පීඨ 6කට අයත් අධ්‍යයනාංශ 30ක් මඟින් විවිධ අධ්‍යයන වැඩසටහන් 70කට අධික සංඛ්‍යාවක් පිරිනමනු ලබයි. ශිෂ්‍ය සහය, පර්යේෂණ, උපදේශනය, කර්මාන්ත සබඳතා, කාර්ය මණ්ඩල පුහුණුව, තත්ත්ව සහතික කිරීම ආදිය සඳහා පහසුකම් සැපයීම වෙනුවෙන් මධ්‍යස්ථාන හා ඒකක ගණනාවකින්ද විශ්වවිද්‍යාලය සමන්විත වේ.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු වෙමින් පවතින තාක්ෂණික සංවර්ධනයන්ට සමගාමීව, මාර්ගගත පරීක්ෂණ පැවැත්වීම, මධ්‍යම මණ්ඩපය ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන ගණනාවක් සමඟ යා කරමින් වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම, අපගේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා මාර්ගගත සහාය සැපයීම ඇතුළත්ව, නවීන තාක්ෂණය තුළින් අපයේ ශිෂ්‍යයින් වෙත වැඩි ඉගෙනුම් සහයක් ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය සාමූහික ප්‍රයත්නයක් දියත් කර තිබේ.

විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය අවශ්‍යතා ඇති ශිෂ්‍යයින් සඳහා සහයෝගය දැක්වීම උදෙසා විවිධ ආකාරයේ ශිෂ්‍යත්ව පිරිනමනු ලබයි. අපගේ ශිෂ්‍යත්ව අරමුදල අප විසින් අඛණ්ඩව වැඩි දියුණු කරනු ලබන අතර එමඟින් හැකි තරම් ශිෂ්‍යයින් වෙත ශිෂ්‍යත්ව ලබා දීමට හැකි වනු ඇත.

රැකියාවෙහි නියුතු වැඩහිටියන්ට සහ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළත්වීමට වරම් නොලබන අය සඳහා විකල්ප මාර්ග ලබාදීමෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය වෙත සුවිශේෂ ලෙස පිවිස ඇත.

ශ්‍රී ලංකා රජය හා උසස් අධ්‍යාපන බලධාරීන් විසින් දිවයිනේ ගුණාත්මක උසස් අධ්‍යාපනය සඳහා වැඩි වන ඉල්ලුම වෙත සැපයීම වෙනුවෙන් වැදගත් පාර්ශවකරුවෙක් ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සලකන බව අපි සතුටින් සටහන් කරන්නෙමු. මෙම උදාර අරමුණ ඉටු කිරීම උදෙසා, අප සතු සම්පත් සීමාව තුළ අවශ්‍ය සියලු සහය ලබා දීමට අප සැම කැපවී සිටින්නෙමු.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ඒ අරියදූරෙයි
උපකුලපති

පටුන

- **1 කොටස - සාමාන්‍ය 1**

1.0. සාමාන්‍ය 2

1.1 විශ්ලේෂණය 2

1.2 පාලන අධිකාරිය 5

- **2 කොටස - කාර්ය මණ්ඩලය 9**

2.0. කාර්ය මණ්ඩලය 10

2.1 ආයතනික ව්‍යූහය 10

2.2 කාර්ය මණ්ඩල තොරතුරු 12

- **3 කොටස - ශිෂ්‍ය කාර්ය සාධනය 13**

3.0. ශිෂ්‍ය කාර්ය සාධනය 14

3.1 බඳවා ගැනීම් 14

3.1.1 දේශීය ශිෂ්‍යයින් 14

3.1.2 විදේශීය ශිෂ්‍යයින් 14

3.2 සම්පූර්ණ කිරීම් 15

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය 15

3.2.2 සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 15

3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ 16

- **4 කොටස - පීඨ වාර්තා 17**

4.0. පීඨ වාර්තා 18

4.1 අධ්‍යාපන පීඨය 18

4.1.1 විශ්ලේෂණය 18

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 19

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 20

4.1.4 නව පාඨමාලා/ වැඩසටහන් 20

4.1.5 මාර්ගගත පාඨමාලා 21

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය 23
4.2.1 විශ්ලේෂණය 23
4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 24
4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 25
4.2.4 නව පාඨමාලා/ වැඩසටහන් 25
4.2.5 මාර්ගගත පාඨමාලා 26

4.3 සෞඛ්‍ය විද්‍යා පීඨය 29
4.3.1 විශ්ලේෂණය 29
4.3.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 31
4.3.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 31
4.3.4 නව පාඨමාලා/ වැඩසටහන් 32
4.3.5 මාර්ගගත පාඨමාලා 32

4.4 මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය 35
4.4.1 විශ්ලේෂණය 35
4.4.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 36
4.4.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 37
4.4.4 නව පාඨමාලා/ වැඩසටහන් 37
4.4.5 මාර්ගගත පාඨමාලා 38

4.5 කළමනාකරණ අධ්‍යයන පීඨය 40
4.5.1 විශ්ලේෂණය 40
4.5.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 41
4.5.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 42
4.5.4 නව පාඨමාලා/ වැඩසටහන් 42
4.5.5 මාර්ගගත පාඨමාලා 42

4.6 ස්වභාවික විද්‍යා පීඨය 44
4.6.1 විශ්ලේෂණය 44
4.6.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම 46
4.6.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය 47
4.6.4 නව පාඨමාලා / වැඩසටහන් 47
4.6.5 මාර්ගගත පාඨමාලා 47

- **5 කොටස - පර්යේෂණ හා ප්‍රකාශන.....50**

5.0. පර්යේෂණ හා ප්‍රකාශන.....51

5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා.....51

5.2 ග්‍රන්ථ/ පේටන්ට්.....52

5.3 සම්මාන.....52

- **6 කොටස - මධ්‍යස්ථාන හා ඒකක.....53**

6.0. මධ්‍යස්ථාන හා ඒකක.....54

6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා.....54

6.2 පුස්තකාලය.....56

6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය.....58

6.4 වෘත්තීය උපදේශන ඒකකය.....60

6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය.....61

6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය.....63

6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය.....64

6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය.....72

6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානය.....76

6.10 උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය.....81

6.11 පර්යේෂණ අංශය.....82

6.12 පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය.....84

- **7 කොටස - අනාගත සැලසුම්.....86**

7.0. අනාගත සැලසුම් - 2020.....87

- **8 කොටස - මූල්‍ය තොරතුරු.....90**

8.0. මූල්‍ය තොරතුරු.....91

8.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර:.....91

8.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර:.....91

8.3 ව්‍යාපෘති ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සපයන ලද).....92

8.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්).....95

8.5 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදනය කළ ආදායම).....95

8.6 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය – 2020:.....95

- **9 කොටස - අවසාන ගිණුම්.....96**

9.0. අවසාන ගිණුම්.....97

9.1 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය.....97

9.2 මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය.....99

9.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය.....134

9.4 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය.....135

9.5 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.....136

9.6 අයවැය හා තත්‍ය මුදල් සංසන්දනය කිරීම පිළිබඳ ප්‍රකාශය.....142

9.7 ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කිරීම.....143

9.8 පසුගිය වර්ෂ පහ තුළ මූල්‍යමය ලෙස වැදගත් සිදුවීම්.....144

- **10 කොටස - විගණන වාර්තා.....146**

10.0. විගණන වාර්තා.....147

10.1 විගණකාධිපති වාර්තාව.....147

10.2 පිළිතුරු වාර්තාව.....157

❖ පර්යේෂණ, නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු (ඉංග්‍රිසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල ඇතුළත් වේ. පිටු අංක 165 - 220)

• 1 කොටස – සාමාන්‍ය

1.0. සාමාන්‍ය

1.1 විශ්ලේෂණය



විවෘත හා දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ වර්ෂ 1980 ජූනි මස 19 වැනිදාය. 1978 විශ්වවිද්‍යාල පනතෙහි අංක 16 හි 23 (01) හා 18 වගන්ති ප්‍රකාරව 1980 අංක 03 දරණ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත අනුව ද ඉන් අනතුරුව සංශෝධිත 1983 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ආඥා පනත් අංක 01 හා 1996 ආඥා පනත් අංක 12 යටතේ එම ස්ථාපනය සිදු විය. මෙම ආරම්භක පියවරෙහි අවසාන අරමුණ වූයේ "යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීමත් එමඟින් උසස් අධ්‍යාපනයට පිවිසීම තුළින් ජීවන අවස්ථා වැඩිදියුණු කර ගැනීමට සෑම පුරවැසියෙකු සතු හිමිකම සලසා දීමත්ය."

ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ විශ්වවිද්‍යාල 15න් එකක් වන විවෘත විශ්වවිද්‍යාලය, නීතිමය, ආයතනමය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවලින් ශ්‍රී ලංකාවේ අනිකුත් විශ්වවිද්‍යාල හා සමානව ක්‍රියාකරයි. එසේ වුවද, වයස, පූර්ව අධ්‍යාපන සුදුසුකම්, ආදායම, භූගෝලීය සාධක සහ වෘත්තීමය වශයෙන් ඇති බාධා යන කරුණු කිසිවක් නොතකමින් උසස් අධ්‍යාපනය සඳහා ඉඩකඩ වඩාත් ප්‍රසාරණය කිරීම අරභයා විවෘත හා දුරස්ථ අධ්‍යාපන දර්ශනය කෙරෙහි එහි පවතින නිදහස් ස්වභාවය කරණකොට ගෙන අනිකුත් ජාතික තලයේ විශ්වවිද්‍යාලවලින් මෙම ආයතනය වෙන් කර දැක්විය හැකිය.

දැක්ම

"යාවජීව අධ්‍යාපනයේ විශිෂ්ඨත්වය, කාර්යක්ෂම බව හා සාධාරණත්වය මඟින් විවෘත හා දුරස්ථ අධ්‍යාපනය පිළිබඳ ආසියාවේ ප්‍රමුඛතම ආයතනය බවට පත්වීම"

මෙහෙවර

" විවෘත දුරස්ථ අධ්‍යාපනය මඟින්, උසස් තත්වයක පවත්නා වූ ද, ලද හැකි වූ ද, ජීවිතයට අදාළ වූ ද අධ්‍යාපනයකට පිවිසීමේ ඉඩකඩ සලසා දීම හා දැනුම අගයන සමාජයක් තුළ ඇත්තා වූ අභියෝගයනට මුහුණ දීමට සමත්, යාවජීව අධ්‍යාපන අවස්ථා සැලසීම"

මේ වනවිට වර්ෂයකට ආසන්න කාලයක් පුරා ලෝකය විනාශ කරමින් සිටින ගෝලීය කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය මුළු ලෝකයට, රටට හා අප සියළු දෙනාටම වඩාත්ම අභියෝගාත්මක වර්ෂයක් වී ඇත.

2019 පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයෙන් පසු අපේ රට සහ විශ්වවිද්‍යාලය අඛණ්ඩව දුෂ්කරතාවයන්ට මුහුණ දෙන දෙවන වර්ෂය මෙය වේ. පසුගිය වර්ෂ දෙක තුළ සිදු වූ මෙම සිදුවීම් ජාතියට සහ විශ්වවිද්‍යාලයට දැඩි සමාජ හා ආර්ථික බලපෑම් එල්ල කර ඇත.

පුද්ගලයින්, සමාජය සහ විශ්වවිද්‍යාල ප්‍රජාව වශයෙන් අපට ඇති අභියෝගය වන්නේ නව සාමාන්‍ය තත්ත්වයට අනුකූලව හැඩගැසීමයි. අපගේ අභියෝගයන්ට ගැළපෙන පිළිතුර රඳා පවතින්නේ අප නව සාමාන්‍ය තත්ත්වයට හැඩගැසෙන ආකාරය සහ අප සඳහා මෙන්ම ජාතිය සහ විශ්වවිද්‍යාලය වෙනුවෙන් අප විසින් සැලසුම් කර ඇති ගමනාන්තයට ළඟා වීම සඳහා අපගේ ප්‍රවේශයන් සහ ක්‍රියාවලීන්හි යම් යම් වෙනස්කම් සිදු කරන ආකාරය මතය.

හුරුපුරුදු, සිරිත්, ස්ථාන හා පුද්ගලයින් කෙරෙහි ඇති බැඳීම අත්හැරීමට මිනිසුන් අකමැත්තක් දක්වන බැවින් පුද්ගලික හෝ සංවිධානාත්මක වෙනසක් ක්‍රියාත්මක කිරීම සෑමවිටම අපහසු වේ. මිනිසුන් වෙනසට බියක් දක්වති. ජීවිතය හා අවස්ථාවන් පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රවේශයන් තුළ ආරක්ෂාව සොයා ගැනීමට පුද්ගලයින් නැඹුරු වෙති. වෙනස් වීමට විරෝධය දැක්වීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ වෙනසෙහි බලපෑම පිළිබඳව ඇති අවිනිශ්චිතතාවයයි. නොදන්නා දේ පිළිබඳව ඇති බිය සෑම විටම පුද්ගලයින්ගේ තීරණ කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. එසේම, වර්තමාන තත්ත්වයට බාධා වන බැවින් වෙනස් වීමට එරෙහි වන පුද්ගලයින්ද සිටිති.

විශ්වවිද්‍යාලයක් ලෙස ඉදිරි පස් වසර සඳහා අපගේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්ම (Strategic Management Plan) සකස් කිරීම අභියස අපි සිටින්නෙමු. මෙම සැලැස්ම විශ්වවිද්‍යාලයක් ලෙස 2025 දී අප සිටිය යුතු තත්ත්වය පැහැදිලි කරයි.

පසුගිය වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරන ලද මූඩ්ල් (MOODLE) භාවිතයෙන් මාර්ගගතව සිදු කළ හැකි විකල්ප ඇගයීම් පිළිබඳව පත්‍රිකාවක් (concept paper) විශ්වවිද්‍යාලය විසින් සකස් කරන ලදි.

පද්ධතිය, සැපයුම්, පුහුණුව හා ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම සඳහා ගත යුතු පියවර, මාර්ගගත ඇගයීම් ක්‍රියාවලිය සකස් කිරීමේ විවිධ කාර්යයන් සඳහා වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීම මෙම යෝජනාවට ඇතුළත් වේ.

කොවිඩ් 19 මාර්ගෝපදේශයන්ට අනුකූලව විශ්වවිද්‍යාලය විසින් පරිපාලන ක්‍රියාවලීන් බොහෝමයක් ස්වයංක්‍රීය කිරීමට පියවර ගෙන ඇති අතර එමඟින් හැකි සෑම තැනකම සම්බන්ධතාවයක් ඇති වීමෙන් තොරව සන්නිවේදන කටයුතු සිදු කිරීම සහ බෙදා හැරීමේ යාන්ත්‍රණ අනුගමනය කළ හැකිය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2020 ජූලි 22 වන දින වන විට ජාතිය වෙනුවෙන් වර්ෂ 40ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බැවින් 2020 වර්ෂය විශ්වවිද්‍යාලයට ඉතා වැදගත් වසරක් විය. අවාසනාවකට මෙන් වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් එම උත්සවය සැමරීම සඳහා සැලසුම් කරන ලද සියළුම විශේෂාංග ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

එසේ ගැටළු තිබියදීත් 2020 වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් විවිධ ව්‍යාපෘති ආරම්භ කරන ලදි. විශ්වවිද්‍යාලයීය ප්‍රධාන මණ්ඩපය සහ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය හරිත විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගන්නා ලදි. මේ සඳහා විශ්වවිද්‍යාලය වෙනුවෙන් හරිත ප්‍රතිපත්තියක් සකස් කර අනුමත කිරීම සිදු විය. මාතලේ නව අධ්‍යයන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය මධ්‍යස්ථාන ජාලය තවදුරටත් පුළුල් කර ශක්තිමත් කරන ලදි. මේ සමඟ ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම අවම වශයෙන් එක් අධ්‍යයන මධ්‍යස්ථානයකින් සමන්විත වීම යන විශ්වවිද්‍යාලයීය අරමුණ සාක්ශාත් වන ලදි.

සියළුම අධ්‍යයන හා කළමනාකරණ කාර්යයන් සහ ඉගැන්වීම් - ඉගෙනුම් කර්යයන් සඳහා සහාය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සතුව පුළුල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) තිබුණද OMIS පද්ධතිය වැඩි දියුණු කිරීමට

අවශ්‍ය විය. එමනිසා, තොරතුරු තාක්ෂණ අංශයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ නායකත්වය ඇතිව ව්‍යාපෘතිය භාර නියෝජ්‍ය තොරතුරු පද්ධති කළමනාකරු සමඟ නව කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියක් විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කරන ලදි. OMIS පද්ධතියෙහි පළමු උප මොඩියුලය වන Application module 2020 ඔක්තොබර් මස නිකුත් කරන ලදි. නව OMIS පද්ධතියෙහි පළමු මොඩියුලය වන Registration Module 2021 පෙබරවාරි මස නිකුත් කිරීමට අපේක්ෂා කෙරේ.

මධ්‍යම මණ්ඩපයේ සහ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල WIFI පහසුකම් පුළුල් කිරීමට ද විශ්වවිද්‍යාලය විසින් පියවර ගන්නා ලදි.

විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සැසි (OUIRS-2020) සම්පූර්ණයෙන්ම මාර්ගගත සම්මන්ත්‍රණයක් ලෙස සාර්ථකව පවත්වන ලදි. විශ්වවිද්‍යාලයීය පුස්තකාලය විසින් ජාතික විද්‍යුත් පුස්තකාල ව්‍යාපෘතියට අඛණ්ඩව සම්බන්ධ වූ අතර රට පුරා මහජන පුස්තකාල බොහෝමයක් ස්වයංක්‍රීය කර ඇත. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටා ඇති නගරවල සිටින විවෘත විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයින් සඳහා පුස්තකාල සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ දෙවන පුස්තකාලය (Library Corner) මහජන පුස්තකාලයක් තුළ විවෘත කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් හම්බන්තොට මහ නගර සභාව සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදි. විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සඳහා භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ පියවරක් වශයෙන් ශිෂ්‍යයින් සඳහා ව්‍යායාම ශාලාවකින් විශ්වවිද්‍යාලය සමන්විත වේ.

යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ යෝජිත සිව් මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කෙරෙමින් පවතින අතර 2021 වර්ෂය තුළ එම ගොඩනැගිල්ල භාවිතය සඳහා විවෘත කිරීමට අපට හැකිවනු ඇත.

ඕනෑම අධ්‍යාපන ආයතනයක අවධාරණය කළ යුතු වැදගත් ක්ෂේත්‍රයක් වන්නේ අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහතික කිරීමයි. මේ සම්බන්ධයෙන් 2020 වර්ෂය තුළ ආයතනික සමාලෝචනයේ තුන්වන වටය විශ්වවිද්‍යාලයේදී සිදු විය. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා සැලසුම් කරන ලද අධ්‍යයන වැඩසටහන් සමාලෝචනය සිදු කළ නොහැකි විය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර තත්ත්ව පරිපාලන ඒකකය, තත්ත්ව පරිපාලනය කිරීමේ මධ්‍යස්ථානය දක්වා උසස් කරන ලදි.

විශ්වවිද්‍යාලයීය ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් විවිධ ක්‍රියාකාරකම් ආරම්භ කළ අතර විශේෂයෙන් කෘෂිකාර්මික හා ආහාර කර්මාන්තයේ සහයෝගිතා ව්‍යාපෘති සඳහා ව්‍යාපාර සමඟ හවුල්කාරීත්වයට පිවිසීමේ ක්‍රියාවලි යක නිරත වේ.

විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති අවස්ථාව තෝරාගත් රැකියාවෙහි නියුතු වැඩිහිටියන්ට සහ තරුණ ප්‍රජාවට අධ්‍යාපනය සඳහා විකල්ප මාර්ග සැපයීම මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශේෂී ලෙස පිවිස ඇති බවට කිසිදු සැකයක් නැත.

උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වීමට සුදුසුකම් ඇති සියළු දෙනාගේ අවශ්‍යතා සපුරාලීම සඳහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීමට ශ්‍රී ලංකා රජය උනන්දු වන අතර මේ රටේ ගුණාත්මක උසස් අධ්‍යාපනය සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා වැදගත් හවුල්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සලකනු ලබයි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී දායකත්වයෙන් මෙම අභිමතාර්ථය ඉටු කර ගැනීමට රටට හැකිවනු ඇතැයි විශ්වවිද්‍යාලය විශ්වාස කරයි.

1.2 පාලන අධිකාරිය

විශ්වවිද්‍යාලයේ කුලපති: විද්‍යාජෝති මහාචාර්ය කොල්වින් ගුණරත්න
මහාචාර්ය. ධම්මික ඒ. තන්ත්‍රිගොඩ
(2020.09.09. සිට)

විශ්වවිද්‍යාලයීය පාලක සභාව:

නිල බලයෙන් සාමාජික

උපකුලපති: ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්.ඒ අරියදුරෙයි
නියෝජ්‍ය උපකුලපති: ආචාර්ය. ඒ.පී මදුරප්පෙරුම

පීඨාධිපතිවරු

අධ්‍යාපන පීඨය: මහාචාර්ය. එස්. පී. කරුණානායක මිය
ඉංජිනේරු තාක්ෂණ පීඨය: මහාචාර්ය. ඩී. ඒ. ආර්. දොලගේ
සෞඛ්‍ය විද්‍යා පීඨය: මහාචාර්ය. ජී. ආර්. රණවක මෙය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය: ආචාර්ය. එස්. එන්. මොරායස්
කළමනාකරණ අධ්‍යයන පීඨය: මහාචාර්ය. වී. සිවලෝකතාසන්
ස්වභාවික විද්‍යා පීඨය: මහාචාර්ය. ජේ.සී.එන්. රාජේන්ද්‍ර

සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයින් වනුයේ,
මහාචාර්ය. කේ. එස්. වීරසේකර
මහාචාර්ය. එස්. ආර්. වීරකෝන්

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,
එම්. එම්. ක්‍රිශාන්ති මෙය

රාජ්‍ය තොරතුරු අමාත්‍යාංශය විසින් පත් කළ සාමාජිකයා වනුයේ,
ඩී. පී. යූ. වේලාරත්න මෙය

උපකුලපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව විසින් පත් කළ සාමාජිකයා වනුයේ,
මහාචාර්ය. කේ. කේ. සී. කේ පෙරේරා
මහාචාර්ය. චන්ද්‍රිකා එන්. විජේරත්න
(2020.10.05 සිට)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් වනුයේ,
මහාචාර්ය. රංජිත් ජයසේකර
ආචාර්ය. අනුර ඒකනායක
ආචාර්ය. චානක තල්පහේවා
ආචාර්ය. එන්. සී. කුමාරසිංහ
තිස්ස නන්දසේන මහතා
රංජිත් පී රූබසිංහ මහතා
පී. රණේපුර මහතා
අශේන් ජයසේකර මහතා
රූබන් වික්‍රමාරච්චි මහතා
තුසාන්ත විජේමාන්න මහතා (2020.09. 03 සිට)
ජී. තිස්සකුට්ටිආරච්චි මහතා (2020.09.16 සිට)
නවීන් මාරපන මහතා (2020.09.16 සිට)

ලේකම්

ලේඛකාධිකාරී: ඩබ්ලිව්.එල්.වින්ධ්‍යා ජයසේන මිය

විශ්වවිද්‍යාලයීය සනාතන සභාව:

නිල බලයෙන් සාමාජික

උපකුලපති:	**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්.ඒ අරියදුරෙයි (සභාපති)**
නියෝජ්‍ය උපකුලපති:	**ආචාර්ය. ඒ.පී මදුරප්පෙරුම**

පීඨාධිපතිවරු

අධ්‍යාපන පීඨය:	මහාචාර්ය.එස්.පී. කරුණානායක මිය
ඉංජිනේරු තාක්ෂණ පීඨය:	මහාචාර්ය. ඩී. ඒ. ආර්. දොලගේ
සෞඛ්‍ය විද්‍යා පීඨය:	මහාචාර්ය. ජී. ආර්. රණවක මෙය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය. එස්. එන්. මොරායස්
කළමනාකරණ අධ්‍යයන පීඨය:	මහාචාර්ය. වී. සිවලෝකතාසන්
ස්වභාවික විද්‍යා පීඨය:	මහාචාර්ය. ජේ.සී.එන්. රාජේන්ද්‍ර

අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ / ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය:	මහාචාර්ය.එච්.කේ. රඹුක්වැල්ල
වැඩබලන අධ්‍යක්ෂ / අධ්‍යාපනික තාක්ෂණික සහ මාධ්‍ය මධ්‍යස්ථානය:	ආචාර්ය.ඩබ්ලිව්.වී.ජේ.පෙරේරා
වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා:	ආචාර්ය.එන්.එස්. අබේසිංහ

අධ්‍යනාංශ ප්‍රධානීන්

ප්‍රධානී/ මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන:	ඩී.එම්.ඩබ්ලිව්.මුණසිංහ මෙය
ප්‍රධානී/ ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන:	ආචාර්ය.ඩබ්ලිව්.එම්.එස්.වනසිංහ
ප්‍රධානී/ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන:	මහාචාර්ය.එස්.කුගමූර්ති මෙය
ප්‍රධානී/ අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ:	සී.හේවාපතිරණ මෙය
ප්‍රධානී/ කෘෂිකාර්මික සහ වැවිලි ඉංජිනේරු විද්‍යාව:	ආචාර්ය.එච්.කේ.එල්.කේ ගුණසේකර
ප්‍රධානී/ පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය:	ආචාර්ය.එම්.ඊ.ආර්. පෙරේරා
ප්‍රධානී/ සිවිල් ඉංජිනේරු:	ආචාර්ය.පී.ඒ.කේ කරුණානන්ද
ප්‍රධානී/ විදුලි සහ පරිගණක ඉංජිනේරු:	ආචාර්ය.ඩී.ඩී.එම් රණසිංහ මෙය
ප්‍රධානී/ ගණිත සහ ඉංජිනේරු විද්‍යාවේ දර්ශනය:	සී.පී.එස්.පතිරණ ජී. නන්දසේන මහතා (2020.09.01 සිට)
ප්‍රධානී/ යාන්ත්‍රික ඉංජිනේරු:	ආචාර්ය.ඩී.එච්.ආර්.ජේ.විමලසිරි ආචාර්ය.අයි.යූ. අත්තනායක (2020.02.01 සිට)
ප්‍රධානී/ භාෂා අධ්‍යයන:	ආචාර්ය.එන්.කේ අබේසේකර මෙය
ප්‍රධානී/ සමාජ අධ්‍යයන:	ආචාර්ය.එච්. අමරසූරිය මෙය මහාචාර්ය.ඒ.පියරත්න (2020.09.01 සිට)
ප්‍රධානී/නීති අධ්‍යයන:	
නීති අධ්‍යයනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.සී.ඊ ගුණරත්න
ප්‍රධානී/ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම්:	ආචාර්ය.එස්.ඒ.ඒ.කේ සතරසිංහ
ප්‍රධානී/ අලෙවිකරණ කළමනාකරණ:	මහාචාර්ය.එන්.අබේසේකර
ප්‍රධානී/ ගිණුම්කරණය හා මූල්‍ය:	ආචාර්ය.එල්.පී.එස්. ගාමිණී
ප්‍රධානී/ සංවිධාන අධ්‍යයන:	එස්.ඒ.ඩී සේනානායක මහතා
ප්‍රධානී/ මානව සම්පත් කළමනාකරණය:	කේ.පී නිශාන්ත මහතා
ප්‍රධානී/ ගණිත:	කේ.ඩී.වී.එෆ්. සිරිවර්ධන මෙය
ප්‍රධානී/ පරිගණක විද්‍යා:	අයි.ඩී.අයි.ඩී ආරියසිංහ මෙය
ප්‍රධානී/ භෞතික විද්‍යා:	ආචාර්ය. එන්. කාර්තිකෙයන්
ප්‍රධානී/ රසායන විද්‍යා:	ආචාර්ය.ආර්. සෙන්තිල්නිති
ප්‍රධානී/ උද්භිද විද්‍යා:	ආචාර්ය.එච්.එල්.ඩී.වීරහේවා මෙය

	ආචාර්ය.කේ.ඕ.එල්.සී කරුණානායක (2020.03.24 සිට)
ප්‍රධානී/ සත්ව විද්‍යා:	ආචාර්ය.එන්.එන්.පුංචිහේවා මෙය ආචාර්ය. කේ.එච්. ජයවර්ධන (2020.06.01 සිට)
ප්‍රධානී/ වෛද්‍ය රසායනාගාර විද්‍යා:	ආචාර්ය.ඩී.ටී විජේරත්න මෙය
ප්‍රධානී/ ඖෂධ විද්‍යා:	පී.ඩබ්ලිව්.ජී.ඩී.පී සමරසේකර මෙය ආර්.බී.ජේ බුද්ධිකා මෙය (2020.08.01 සිට)
ප්‍රධානී/ හෙද විද්‍යා:	ආචාර්ය.ඩබ්ලිව්.එන් ප්‍රියන්ති මෙය ආචාර්ය.කේ.ඒ ශ්‍රියානි මෙය (2021.01.01 සිට)
ප්‍රධානී/ මූලික විද්‍යා:	එම්.ආර්.එම් හනීෆා මහතා ආචාර්ය.කේ.විවේහනාදන් මෙය (2020.02.01 සිට)
ප්‍රධානී/ මනෝවිද්‍යා සහ උපදේශන:	ආචාර්ය.ජී.පී.ගමගේ මෙය ආචාර්ය.එච්.එම්.සී.ජේ හේරත් මෙය (2020.02.01 සිට)

ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්

රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය කේ.එස්.ඩී.පෙරේරා
කෘෂි කාර්මික සහ වැවිලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය සී.එස් ද සිල්වා මෙය
සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.කේ.එස්.වීරසේකර
සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.ටී.එම් පල්ලෙවත්ත
සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.එච්.ටී.ආර් ජයසූරිය මෙය
භූ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය:	මහාචාර්ය.ජී.ඩබ්ලිව්.ඒ.ආර්. ප්‍රනාන්දු

මහාචාර්යවරුන්

උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එල්.කේ.සේනාරත්න මෙය
සමාජ අධ්‍යයන පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.ඒ.එස්.චන්ද්‍රබෝස්
භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.වී.පී.එස් පෙරේරා
පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.සී.එන් හේරත්
උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ආර්.වීරකෝන් මෙය
උද්භිද විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එච්.එල්.ඩී වීරහේවා
යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ඒ.එම්.ඒ.එන්.එස් සේනානායක
රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය. ජී.බණ්ඩාරගේ
භෞතික විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.ජී.කේ.ආර් සේනාධීර
පාරිසරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.බී.සී.එල් අතපත්තු
රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය:	මහාචාර්ය.එස්.ආර් හෙට්ටිආරච්චි

පුස්තකාලයාධිපති

පුස්තකාලයාධිපති:	ආචාර්ය.ඩබ්ලිව්. සෙනෙවිරත්න ඒ.එච්.කේ. බාලසූරිය මහතා (2020.06.11 සිට වැඩබලන පුස්තකාලයාධිපති)

පීඨ නියෝජිතයින්

නියෝ/ අධ්‍යාපන පීඨය:	සී.හේවාපතිරණ මෙය ආචාර්ය.ටී. මුකුන්තන් (2020.06.01 සිට)
නියෝ/ අධ්‍යාපන පීඨය:	ආචාර්ය.එස්.කුගමූර්ති ආචාර්ය.එෆ්.එම් නවස්තීන් (2020.02.03 සිට)
නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය:	ආචාර්ය.ඩී.එන්.බාලසූරිය
නියෝ/ ඉංජිනේරු තාක්ෂණ පීඨය:	ඩී.අයි ප්‍රනාන්දු මහතා
නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය.බී.එම්.පී. මෙන්ඩිස් ශර්බට් මහතා (2020.08.12 සිට)
නියෝ/ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය. වී.වී මැදවත්තේගෙදර මෙය
නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය:	ආචාර්ය.එස්.කේ විජේසේකර මෙය
නියෝ/ ස්වභාවික විද්‍යා පීඨය:	ඩබ්ලිව්.සී.උඩුවෙල මෙය ආචාර්ය.එච්.කේ.ඩබ්ලිව්.අයි ජයවර්ධන මෙය
නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය. ඕ.කේ.ඩී.යූ.පී නිශ්ශංක
නියෝ/ සෞඛ්‍ය විද්‍යා පීඨය:	ආචාර්ය.කේ.ඒ ශ්‍රියානි
නියෝ/ කළමනාකරණ අධ්‍යයන පීඨය:	එස්.එස්.කේ එදිරිසිංහ මහතා
නියෝ/ කළමනාකරණ අධ්‍යයන පීඨය:	ආචාර්ය. එච්.ඩී.ඩී.සී ලියනගමගේ

ලේකම්

නියෝජ්‍ය ලේඛකාධිකාරී/අධ්‍යයන පරිපාලන:	පී.කේ. සෙනෙවිරත්න මහතා

විශ්වවිද්‍යාලයීය නිලධාරීන්:

උපකුලපති:	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය. එස්.ඒ අරියදුරෙයි
නියෝජ්‍ය උපකුලපති:	ආචාර්ය. ඒ.පී මදුරප්පෙරුම
ලේඛකාධිකාරී:	ඩබ්ලිව්.එල්.වින්ධ්‍යා ජයසේන මිය
අධ්‍යාපන පීඨය:	මහාචාර්ය.එස්.පී. කරුණානායක මිය
ඉංජිනේරු තාක්ෂණ පීඨය:	මහාචාර්ය. ඩී. ඒ. ආර්. දොලගේ
සෞඛ්‍ය විද්‍යා පීඨය:	මහාචාර්ය. ජී. ආර්. රණවක මෙය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය:	ආචාර්ය. එස්. එන්. මොරායස්
කළමනාකරණ අධ්‍යයන පීඨය:	මහාචාර්ය. වී. සිවලෝකතාසන්
ස්වභාවික විද්‍යා පීඨය:	මහාචාර්ය. ජේ.සී.එන්. රාජේන්ද්‍ර
පුස්තකාලයාධිපති:	ආචාර්ය.ඩබ්ලිව්. සෙනෙවිරත්න ඒ.එච්.කේ. බාලසූරිය මහතා (2020.06.11 සිට වැඩබලන පුස්තකාලයාධිපති)
මූල්‍යාධිකාරී:	ආචාර්ය. ඩබ්ලිව්.එම්.කේ.ජී.ඒ වික්‍රමසිංහ
වැඩබලන අධ්‍යක්ෂ /	
අධ්‍යාපනික තාක්ෂණික සහ මාධ්‍ය මධ්‍යස්ථානය:	ආචාර්ය.ඩබ්ලිව්.වී.ජේ.පෙරේරා
වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා:	ආචාර්ය.එන්.එස්. අබේසිංහ

- **2 කොටස – කාර්ය මණ්ඩලය**

2.0. කාර්ය මණ්ඩලය

2.1 ආයතනික ව්‍යූහය

විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය (රූපසටහන 2) සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයක ආයතනික ව්‍යූහය හා බෙහෙවින් එක සමාන වන අතර විවෘත හා දුරස්ථ අධ්‍යාපනික විශ්වවිද්‍යාලවලට විශේෂිත වූ අමතර තනතුරු එනම් අධ්‍යක්ෂ තනතුරු යනාදියත්, ප්‍රාදේශීය අධ්‍යාපනික සේවාවන්, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය යනාදී සේවාවලින් පමණක් වෙනස්කමක් දක්වයි. කුලපති තනතුර ගෞරවාන්විත තනතුරක් වන අතර උපකුලපතිවරයා ප්‍රධාන විධායක නිළධාරී සහ ගිණුම් නිළධාරී වේ. ලේඛකාධිකාරී ආයතනයෙහි පරිපාලනය, ආයතන සතු ලිපි ලේඛන හා වත්කම්වලට වගකිව යුතු වේ. ලේඛකාධිකාරී විශ්වවිද්‍යාලයේ සහකාර ගිණුම් නිළධාරී වේ. අනෙක් නිළධාරීන් වනුයේ පීඨාධිපතිවරුන්, අධ්‍යක්ෂ/ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය, අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා, පුස්තකාලයාධිපති හා මූල්‍යාධිකාරීවරයාය.

ඊට අමතරව විශ්වවිද්‍යාල කටයුතු පුළුල් කිරීම හා අධික්ෂණය කිරීම සඳහා එම අංශවල අර්ධකාලීන අධ්‍යක්ෂවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රධානත්වයෙන් ඒකක කිහිපයක් විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කර ඇත. උදාහරණයක් ලෙස,

- ප්‍රාදේශීය අධ්‍යාපන සේවා
- වෘත්තීය උපදේශන ඒකකය
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
- මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය
- ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය
- ජාත්‍යන්තර සබඳතා ඒකකය
- ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය
- අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය
- උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානය
- පර්යේෂණ ඒකකය
- පාරිසරික අධ්‍යනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය



රූපසටහන 1 - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යූහය

2.2 කාර්ය මණ්ඩල තොරතුරු

ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා සපුරාලීමට ආයතනයෙහි කාර්ය මණ්ඩලයට 2020 වර්ෂය වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර) **347**ක් ද අනධ්‍යයන පරිපාලන කාර්ය මණ්ඩලය (ස්ථිර) **81**ක් ද, අනධ්‍යයන පරිපාලන නොවන කාර්ය මණ්ඩලය හා අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය **633**ක් ද ඇතුලත් වූහ.

සේවා කාණ්ඩය	වැටුප් කේතය	වර්තමාන කාර්ය මණ්ඩලය		
		ස්ථිර		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය — නුපුහුණු	PL-1	159	17	176
ප්‍රාථමික ශ්‍රේණිය — අර්ධ පුහුණු	PL-2	42	0	42
ප්‍රාථමික ශ්‍රේණිය — පුහුණු	PL-3	56	0	56
ද්විතියික මට්ටම				
කළමනාකාර සහකාර — තාක්ෂණික නොවන	U-MN I	98	208	306
කළමනාකාර සහකාර — තාක්ෂණික	U-MT I	32	13	45
සහාය නිලධාරීන් — 2 කාණ්ඩය	U-MN2	3	0	3
සහාය නිලධාරීන් —1 කාණ්ඩය	U-MN3	9	2	11
මාණ්ඩලික සහකාර / විශේෂ සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN4	1	0	1
තෘතියික මට්ටම				
අධ්‍යයන සහාය — 2 කාණ්ඩය	U -AS1	1	0	1
කණිෂ්ඨ විධායක / කළමනාකාරවරුන්	U -EX1	25	23	48
අධ්‍යයන සහාය —1 කාණ්ඩය	U -AS2	14	10	24
ජ්‍යෙෂ්ඨ මට්ටම				
වෛද්‍ය නිලධාරී	U-MO 1			
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U-MO 2			
මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX2	17	12	29
මධ්‍යම මට්ටමේ විධායකයින්	U-EX 2(a)			
ජ්‍යෙෂ්ඨ විධායකයින්	U-EX3	3	1	4
කථිකාචාර්ය	U-AC 3	131	186	317
සහාය මහාචාර්ය	U-AC 4	1	1	2
මහාචාර්යවරුන් / ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්	U-AC 5	17	11	28
එකතුව		**609**	**484**	**1093**

1 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලය

• 3 කොටස – ශිෂ්‍ය කාර්ය සාධනය

3.0. ශිෂ්‍ය කාර්ය සාධනය

3.1 බඳවා ගැනීම්

3.1.1 දේශීය ශිෂ්‍යයින්

2020 වර්ෂයේ සම්පූර්ණ සිසුන් බඳවාගැනීම් සංඛ්‍යාව **44631**ක් විය.

බඳවාගැනීමේ අදියර	පීඨය							
	ඉංජිනේරු තාක්ෂණ	මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	කළමනාකරණ අධ්‍යයන	අධ්‍යාපන	ස්වභාවික විද්‍යා	සෞඛ්‍ය විද්‍යා	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	එකතුව
සහතික පත්‍ර	53	1597	842	547	845	-	-	**3884**
ඩිප්ලෝමා	17	262	-	306	99	-	-	**684**
උපාධි	4855	6719	3689	1355	3517	3606	-	**23741**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	-	-	-	4259	-	-	-	**4259**
ශාස්ත්‍රපති	142	161	196	1019	143	-	-	**1661**
StART@OUSL*		-	-	-	-	-	10364	**10364**
වෙනත්	07	-	-	-	-	-	-	**07**
දර්ශනගුරු/ දර්ශනපති	10	01	01	04	14	01	-	**31**
එකතුව	**5084**	**8740**	**4728**	**7490**	**4618**	**3607**	**10364**	**44631**

2 වගුව: 2020 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් - දේශීය

3.1.2 විදේශීය ශිෂ්‍යයින්:

පීඨය	වැඩසටහන	සංඛ්‍යාව
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	සමාජ විද්‍යා ශාස්ත්‍රවේදී උපාධිය	01
කළමනාකරණ අධ්‍යයන	ව්‍යාපාර/ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පොදු රාජ්‍ය මණ්ඩල විධායක ශාස්ත්‍රපති උපාධිය	01
අධ්‍යාපන	අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	01

3 වගුව: 2019 වසරේ ශිෂ්‍ය බඳවාගැනීම් - විදේශීය

3.2 සම්පූර්ණ කිරීම්

3.2.1 උපාධි ප්‍රදානෝත්සවය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 32(ii), 33(i) වන උපාධි ප්‍රදානෝත්සව 2020 දෙසැම්බර් 15 වන දින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මධ්‍යම මණ්ඩපයේ නව සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. උපාධි ප්‍රදානෝත්සව දේශනය මහාචාර්ය. ලියනගේ අමරකීර්ති මහතා විසින් සූම් තාක්ෂණය හරහා පවත්වන ලදි. ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි හා ආචාර්ය උපාධි යන අදියර යටතේ සිසුන් **1796** දෙනෙක් උපාධි වරම් ලැබූහ. ඔවුන් විශ්වවිද්‍යාලයේ සියළුම පීඨයන් නියෝජනය කරන ලදි.

පීඨය	දර්ශනශූරී	දර්ශනවේදී	ශාස්ත්‍රපති/ විද්‍යාපති	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	උපාධි	එකතුව
අධ්‍යාපන	-	-	65	-	45	**109**
ඉංජිනේරු තාක්ෂණ	-	-	-	-	-	**-**
සෞඛ්‍ය විද්‍යා	-	-	-	-	632	**632**
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	-	-	-	-	779	**779**
කළමනාකරණ අධ්‍යයන	-	-	-	-	226	**226**
ස්වභාවික විද්‍යා	-	-	13	06	-	**19**
ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය (PGIE)	01	03	18	08	-	**30**
එකතුව	**01**	**03**	**96**	**14**	**1682**	**1796**

4 වගුව : පීඨ අනුව උපාධි ප්‍රදාන

3.2.2 සහතික පත්‍ර ප්‍රදානෝත්සවය

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය නොපවත්වන ලදි.

3.3 ශිෂ්‍ය ප්‍රජාවගේ ජයග්‍රහණ

උපකුලපති විසින් පිරිනමන ලද රන් පදක්කම් හා තිළිණ

1. 2019 - වෛද්‍ය රසායනාගාර විද්‍යාවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම ශිෂ්‍යයා සඳහා වන නන්දනී ද සිල්වා රන් පදක්කම.
පදක්කම් ප්‍රදානය : සෞඛ්‍ය විද්‍යා පීඨය
පදක්කම්ලාභියා : හේරත් මුදියන්සේලාගේ සමන් කුමාර හේරත් බණ්ඩාර මහතා

2. 2019 - හෙද විද්‍යාවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම ශිෂ්‍යයා සඳහා වන අතබස්කා විශ්වවිද්‍යාල රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : සභාපති, අතබස්කා විශ්වවිද්‍යාලය, කැනඩාව
පදක්කම්ලාභියා : සෙනරත් පතිරාජගේ ක්‍රිෂ්මිණි දිල්හාරා රණසිංහ මෙනවිය

3. 2019 - නාට්‍ය හා රංග කලාව පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය වෙනුවෙන් හොඳම සමස්ත කාර්යසාධනය සඳහා වන රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : මහාචාර්ය. ජී.ඩී ලේකම්ගේ
පදක්කම්ලාභියා : කවීෂා පමෝදී මුතුගල මෙනවිය

4. 2020 - කළමනාකරණ අධ්‍යයනවේදී උපාධිය වෙනුවෙන් හොඳම කාර්ය සාධනය සඳහා වන රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : කළමනාකරණ අධ්‍යයන පීඨය
පදක්කම්ලාභියා : සමරකෝන් මුදියන්සේලාගේ හේමන්ති දුලන්ජිනි සමරකෝන්

5. 2020 - කළමනාකරණ අධ්‍යයනවේදී (ගෞරව) උපාධි පර්යේෂණය පිළිබඳ විශිෂ්ටතාව සඳහා වන සුදත්ත රණසිංහ රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : CEMBA/CEMPA උපාධිධාරීන් සහ කළමනාකරණ අධ්‍යයන පීඨය
පදක්කම්ලාභියා : සමරකෝන් මුදියන්සේලාගේ හේමන්ති දුලන්ජිනි සමරකෝන්

6. 2020 - නීතිය සඳහා වන ක්‍රිෂාන්ති විජේතුංග ද සිල්වා අනුස්මරණ රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : අයිවර් විජේතුංග
පදක්කම්ලාභියා : උඳුපිටිය ගමගේ නෙලුෆා නදීශානි

7. 2019 - සමාජ විද්‍යාවේදී උපාධිය පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන ගාමිණී කොරයා රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : ශ්‍රී ලංකා ආසියානු පදනම
පදක්කම්ලාභියා : වාසල මුදියන්සේලාගේ ධම්මිකා චන්ද්‍රකාන්ති වාසල මෙනවිය

8. 2019 - ආර්ථික විද්‍යාව පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන එච්.ඒ. ද එස්. ගුණසේකර රන් පදක්කම
පදක්කම් ප්‍රදානය : මහාචාර්ය. එස්.එස්. කොළඹගේ
පදක්කම්ලාභියා : වාසල මුදියන්සේලාගේ ධම්මිකා චන්ද්‍රකාන්ති වාසල මෙනවිය

9. හෙද විද්‍යාව සඳහා වන චන්ද්‍රා ද සිල්වා අනුස්මරණ තිළිණ ප්‍රදානය
තිළිණ ප්‍රදානය : පී.එල්.එන් ද සිල්වා මහතා
තිළිණලාභියා : ගංගොඩ විදානලාගේ අවන්ති පූර්ණිමා ජයරත්න මෙනවිය

10. 2019 - හෙද විද්‍යා විශිෂ්ටත්වය සඳහා වන රොබර්ටා එල්. කැරේ තිළිණ ප්‍රදානය
තිළිණ ප්‍රදානය : මහාචාර්ය. රොබර්ටා ඒ. කැරේ
තිළිණලාභියා : සෙනරත් පතිරාජගේ ක්‍රිෂ්මිණි දිල්හාරා රණසිංහ මෙනවිය

11. 2020 - ඉඩම් නීතිය පිළිබඳ හොඳම ශිෂ්‍යයා සඳහා වන ප්ලැසිඩස් විජේසේකර අනුස්මරණ තිළිණ ප්‍රදානය
තිළිණ ප්‍රදානය : මහාචාර්ය. ඩී. එස් විජේසේකර
තිළිණලාභියා : උඳුපිටිය ගමගේ නෙලුෆා නදීශානි

• 4 කොටස – පීඨ වාර්තා

4.0. පීඨ වාර්තා

4.1 අධ්‍යාපන පීඨය

4.1.1 විශ්ලේෂණය



ශ්‍රී ලංකාව සහ කලාපය තුළ විවෘත සහ දුරස්ථ ඉගෙනුම හරහා අධ්‍යාපනික දැනුම සහ වෘත්තීය පුහුණුව වැඩි දියුණු කිරීමේ පුරෝගාමියෙකු ලෙස කටයුතු කිරීම යන දැක්ම අනුව යමින් අධ්‍යාපන පීඨය සහතිකපත්‍ර මට්ටමේ සිට පශ්චාත් උපාධි මට්ටම දක්වා පුළුල් පරාසයක වැඩසටහන් පිරිනමනු ලබයි. ශ්‍රී ලංකාව තුළ දුරස්ථ ක්‍රමවේදය හරහා පෙරපාසල්, ප්‍රාථමික සහ ද්විතීයික මෙන්ම විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල නියුතු ගුරුවරුන් සඳහා මූලික සහ අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් පිරිනමන විශාලම ප්‍රතිපාදකයන් අතරින් එකක් ලෙස දැක්විය හැකි ය. සෑම අධ්‍යයන වර්ෂයකම මෙම පීඨය මඟින් පිරිනමනු ලබන වැඩසටහන් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයින් සංඛ්‍යාව 7000කට අධික වන අතර සමත් වන ප්‍රතිශතය 80% කට ඉහළ අගයක් ගනී.

අධ්‍යාපන පීඨය තුළ පර්යේෂණ යනු අවශ්‍යම අංගයක් වන අතර කාර්ය මණ්ඩලය පර්යේෂණ ව්‍යාපෘති ගණනාවකට සක්‍රීය ලෙස දායක වී සිටිති.

අධ්‍යාපන පීඨය වර්තමානයේ පහත සඳහන් අධ්‍යනාංශ 4න් සමන්විත වේ.

1. ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය.
2. මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය.
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය.
4. අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ අධ්‍යනාංශය

අධ්‍යාපන පද්ධතිය තුළ සිටින උපාධිධාරී නොවන විද්‍යා ගුරුවරුන් සඳහා වැඩිදුර අධ්‍යාපන අවස්ථා ලබා දීම, සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට අවස්ථාවක් නොලැබෙන ශිෂ්‍යයින් සඳහා අවස්ථා ලබා දීමට හා ගුරු වෘත්තියේ නිරත වීම සඳහා කැමැත්තක් දක්වන විද්‍යා උපාධිධාරීන් සඳහා වෘත්තීය සුදුසුකම් ලබා දීම යන කරුණු අරමුණු කොට ගෙන ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය විසින් අධ්‍යයන වැඩසටහන් 10ක් දැනට පිරිනමනු ලබයි.

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය මඟින් පෙර පාසල් හා ප්‍රාථමික ගුරුවරුන් වෙනුවෙන් වැඩිදුර අධ්‍යාපනය හා පුහුණුව සඳහා අවස්ථා ලබා දීමේ අරමුණ ඇතිව වර්තමානයේ වැඩසටහන් 4ක් පිරිනමනු ලබයි. අධ්‍යයන වැඩසටහන් පැවැත්වීමට අමතරව, කොළඹ, මහනුවර සහ මාතර පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට අනුයුක්ත ආදර්ශ පෙර පාසල් ත්‍රිත්වයෙහි හා ළමා අධ්‍යයන මධ්‍යස්ථානයෙහි ක්‍රියාකාරකම් මෙම අධ්‍යනාංශය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අයිතිවාසිකම් සහතික කිරීම හා ප්‍රවර්ධනය කිරීම මෙන්ම විශේෂ තත්වයන් යටතේ සිටින පුද්ගලයින් සඳහා වර්තමානයේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යයන වැඩසටහන් 03ක් හා කෙටි පාඨමාලා 05ක් පිරිනැමීම යන සමස්ත අරමුණු සහිතව විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය පිහිටුවන ලදි.

අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ අධ්‍යනාංශය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන පීඨය විසින් අභිනවයෙන් පිහිටුවන ලද අධ්‍යනාංශය වේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ ඉතා වැදගත්

සන්ධිස්ථානයක් වශයෙන් ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා ආරම්භ කරන ලද ප්‍රථම අධ්‍යනාංශය මෙය වේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ මට්ටම්වල සිටින විදුහල්පතිවරුන්, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා අධ්‍යාපනඥයින් වැනි අධ්‍යාපන නායකයින්ගේ නායකත්ව හා කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණ ව්‍යූහය වඩාත් ශක්තිමත් කිරීම මෙම නව අධ්‍යනාංශයේ ප්‍රධාන අරමුණ වේ. තවද, අධ්‍යයන පාඨමාලා 03ක් සහ කෙටි පාඨමාලා 02ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

4.1.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

වැඩසටහන	අදියර	මාධ්‍යය	නව බඳවාගැනීම්	සම්පූර්ණ කරන ලද
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යනාංශය				
ඉගෙනීමේ ආබාධ සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ කෙටිකාලීන පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	52	52
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය B.Ed (SNE)	උපාධි	සිංහල, ඉංග්‍රීසි	89	-
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය B.Ed (SNE)	උපාධි	සිංහල, ඉංග්‍රීසි	-	-
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDSNE)	පශ්චාත් උපාධි	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	38	-
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	පශ්චාත් උපාධි	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	97	-
පූර්ව ළමා විය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යනාංශය				
පෙරපාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, ඉංග්‍රීසි	402	-
පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	සිංහල, ඉංග්‍රීසි	30	-
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව	ඩිප්ලෝමා	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	-	-
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	උපාධි	සිංහල, ඉංග්‍රීසි	957	-
ද්විතීය හා තෘතීය අධ්‍යාපන අධ්‍යනාංශය				
අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා)	උපාධි	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	72	10
නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය	උපාධි	සිංහල	35	35
අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	පශ්චාත් උපාධි	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	3047	-
අධ්‍යාපනපති උපාධිය (Course work)	පශ්චාත් උපාධි	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	349	37
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති (ජාත්‍යන්තර) උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	36	28
අධ්‍යාපනපති උපාධිය	පශ්චාත් උපාධි	සිංහල,දෙමළ, ඉංග්‍රීසි	-	-
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	-	-

5 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - අධ්‍යාපන පීඨය

4.1.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
පෙර පාසල් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාව	517	40	25
පෙරපාසල් අධ්‍යාපන උසස් සහතිකපත්‍ර පාඨමාලාව	30		
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමාව	306		
අධ්‍යාපනවේදී උපාධිය (ස්වභාවික විද්‍යා)	72		
නාට්‍ය හා රංගකලාව පිළිබඳ අධ්‍යාපනවේදී උපාධිය	105		
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	957		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනවේදී උපාධිය	132		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	89		
අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	4219		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	40		
ගුරු අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය (ජාත්‍යන්තර)	53		
අධ්‍යාපනපති උපාධිය	173		
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	97		
අධ්‍යාපනපති උපාධිය (Coursework)	696		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය			

6 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය - අධ්‍යාපන පීඨය

4.1.4 නව පාඨමාලා / වැඩසටහන්

පාඨමාලාව / වැඩසටහන	මාධ්‍යය	අදියර
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධිය	සිංහල/දෙමළ/ ඉංග්‍රීසි	6
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධිය	සිංහල/දෙමළ/ ඉංග්‍රීසි	10
අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	සිංහල/දෙමළ/ ඉංග්‍රීසි	10
ගුරු අධ්‍යාපනපති උපාධිය (ප්‍රතිව්‍යූහගත)	සිංහල/දෙමළ/ ඉංග්‍රීසි	9

7 වගුව: නව පාඨමාලා/ වැඩසටහන් - අධ්‍යාපන පීඨය

4.1.5 මාර්ගගත පාඨමාලා

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යනාංශය			
STU5526	අධ්‍යාපනයේ පදනම්	5	ඉංග්‍රීසි
STU5827	නාට්‍ය හා රංග කලාව සඳහා අධ්‍යාපනික තාක්ෂණය	5	ඉංග්‍රීසි
STU5531	සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක අධ්‍යයනය	5	ඉංග්‍රීසි
STU6812	ගුරු පුහුණුව	6	ඉංග්‍රීසි
STU6813	පර්යේෂණ ව්‍යාපෘතිය	6	ඉංග්‍රීසි
STU6514	අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	6	ඉංග්‍රීසි
STU6315	අධ්‍යාපනික කළමනාකරණය	6	ඉංග්‍රීසි
STU5513	සංසන්දනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු	5	ඉංග්‍රීසි
STU6801	නව යොවුන්විය සඳහා මනෝවිද්‍යාව	6	ඉංග්‍රීසි
STP9617	ගුරු අධ්‍යාපනය	9	ඉංග්‍රීසි
STP9618	අධ්‍යාපනය කළමනාකරණය	9	ඉංග්‍රීසි
STP9619	අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	9	ඉංග්‍රීසි
STP9632	අධ්‍යාපනය තුළ පරිගණක තාක්ෂණය	9	ඉංග්‍රීසි
STP9811	අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම්	9	ඉංග්‍රීසි
STP9812	අධ්‍යාපනයේ සමාජ හා දාර්ශනික පදනම්	9	ඉංග්‍රීසි
STP9813	අධ්‍යාපනය තුළ පර්යේෂණ ක්‍රම	9	ඉංග්‍රීසි
විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යානාංශය			
SNU5535	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව	5	ඉංග්‍රීසි
SNU5336	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම	5	ඉංග්‍රීසි
SNU5237	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම	5	ඉංග්‍රීසි
SNU5338	සුවිශේෂීතා සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම	5	ඉංග්‍රීසි
SNU5239	අධ්‍යාපනය තුළ නැගී එන ප්‍රවණතා	5	ඉංග්‍රීසි
SNU5540	සංසන්දනාත්මක අධ්‍යාපනය සහ අධ්‍යාපනික ගැටළු	5	ඉංග්‍රීසි
SNU5341	අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	5	ඉංග්‍රීසි
SNU5242	විශේෂ අධ්‍යාපනය (Inclusive Education)	5	ඉංග්‍රීසි
SNU5343	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	5	ඉංග්‍රීසි
SNU5244	විෂයමාලා න්‍යාය සහ පුහුණුව	5	ඉංග්‍රීසි
SNE5546	විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා හොඳම අධ්‍යාපනික වටපිටාව නිර්මාණය කිරීම	5	ඉංග්‍රීසි
SNE5247	ඇතුළත් වූ පංති පන්ති කාමරය තුළ ළමුන්ගේ ගැටළු පිළිබඳ කටයුතු කිරීම	5	ඉංග්‍රීසි
SNU6620	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	6	ඉංග්‍රීසි
SNU6221	ප්‍රාථමික අධ්‍යාපනය	6	ඉංග්‍රීසි
SNU6822	ව්‍යාපෘතිය	6	ඉංග්‍රීසි
SNU6223	ළමා අයිතිවාසිකම්	6	ඉංග්‍රීසි
SNU6224	අධ්‍යාපනික කළමනාකරණය	6	ඉංග්‍රීසි
SNU6225	පුනරුත්ථාපනය සහ ප්‍රජා පාදක පුනරුත්ථාපනය	6	ඉංග්‍රීසි
SNU6826	ගුරු පුහුණුව	6	ඉංග්‍රීසි
SNE6546	ඇතුළත් වූ පන්ති කාමරය තුළ ළමුන් සඳහා විෂයමාලා සංවර්ධනය හා අනුවර්තනය	6	ඉංග්‍රීසි
SNP8530	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව	8	ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
SNP8531	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම	8	ඉංග්‍රීසි
SNP8532	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා අධ්‍යාපනික තාක්ෂණය	8	ඉංග්‍රීසි
SNP8333	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මිනුම් සහ ඇගයීම	8	ඉංග්‍රීසි
SNP8334	සුවිශේෂීතා සහ ඉගෙනුම් අවශ්‍යතා පිළිබඳ හැඳින්වීම	8	ඉංග්‍රීසි
SNP8335	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම	8	ඉංග්‍රීසි
SNP8336	අධ්‍යාපනය තුළ නැඟී එන ප්‍රවණතා	8	ඉංග්‍රීසි
SNP8237	පුනරුත්ථාපනය සහ ප්‍රජා පාදක පුනරුත්ථාපනය	8	ඉංග්‍රීසි
SNP8338	අධ්‍යාපනික මගපෙන්වීම සහ උපදේශනය	8	ඉංග්‍රීසි
SNE8839	ගුරු පුහුණුව	8	ඉංග්‍රීසි
SNPA601	විශේෂ අවශ්‍යතා පිළිබඳ මනෝවිද්‍යාත්මක පදනම	10	ඉංග්‍රීසි
SNPA602	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක හා දාර්ශනික පදනම්	10	ඉංග්‍රීසි
SNPA903	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ විෂයමාලා, උපදෙස් සහ ඇගයීම	10	ඉංග්‍රීසි
SNPA904	වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය කළමනාකරණය කිරීම	10	ඉංග්‍රීසි
SNPA605	විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා සංක්‍රමණය	10	ඉංග්‍රීසි
SNPA606	විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ උපකාරක සහ අනුවර්තන තාක්ෂණයන්	10	ඉංග්‍රීසි

8 වගුව : මාර්ගගත පාඨමාලා - අධ්‍යාපන පීඨය

4.2 ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.1 විශ්ලේෂණය



ඉංජිනේරු තාක්ෂණ පීඨය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන පීඨ 6 අතුරින් එක් පීඨයක් වේ. පීඨය පහත සඳහන් අධ්‍යනාංශය 6න් සමන්විත වේ. එනම් : කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු විද්‍යාව, සිවිල් ඉංජිනේරු, විදුලි සහ පරිගණක ඉංජිනේරු, ගණිත සහ ඉංජිනේරු විද්‍යාවේ දර්ශනය, යාන්ත්‍රික ඉංජිනේරු, පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය යන අධ්‍යනාංශ වේ.

2020 වර්ෂය තුළ පීඨයේ ප්‍රධාන නිලධාරීන්: පීඨයේ පරිපාලන හා අධ්‍යයන ප්‍රධානියා පීඨාධිපති වන අතර, වර්තමානයේ මහාචාර්ය.ඩී.ඒ.ආර් දොලගේ මහතා පීඨාධිපති ලෙස කටයුතු කරයි. අනෙකුත් ප්‍රධාන නිලධාරීන් වන්නේ ආචාර්ය.එච්.කේ.එල්.කේ ගුණසේකර (ප්‍රධානී, කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු විද්‍යාව), ආචාර්ය.පී.ඒ.කේ.කරුණානන්ද (ප්‍රධානී, සිවිල් ඉංජිනේරු), ආචාර්ය.ඩී.ඩී.එම් රණසිංහ (ප්‍රධානී, විදුලි හා පරිගණක ඉංජිනේරු), සී.පී.එස් පතිරණ (ප්‍රධානී, ගණිත හා ඉංජිනේරු විද්‍යාවේ දර්ශණය) (2020 සැප්තැම්බර් සිට මෙම අධ්‍යනාංශයේ ප්‍රධානී ලෙස ජී.නන්දසේන මහතා පත් කරන ලදි), ආචාර්ය.එම්.ඊ.ආර් පෙරේරා (ප්‍රධානී, පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය) සහ සහකාර ලේඛකාධිකාරී ආචාර්ය.එස්.එම් ජානක රන්ජන සේනානායක.

අධ්‍යයන වැඩසටහන්

2020 වර්ෂයේදී, පීඨය විසින් ගෞරව උපාධි පාඨමාලා 3ක් ඉදිරිපත් කරන ලදි. එනම් ඉංජිනේරු තාක්ෂණවේදී (ගෞරව) උපාධිය, කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) හා මෘදුකාංග ඉංජිනේරුවේදී (ගෞරව) උපාධිය වේ. මෙම සෑම වැඩසටහනකම විෂයමාලාව සංශෝධනය කර ප්‍රතිව්‍යූහගත කරන ලද්දේ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයන්ට (SLQF) අනුකූල වන පරිදි සහ අදාළ වෘත්තිය ආයතනවල අධ්‍යයන අවශ්‍යතා සපුරාලීම සඳහා වේ. පීඨය විසින් තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සහ ඇඟළුම් තාක්ෂණ උසස් සහතිකපත්‍ර පාඨමාලාව ද පිරිනමන ලදි.

මෙම වසර පීඨයට විශේෂ වසරක් වූ අතර විද්‍යාපති වැඩසටහන් සඳහා සාර්ථකව සිසුන් බඳවාගැනීමට හැකි විය. එනම් යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යනාංශය විසින් පිරිනමනු ලබන බලශක්ති කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව සහ සිවිල් ඉංජිනේරු අධ්‍යනාංශය විසින් පිරිනමනු ලබන ව්‍යූහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවයි.

සංශෝධිත විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස සියළුම අධ්‍යනාංශ, පාඨමාලා ද්‍රව්‍ය සංශෝධනය කිරීම කෙරෙහි විශාල උනන්දුවක් දැක්විය. තවද, මාර්ගගත පාඨමාලා පිරිනැමීමට කාර්ය මණ්ඩලය දැඩි උනන්දුවක් දැක්වූ අතර, 2019 වර්ෂයේ ප්‍රතිඵලයක් ලෙස මාර්ගගත පාඨමාලා සංඛ්‍යාව 125 දක්වා වැඩි කරමින් අතිරේක පාඨමාලා 58ක් මාර්ගගතව පිරිනමන ලදි.

ශිෂ්‍යයින්

2019/2020 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් තනි පුද්ගල වැඩසටහන් සඳහා ශිෂ්‍ය බඳවාගැනීම්, ශිෂ්‍ය ලියාපදිංචිය හා සම්පූර්ණ කිරීම් පහත වගුවෙන් දැක්වේ.

2019/2020 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් තනි පුද්ගල වැඩසටහන් සඳහා ශිෂ්‍ය බඳවාගැනීම්, මුළු ශිෂ්‍ය ලියාපදිංචිය හා සම්පූර්ණ කිරීම්.

අධ්‍යයන පාඨමාලාව	නව ශිෂ්‍ය සංඛ්‍යාව	ලියාපදිංචි ශිෂ්‍යයන්	මුළු සංඛ්‍යාව	සම්පූර්ණ කිරීම
ඇඟළුම් තාක්ෂණ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	53	-	53	-
තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව	17	-	17	-
තාක්ෂණවේදී උපාධිය	892	2689	3581	-
කර්මාන්ත අධ්‍යයනවේදී උපාධිය	361	777	1138	-
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	136	-	136	-
බලශක්ති කළමනාකරණපති උපාධිය	106	-	106	-
ඇඟළුම් නිෂ්පාදනය හා කළමනාකරණය පිළිබඳ තාක්ෂණපති උපාධිය	-	-	0	-
ව්‍යූහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	36	-	36	-
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලාව	6	1	7	-
මුළු සංඛ්‍යාව	**1607**	**3467**	**5074**	-

කොවිඩ් 19 වසංගතයේ පළමු රැල්ල හේතුවෙන් නව බඳවාගැනීම් සඳහා බාධා ඇතිවූ අතර නව බඳවාගැනීම්වල සැලකිය යුතු අඩුවක් ඇති විය. 2020 මැයි මස පැවැත්වීමට නියමිතව තිබූ අවසන් විභාග පසුව අදියර දෙකකින් (1 හා 2) පැවැත්වීමට සැලසුම් කරන ලදි. කෙසේ වෙතත්, කොවිඩ් 19 වසංගතයේ දෙවන රැල්ල හේතුවෙන් අවසන් විභාගයේ 2 වන අදියර පැවැත්වීම සඳහා බලපෑම් ඇති වූ අතර එම නිසා අවසන් විභාගයේ දෙවන අදියරෙහි 40%ක පමණ කොටසක් කල් දැමීමට සිදු විය. (පසුව 2021 ජනවාරි මස පවත්වන ලදි) එම නිසා, 2020 වර්ෂයේදී ශිෂ්‍යයින් නැවත බඳවාගැනීම ආරම්භ කිරීමට නොහැකි විය. තවද, මෙම තත්වය හේතුවෙන් 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ත්‍යාග ලබාදීම් සමබන්ධ කටයුතු 2020 වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි විය.

4.2.2 ශිෂ්‍ය බඳවාගැනීම් හා තනි පුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම

වැඩසටහන	අදියර	මාධ්‍යය	නව බඳවාගැනීම්	සම්පූර්ණ කළ
කාර්යාල යෙදවුම් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි		
ඉංජිනේරු ඇඳීම් සඳහා AutoCAD ඵලදායී භාවිතය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	98	96
ගතික වෙබ් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	-	-
ග්‍රැෆික් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	52	50
Application of Office පැකේජ හා පරිගණක දත්ත ගබඩා කළමනාකරණය සහතික පත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	-	-
පරිගණකගත ගිණුම්කරණ පැකේජ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	-	-
Revit ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	24	24
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	37	37
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලා	සහතික පත්‍ර	ඉංග්‍රීසි	6	-
ගතික ග්‍රැෆික් නිර්මාණ පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි	8	8
ඇඟළුම් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	සහතික පත්‍ර	ඉංග්‍රීසි, සිංහල, දෙමළ	53	--
තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමාව	ඩිප්ලෝමා	ඉංග්‍රීසි	17	-
ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි	892	-
කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධිය	උපාධි	ඉංග්‍රීසි	361	-
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	උපාධි	ඉංග්‍රීසි	136	-

ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	-	-
බලශක්ති කළමනාකරණපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	106	-
ඇඟළුම් නිෂ්පාදනය හා කළමනාකරණය පිළිබඳ තාක්ෂණපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	-	-
ව්‍යූහාත්මක ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	36	-
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	පශ්චාත් උපාධි	ඉංග්‍රීසි	-	-

9 වගුව : ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනිපුද්ගල වැඩසටහන් සම්පූර්ණ කිරීම - ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.3 ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය

වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන සහ අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ඉංජිනේරු විද්‍යාව පිළිබඳ කේවල පාඨමාලා	7	127	82
ඇඟළුම් තාක්ෂණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	53		
තොරතුරු පද්ධති හා තාක්ෂණ ඩිප්ලෝමාව	17		
ඉංජිනේරුවේදය පිළිබඳ තාක්ෂණවේදී (ගෞරව) උපාධිය	3581		
කර්මාන්ත අධ්‍යයනවේදී (ගෞරව) උපාධිය	1138		
මෘදුකාංග ඉංජිනේරුවේදී උපාධිය	136		
ඉදිකිරීම් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-		
ඇඟළුම් නිෂ්පාදනය හා කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-		
ඇඟළුම් නිෂ්පාදනය හා කළමනාකරණය පිළිබඳ තාක්ෂණපති උපාධිය	-		
බලශක්ති කළමනාකරණපති උපාධිය	106		
ව්‍යූහාත්මක ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය	36		
දර්ශනපති උපාධිය/ ආචාර්ය උපාධිය	10		

10 වගුව: ශිෂ්‍ය බඳවාගැනීම් සහ තනි පුද්ගල වැඩසටහන් තුළ කාර්ය මණ්ඩලය- ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.4 නව පාඨමාලා/ වැඩසටහන්

පාඨමාලාව/ වැඩසටහන	මාධ්‍යය	අදියර
ව්‍යූහාත්මක ඉංජිනේරුවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය	ඉංග්‍රීසි	9 සහ 10
TAX6180 පර්යේෂණ ක්‍රමවේදය සහ ව්‍යාපෘති හඳුනා ගැනීම- තාක්ෂණවේදී උපාධිය	ඉංග්‍රීසි	6
TAY7880 ඉංජිනේරු පර්යේෂණ ව්‍යාපෘතිය - තාක්ෂණවේදී උපාධිය	ඉංග්‍රීසි	7
TAY6882 පර්යේෂණ ව්‍යාපෘතිය - කර්මාන්ත අධ්‍යයනවේදී උපාධිය (ඇඟළුම් නිෂ්පාදනය)	ඉංග්‍රීසි	6
TAY6883 පර්යේෂණ ව්‍යාපෘතිය - කර්මාන්ත අධ්‍යයනවේදී උපාධිය (පේෂකර්ම නිෂ්පාදනය)	ඉංග්‍රීසි	6
TAX6265 උසස් රෙදි විවීම සකස් කිරීම සහ යන්ත්‍රෝපකරණ - තාක්ෂණවේදී උපාධිය / කර්මාන්ත අධ්‍යයනවේදී උපාධිය (පේෂකර්ම නිෂ්පාදනය)	ඉංග්‍රීසි	6
TAX7369 රෙදි විවීම පිළිබඳ ඉංජිනේරු ක්ෂේත්‍ර - තාක්ෂණවේදී උපාධිය	ඉංග්‍රීසි	7
TAY7381 පුළුල් සැලසුම් ව්‍යාපෘතිය - (කණ්ඩායම් ව්‍යාපෘතිය) පේෂකර්ම හා රෙදිපිළි ඉංජිනේරුවේදය) - තාක්ෂණවේදී උපාධිය	ඉංග්‍රීසි	7

11 වගුව : නව පාඨමාලා/ වැඩසටහන් - ඉංජිනේරු තාක්ෂණ පීඨය

4.2.5 මාර්ගගත පාඨමාලා

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
සිවිල් ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය			
CVX3340	ද්‍රාව විද්‍යාව හා ජල විද්‍යාව පිළිබඳ හැඳින්වීම	3	ඉංග්‍රීසි
CVX3441	ව්‍යුහාත්මක විශ්ලේෂණය හා සැලසුම් I	3	ඉංග්‍රීසි
CVX3442	ද්‍රව්‍යවල ශක්තිය	3	ඉංග්‍රීසි
CVX4240	ද්‍රාව ඉංජිනේරු විද්‍යාව I	4	ඉංග්‍රීසි
CVX4241	ඉංජිනේරු ජලවිද්‍යාව	4	ඉංග්‍රීසි
CVX4342	මැනීම I	4	ඉංග්‍රීසි
CVX4344	ඉංජිනේරු භූවිද්‍යාව	4	ඉංග්‍රීසි
CVX4348	ජල හා අපජල ඉංජිනේරු විද්‍යාව	4	ඉංග්‍රීසි
CVX4349	ගොඩනැගිලි ඉංජිනේරු විද්‍යාව	4	ඉංග්‍රීසි
CVX4350	ප්‍රමාණ සමීක්ෂණය	4	ඉංග්‍රීසි
CVX4446	ඉදිකිරීම ඉංජිනේරු විද්‍යාව හා ද්‍රව්‍ය	4	ඉංග්‍රීසි
CVX4545	ව්‍යුහාත්මක විශ්ලේෂණය හා සැලසුම් II	4	ඉංග්‍රීසි
CVY4185	කණ්ඩායම් ව්‍යාපෘතිය	4	ඉංග්‍රීසි
CVX5530	මැනීම II	5	ඉංග්‍රීසි
CVX5531	තරලවල යාන්ත්‍රවිද්‍යාව	5	ඉංග්‍රීසි
CVX5532	ඉංජිනේරු භූවිද්‍යාව	5	ඉංග්‍රීසි
CVX5533	ව්‍යුහාත්මක විශ්ලේෂණය	5	ඉංග්‍රීසි
CVY6A96	කණ්ඩායම් ව්‍යාපෘතිය	6	ඉංග්‍රීසි
CVX5530	මැනීම II	5	ඉංග්‍රීසි
CVX5531	තරලවල යාන්ත්‍රවිද්‍යාව	5	ඉංග්‍රීසි
CVX5532	ඉංජිනේරු භූවිද්‍යාව	5	ඉංග්‍රීසි
CVX5533	ව්‍යුහාත්මක විශ්ලේෂණය	5	ඉංග්‍රීසි
විදුලි හා පරිගණක ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය			
EEX3266	තොරතුරු පද්ධති හා දත්ත කළමනාකරණය	3	ඉංග්‍රීසි
EEX3331	විදුලි මිනුම් සහ උපකරණ සැකසීම	3	ඉංග්‍රීසි
EEX3336	සන්නිවේදනය සහ පරිගණක තාක්ෂණය	3	ඉංග්‍රීසි
EEX3351/EEX3350 (පැරණි)	ඉලෙක්ට්‍රොනික විද්‍යාව I	3	ඉංග්‍රීසි
EEX3410	විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හැඳින්වීම	3	ඉංග්‍රීසි
EEX3417/EEX3517 (පැරණි)	ඉංජිනේරුවන් සඳහා මෘදුකාංග සංවර්ධනය	3	ඉංග්‍රීසි
EEX4330	ෂන්නිවේදනය	4	ඉංග්‍රීසි
EEX4331	පරිපථ සිද්ධාන්ත හා සැලසුම්	4	ඉංග්‍රීසි
EEX4332	විදුලි බලශක්ති	4	ඉංග්‍රීසි
EEX4347	මෘදුකාංග ඉංජිනේරු විද්‍යා සංකල්ප	4	ඉංග්‍රීසි
EEX4351	ඉලෙක්ට්‍රොනික විද්‍යාව II	4	ඉංග්‍රීසි
EEX4366	දත්ත ආකෘති නිර්මාණය හා දත්ත සමුදා පද්ධති	4	ඉංග්‍රීසි
EEX4434	විදුලි ස්ථාපනයන්	4	ඉංග්‍රීසි
EEX4435	දත්ත ව්‍යූහයන් හා ඇල්ගොරිතම	4	ඉංග්‍රීසි
EEX4436	ක්ෂුද්‍ර සකසනය සහ අතුරුමුහුණත්	4	ඉංග්‍රීසි
EEX4448	විදුලි යන්ත්‍ර	4	ඉංග්‍රීසි
EEX4530	විද්‍යුත් පර්පථවල දෝෂ හඳුනාගැනීම	4	ඉංග්‍රීසි
EEX4542	බලශක්ති පද්ධති I	4	ඉංග්‍රීසි
EEX5531	ජාල සිද්ධාන්ත	5	ඉංග්‍රීසි
EEX5533	සන්නිවේදන සිද්ධාන්ත හා පද්ධති	5	ඉංග්‍රීසි
EEX5534	දත්ත සන්නිවේදනය	5	ඉංග්‍රීසි
EEX5535	මෙහෙයුම් පද්ධති	5	ඉංග්‍රීසි

පාඨමාලාව	නම	අදියර	මාධ්‍යය
EEX5536	පරිගණක නිර්මාණ ශිල්පය	5	ඉංග්‍රීසි
EEX5538	අධි වෝල්ටීයතා ඉංජිනේරු විද්‍යාව හා විදුලි යන්ත්‍ර	5	ඉංග්‍රීසි
EEX5543	භෞතික හා ඔප්ටො ඉලෙක්ට්‍රොනික විද්‍යාව	5	ඉංග්‍රීසි
EEX5545	දත්ත සමුදා කළමනාකරණ පද්ධති	5	ඉංග්‍රීසි
ADU5320	MATLAB මෘදුකාංගය හැඳින්වීම	5	ඉංග්‍රීසි
භෞතික විද්‍යා අධ්‍යනාංශය			
FNU3201	සන්නිවේදන කුසලතා	3	ඉංග්‍රීසි
PHU3300	සාමාන්‍ය සහ තාප භෞතික විද්‍යාව	3	ඉංග්‍රීසි
PHU3301	මූලික විද්‍යුත්චුම්භකත්වය	3	ඉංග්‍රීසි
PHU3202	භෞතික විද්‍යාවේ තරංග	3	ඉංග්‍රීසි
PHU4302	දෘෂ්ටි විද්‍යාව	4	ඉංග්‍රීසි
PHU4303	භෞතික විද්‍යාව සඳහා ගණිතමය ක්‍රම	4	ඉංග්‍රීසි
PHU5300	න්‍යෂ්ටික සහ අංශු භෞතික විද්‍යාව	5	ඉංග්‍රීසි
PHU5301	ප්‍රායෝගික භෞතික විද්‍යාව	5	ඉංග්‍රීසි
PHU5302	වායුගෝලීය භෞතික විද්‍යාව	5	ඉංග්‍රීසි
PHU5303	දත්ත ලබා ගැනීම හා සංඥා සැකසීම	5	ඉංග්‍රීසි
PHU5305	භූ විද්‍යාවේ අත්‍යාවශ්‍ය කරුණු	5	ඉංග්‍රීසි
PHU5306	ව්‍යවහාරික භූ විද්‍යාව	5	ඉංග්‍රීසි
PHU5308	භූ භෞතික විද්‍යාවේ මූලධර්ම	5	ඉංග්‍රීසි
PHU5311	තාරකා විද්‍යාව	5	ඉංග්‍රීසි
PHU5318	ජීව විද්‍යා සිසුන් සඳහා ඉලෙක්ට්‍රොනික විද්‍යාව	5	ඉංග්‍රීසි
සත්ව විද්‍යා අධ්‍යනාංශය			
ZYU3500	සත්ත්ව ජීවය සහ විවිධත්වය	3	ඉංග්‍රීසි
ZYU3301	ජෛව භූගෝල විද්‍යාව	3	ඉංග්‍රීසි
ZYU4300	සත්ත්ව ආකෘතිය සහ ක්‍රියාකාරීත්වය	4	ඉංග්‍රීසි
ZYU4301	පරිසර විද්‍යාව	4	ඉංග්‍රීසි
ZYU4302	සත්ව සංවර්ධනය	4	ඉංග්‍රීසි
ZYU5300	ජලජ ජීව විද්‍යාව	5	ඉංග්‍රීසි
ZYU5301	මත්ස්‍ය ජීව විද්‍යාව සහ ධීවර කළමනාකරණය	5	ඉංග්‍රීසි
ZYU5302	ජෛව විවිධත්වය සංරක්ෂණය හා කළමනාකරණය	5	ඉංග්‍රීසි
ZYU5304	පරපෝෂිත විද්‍යාව	5	ඉංග්‍රීසි
ZYU5305	මානව ජීව විද්‍යාව	5	ඉංග්‍රීසි
ZYU5306	කීට විද්‍යාව	5	ඉංග්‍රීසි
ZYU5307	ක්ෂීරපායී ජීව විද්‍යාව	5	ඉංග්‍රීසි
ZYU5309	පුරාණ ජීව විද්‍යාව (Paleobiology)	5	ඉංග්‍රීසි
ZYU5313	පර්යේෂණ ක්‍රමවේදය	5	ඉංග්‍රීසි
ZYU5312	සත්ත්ව විද්‍යා රචනා	5	ඉංග්‍රීසි
ZYC2304	ව්‍යාපෘති අධ්‍යයනය	2	ඉංග්‍රීසි
ZYC2306	වනජීවී කළමනාකරණ සිද්ධි අධ්‍යයනය	4	ඉංග්‍රීසි
ZYC2601	වනජීවී ජීවවිද්‍යාව	4	ඉංග්‍රීසි
ZYC2602	වනජීවී පරිසර විද්‍යාව	4	ඉංග්‍රීසි
ZYC2603	වනජීවී සංරක්ෂණය සහ කළමනාකරණය	4	ඉංග්‍රීසි
ZYC2605	වනජීවී අධ්‍යයන විධික්‍රම	4	ඉංග්‍රීසි
ZYP8603	ප්‍රතිශක්ති විද්‍යාව හා අණුක ජීව විද්‍යාව පිළිබඳ හැඳින්වීම	8	ඉංග්‍රීසි
ZYP9304	පරපෝෂිත අන්තර්ක්‍රියා සමූහ	9	ඉංග්‍රීසි
ZYP9605	වසංගත විද්‍යාව හා දෛශික මගින් බෝවන රෝග පාලනය කිරීම	9	ඉංග්‍රීසි
ZYEA314	පර්යේෂණ ක්‍රමවේදය සහ සන්නිවේදන කුසලතා	9	ඉංග්‍රීසි
ZYPA410	දෛශික සහ පරපෝෂිතයින්ගේ ආරක්ෂණ යාන්ත්‍රණය	9	ඉංග්‍රීසි

5 කොටස - පර්යේෂණ සහ ප්‍රකාශන

5.0. පර්යේෂණ හා ප්‍රකාශන

5.1 පර්යේෂණ ව්‍යාපෘති/ පත්‍රිකා

පීඨය/ මධ්‍යස්ථානය	අධ්‍යනාංශය	පර්යේෂණ ව්‍යාපෘති	ප්‍රකාශිත පත්‍රිකා	ඉදිරිපත් කළ පත්‍රිකා
අධ්‍යාපන	විශේෂ අවශ්‍යතා අධ්‍යාපන		01	01
	පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන		07	05
	ද්විතීය සහ තෘතීය අධ්‍යාපන	01	07	05
	අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ	-	-	-
ඉංජිනේරු තාක්ෂණ	කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු		9	6
	සිවිල් ඉංජිනේරු	03	34	25
	විදුලි සහ පරිගණක ඉංජිනේරු	11	-	-
	ඉංජිනේරු විද්‍යා ගණිතය හා දර්ශනය	-	01	-
	යාන්ත්‍රික ඉංජිනේරු	1	12	12
	පේෂකර්ම සහ ඇඟළුම් තාක්ෂණය	33	06	02
සෞඛ්‍ය විද්‍යා	මූලික විද්‍යා	2	4	3
	වෛද්‍ය රසායනාගාර විද්‍යා	1	4	5
	හෙද විද්‍යා	4	4	26
	ඖෂධ විද්‍යා	1	3	06
	මනෝවිද්‍යා හා උපදේශන	1	4	06
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	භාෂා අධ්‍යයන		01	13
	නීති අධ්‍යයන	02	03	14
	සමාජ අධ්‍යයන	-	01	12
	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම්	-	-	-
කළමනාකරණ අධ්‍යයන	මානව සම්පත් කළමනාකරණය	-	3	1
	අලෙවිකරණ කළමනාකරණ	-	5	12
	සංවිධාන අධ්‍යයන	-	4	3
	ගිණුම්කරණ හා මූල්‍ය	-	7	12
ස්වභාවික විද්‍යා	උද්භිද විද්‍යා	09	18	08
	රසායන විද්‍යා	-	18	32
	පරිගණක විද්‍යා	02	-	-
	ගණිතය	-	02	02
	භෞතික විද්‍යා	04	22	13
	සත්ව විද්‍යා	05	-	-
අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය		-	08	03
ප්‍රාදේශීය අධ්‍යාපන සේවා		-	-	-
පුස්තකාලය		-	05	-
පාරිසරික අධ්‍යයනය හා තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය		01	03	01

29 වගුව : පර්යේෂණ ව්‍යාපෘති / පත්‍රිකා

**ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි මාධ්‍යයෙන් සඳහන් කොටසෙහි ඇමුණුම්වල දක්වා ඇත.

5.2 ග්‍රන්ථ / පේටන්ට්

පීඨය/ මධ්‍යස්ථානය	පොත්වල පරිච්ඡේද	සම්පූර්ණ පොත්	ප්‍රකාශිත පේටන්ට්
අධ්‍යාපන	04	-	-
ඉංජිනේරු තාක්ෂණ	7	-	-
සෞඛ්‍ය විද්‍යා	-	-	-
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	04	01	-
කළමනාකරණ අධ්‍යයන	-	01	-
ස්වභාවික විද්‍යා	06	-	01

30 වගුව: ග්‍රන්ථ / පේටන්ට්

5.3 සම්මාන

පීඨය/ මධ්‍යස්ථානය	විශ්වවිද්‍යාල සම්මාන	ජාතික සම්මාන	ජාත්‍යන්තර
අධ්‍යාපන	-	-	-
ඉංජිනේරු තාක්ෂණ	1	01	01
සෞඛ්‍ය විද්‍යා	-	01	01
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා	-	01	-
කළමනාකරණ අධ්‍යයන	-	-	-
ස්වභාවික විද්‍යා	02	-	01p
අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය	-	-	-
ප්‍රාදේශීය අධ්‍යාපන සේවා	-	-	-

31 වගුව : සම්මාන

• 6 කොටස – මධ්‍යස්ථාන හා ඒකක

6.0. මධ්‍යස්ථාන හා ඒකක

6.1 ප්‍රාදේශීය අධ්‍යාපන සේවා

ප්‍රාදේශීය අධ්‍යාපන සේවා යනු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ඒකකයක් ලෙස සැලකේ.

අනෙකුත් බොහෝ රාජ්‍ය විශ්වවිද්‍යාල මධ්‍යගතව ක්‍රියාත්මක වන අතර විවෘත විශ්වවිද්‍යාලය පුරෝගාමී විවෘත දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස ක්‍රියාත්මක වන අතර මධ්‍යම මණ්ඩපයේ සිට අධීක්ෂණය කරනු ලබන මෙහෙයුම් මධ්‍යස්ථාන ජාලයක් ලෙස ක්‍රියා කරයි. මෙම මධ්‍යස්ථාන ජාලය ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම ව්‍යාප්තව ඇත. සෑම පළාතක්ම ආවරණය වන පරිදි ප්‍රාදේශීය මධ්‍යස්ථාන නවයක් පිහිටුවා ඇත.



රූපසටහන 1: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය සහ අධ්‍යයන මධ්‍යස්ථාන

මීට අමතරව අධ්‍යයන මධ්‍යස්ථාන 19ක් අනෙකුත් දිස්ත්‍රික්කවල පිහිටා ඇත. ප්‍රාදේශීය අධ්‍යාපන සේවයේ ප්‍රධාන කාර්යාලය මධ්‍යම මණ්ඩපයේ පිහිටා ඇති අතර එමඟින් පීඨ 6ක් සහ අනෙකුත් සියලුම පාර්ශවකරුවන් සමඟ අධ්‍යයන පරිපාලන කටයුතු සිදු කරනු ලබයි. (රූපසටහන 1 බලන්න)

ප්‍රාදේශීය අධ්‍යාපන සේවාවෙහි කාර්ය භාරය

අධ්‍යයන වැඩසටහන් පිරිනැමීම සඳහා ප්‍රාදේශීය අධ්‍යාපන සේවා අංශය විසින් සහාය උපකාරක සේවා ගණනාවක් සපයනු ලබයි. තොරතුරු සැපයීම, අයදුම්පත් එක් රැස් කර ඉදිරිපත් කිරීම, සිසුන්ගේ ලියාපදිංචිකිරීම් හා නැවත ලියාපදිංචි කිරීම් කටයුතු සිදු කිරීම, සිසුන් සඳහා උපදේශන කටයුතු, පාඨමාලා ද්‍රව්‍ය බෙදා හැරීම, දින පන්ති/ ප්‍රායෝගික පන්ති සම්බන්ධීකරණය කිරීම හා අඛණ්ඩ ඇගයීම් මෙන්ම අවසන් විභාග පැවැත්වීම එම සේවාවන්වලින් කිහිපයක් වේ. මෙම දෛනික කාර්යයන්ට අමතරව, දිවයිනේ සියලුම ප්‍රදේශවල ඇති ප්‍රාදේශීය උසස් අධ්‍යාපන අවශ්‍යතා සඳහා මධ්‍යම මණ්ඩපය තුළ ප්‍රාදේශීය නියෝජනයේ ප්‍රධාන කොටසක් වශයෙන් ක්‍රියා කරයි.

2020 වර්ෂයේ වැදගත් සිදුවීම්

කොවිඩ් 19 ආසාදිත රෝගීන් සංඛ්‍යාව ඉහළ යෑමත් සමඟ දිවයින පුරා පනවන ලද ඇඳිරි නීතිය හේතුවෙන් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කෙරෙහි බොහෝ බලපෑම් ඇති විය. එම වර්ෂය තුළ සිදු වූ කැපී පෙනෙන සිදුවීම්:

- ප්‍රාදේශීය අධ්‍යාපන සේවා නව වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස ආචාර්ය. ශාන්ත අබේසිංහ මහතා 2020 ජනවාරි මස පත් විය.
- මාතලේ අධ්‍යයන මධ්‍යස්ථානය 2021 ජනවාරි 09 වන දින විවෘත කරන ලදි. මාතලේ අධ්‍යයන මධ්‍යස්ථානය පිහිටුවීමත් සමඟ සෑම දිස්ත්‍රික්කයකම අවම වශයෙන් එක් අධ්‍යයන මධ්‍යස්ථානයක් පිහිටුවීම හරහා විශ්වවිද්‍යාලය සිය ප්‍රාදේශීය ජාලය ශක්තිමත් කරයි.
- යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය සඳහා පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම ආරම්භ කර ඇති අතර සියලුම ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය මැද භාගයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.
- රජය මඟින් ලබා දෙන ලද ගොඩනැගිලි සමඟ අත්පත් කරගත් නව ඉඩම තුළ කිලිනොච්චි අධ්‍යයන මධ්‍යස්ථානය පුළුල් කිරීම දැනටමත් ආරම්භ කර ඇත.
- 2017 වර්ෂයේදී සමාලෝචනය කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය අධ්‍යාපන සේවා සඳහා සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.
- සේවක තනතුරු අනුමත කිරීමත් සමඟ ප්‍රාදේශීය අධ්‍යාපන සේවා තුළ සහකාර ලේඛකධිකාරී තනතුර නැවත පිහිටුවන ලදි.
- 2020 දෙසැම්බර් සිට පොළොන්නරුව, හැටන් සහ මොණරාගල අධ්‍යයන මධ්‍යස්ථාන සඳහා නව සහකාර අධ්‍යක්ෂවරුන් පත් කරන ලදි.
- නව පරිගණක 500ක් සමඟින් පරිගණක විද්‍යාගාරවල ධාරිතාව ඉහළ නංවන ලද අතර දැනට සියලුම අධ්‍යයන මධ්‍යස්ථානවල අන්තර්ජාල පහසුකම් සහිතව පරිගණක 750ක් තිබේ.
- සියලුම ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන සඳහා WIFI පහසුකම් ලබා දීමට කටයුතු කරන ලදි.
- වර්තමාන කොවිඩ් 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන, කුරියර් සේවා හරහා සිසුන් වෙත මුද්‍රිත පාඨමාලා ද්‍රව්‍ය බෙදා හරිනු ලැබේ.
- කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු සියළුම පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය වෙත රට මුළුමනින්ම වසා දැමීමට සිදු වූ කාල සීමාව තුළ විවෘත විශ්වවිද්‍යාලයීය ගුරුවරුන්ගේ සංගමය විසින් ලබා දෙන ලද මූල්‍ය ආධාර සමඟ රු.5000 ක මුදලක් ලබා දෙන ලදි.

6.2 පුස්තකාලය



කොවිඩ් 19 වසංගත තත්ත්වයේ ව්‍යාප්තිය හේතුවෙන් 2020 වර්ෂය සමස්ත ලෝකයට මෙන්ම විවෘත විශ්වවිද්‍යාලයීය පුස්තකාලයට ද ඉතා දුෂ්කර වර්ෂයක් විය. 2020 මාර්තු මස සිට පුස්තකාලය සිසුන් සඳහා විවෘත කිරීම සිදු නොවිණ. පුස්තකාල කාර්ය මණ්ඩලය හා පරිශීලකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් බොහෝ සීමාවන් පැනවීමට සිදු විය. කෙසේ වෙතත් සීමා සහිත පරිශීලකයින් සංඛ්‍යාවක් සඳහා නියමිත කාල සීමාවකට යටත්ව පුස්තකාලයට ඇතුළු වීමට අවසර ලබා දෙන ලද අතර තමන්ට අවශ්‍ය දෑ ලබා ගැනීමෙන් පසුව පුස්තකාලයෙන් පිටවීමට ඔවුන්ට අවසර ලබා දෙන ලදි. පුද්ගලයින් අතර ඇති වන සම්බන්ධතාවය අවම කිරීම සඳහා Self- check in Kiosk යන්ත්‍රයක් කවුන්ටරය අසල ස්ථාපිත කර ඇති අතර කොවිඩ් 19 වෛරසය සම්ප්‍රේෂණය වීම අවම කිරීමේ පියවරක් ලෙස පුස්තකාල පරිශීලකයින්ට පුස්තකාල කාර්ය මණ්ඩලය වෙත තමන් පොත් පත් ලබා දීමකින් තොරව තමන් විසින්ම ආපසු ලබා දීම සිදු කළ හැකිය. එවිට, ආපසු දෙන ලද පොත් පත් නැවත පොත් රාක්කවල තැබීමට පෙර වෙනම රාක්කයක දින 03ක් තබන ලදි.

කොවිඩ් අවදානම් කාල සීමාව තුළ තම නිවෙස්වල සිට e- resources වෙත ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දෙමින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ප්‍රජාවට සහාය දැක්වීමේ පියවරක් ලෙස පුස්තකාල වෙබ් අඩවිය නැවත නිර්මාණය කිරීමට පුස්තකාලයට හැකි විය.



පොදු ප්‍රවාහන පහසුකම් සීමා සහිත වීම හා පළාත් අතර සංචරණය තහනම් වීම හේතුවෙන් පුස්තකාල කාර්ය මණ්ඩලය චක්‍රීය කාල සටහනකට (roster) අනුව සතියට දින 3ක් පමණක් රාජකාරී සඳහා කැඳවන ලදි. පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා නිවසේ සිට සිදු කළ හැකි රාජකාරි පවරන ලද අතර ඔවුන් සෑම සිකුරාදා දිනකම ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත තම වැටුප් ගෙවීම් හා සම්බන්ධ රාජකාරී පදනම් කරගනිමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. ඇතැම් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ආසන්නතම ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත වාර්තා කිරීමට අවසර ලබා දෙන ලදි.

කෙසේ වෙතත්, අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරුවල ඇති සීමාසහිතභාවය හේතුවෙන් වසර ගණනාවක් පුරා එක් රැස් වී තිබූ අතපසු වූ ලැයිස්තුගත කිරීම් (cataloguing) අවසන් කිරීමට පුස්තකාලයට හැකි විය.

එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් අතර එක් අවුරුදු කාල සීමාවක් සඳහා සබරගමුව විශ්වවිද්‍යාලයේ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයෙක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පත් කරන ලදි. සහකාර ලේඛකාධිකාරී ද 2020 වර්ෂයේදී අධ්‍යයන නිවාඩු ලබා ගන්නා ලදි.





6.3 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය



ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් අධ්‍යයන සහ පරිපාලන වැඩකටයුතු සඳහා සහාය ලබා දීම අරමුණු කරගෙන පිහිටුවන ලදි. විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සේවකයින් ලෙස රාජකාරී කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය වන කුසලතා සහ නිපුණත්වය වැඩි දියුණු කිරීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පහසුකම් සපයනු ලබයි.



අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන ඇතුළු සියලුම කාණ්ඩවල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම් කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබයි. මෙහිදී පවත්වන වැඩසටහන් හා වැඩමුළු මගින් රාජකාරී හා සම්බන්ධ හැකියාවන් මෙන්ම පුද්ගලික සංවර්ධනය ද ආවරණය කිරීම සිදු වේ. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධානතම වැඩසටහන වන්නේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පරිවාස කථිකාචාර්යවරුන් සඳහා පවත්වනු ලබන උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් වැඩසටහනක් වන උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික

පත්‍ර පාඨමාලාව සියලුම පරිවාස කථිකාචාර්යවරුන් විසින් තම පත්වීම ස්ථීර කිරීම සඳහා සාර්ථකව සම්පූර්ණ කළ යුතු වේ. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන් 4ක් සම්පූර්ණ කර තිබේ. අලුතින් බඳවාගත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ ප්‍රේරණ වැඩසටහන ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාල මගින් ද පිළිගත් තවත් ප්‍රධාන වැඩසටහනක් වේ.

සේවක භවතුන්ගේ භාෂා කුසලතාව වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වාර්ෂිකව බොහෝ වැඩසටහන් පවත්වනු ලබයි. Toastmaster Speech Craft වැඩසටහන, අධ්‍යයන රචනා වැඩසටහන්, දෙමළ සහ ඉංග්‍රීසි සේවක භවතුන් හා විශ්වවිද්‍යාලයීය සියලුම කාර්ය මණ්ඩලය සඳහා සන්නිවේදන වැඩසටහන් එවැනි වැඩසටහන් කිහිපයක් වේ. මානසික සුබසිද්ධිය සඳහා අභිප්‍රේරණ වැඩසටහන් සහ උපදේශන වැඩමුළු ද වාර්ෂිකව සිදු කෙරේ. මෙම සියළුම වැඩමුළු සහ වැඩසටහන් සමගින් පාර්ශවකරුවන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය බලාපොරොත්තු වේ.

2020 වර්ෂය තුළ පැන නැගුණු කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් බාධාවන් ඇති වුවද, සියලුම කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා වැඩමුළු හා වැඩසටහන් 14ක් පැවැත්වීමට කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයට හැකි විය.මෙම ක්‍රියාකාරකම් සඳහා සූම් තාක්ෂණය ඔස්සේ මෙන්ම මාර්ගගත හා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් එක් ස්ථානයට රැස්ව පවත්වන ලද සැසි සඳහා සේවකයින් විශාල ප්‍රමාණයක් සහභාගි විය.

6.4 වෘත්තීය උපදේශන ඒකකය



වෘත්තීය උපදේශන ඒකකයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ විවෘත විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින්ට අනාගත ශ්‍රම බලකාය තුළ සමාජීය වශයෙන් ප්‍රතිචාර දක්වන කාර්යක්ෂම සාමාජිකයෙකු වීමට උපකාර කිරීමයි.

මෙම ඒකකය නාවල පිහිටි කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථාන නව ගොඩනැගිල්ලේ පිහිටා ඇත. රැකියා ලෝකයේ අවශ්‍යතා සමඟ කටයුතු කිරීම වෙනුවෙන් අවශ්‍ය තම කුසලතා හා හැකියාවන් වැඩි දියුණු කිරීමට විද්‍යාර්ථීන්ට උපකාර කිරීම සඳහා වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය විසින් පීඨ හා එක්ව සහයෝගිතාවයෙන් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සිසුන් අතර නිපුණතා පරතරය (Skill Gap) පියවීම සඳහා මෙම ඒකකය තවදුරටත් වෘත්තීය නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. start@ousl වැඩසටහන ද වෘත්තීය උපදේශන ඒකකය මගින් සම්බන්ධීකරණය කරනු ලැබේ.

පාසල් හා වෙනත් සංවිධාන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් හා කුසලතා ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන්, පවතින ඉල්ලුම මත වෘත්තීය පුහුණු ඒකකය හරහා පවත්වනු ලැබේ. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ ක්‍රියාකාරකම් අවම කිරීමට සිදු වුවද ජෝන් කීල්ස් පදනම වැනි වෙනත් සංවිධාන මඟින් පවත්වන ලද ජීව දත්ත ලිවීම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන ආකාරය මෘදු කුසලතා සංවර්ධනය පිළිබඳ වෙබ් සම්මන්ත්‍රණ වැනි සජීවී සූම් සැසි සඳහා සම්බන්ධ විය.

6.5 මුද්‍රණාලය සහ මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

විශ්වවිද්‍යාල මුද්‍රණාලය

දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය හරහා දැනුම ලබා දීම හා ව්‍යාප්ත කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පිහිටුවා ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පාඨමාලා ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙන්ම අධ්‍යයන පොත්පත් ද අවශ්‍ය වූ අතර පාඨමාලා ද්‍රව්‍ය මුද්‍රණය කිරීම හා සිසුන් වෙත ලබා දීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ අනුග්‍රහය සහිතව 1982 වර්ෂයේදී මුද්‍රණාලය පිහිටුවන ලදි. අවම හා මූලික උපකරණ සහිතව ආරම්භ කරන ලද මුද්‍රණාලය මේ වන විට අංගසම්පූර්ණ නවීන යන්ත්‍රෝපකරණවලින් සමන්විත වේ. වර්තමානය වන විට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රජාව වෙනුවෙන් දිවා රාත්‍රී රාජකාරී කටයුතුවල නිරත වන කාර්ය මණ්ඩල සාමාජිකයින් 50 දෙනෙක් විශ්වවිද්‍යාලයිය මුද්‍රණාලයට අනුයුක්තව සේවය කරයි.

විශ්වවිද්‍යාලයීය පීඨ 6 මඟින් පවත්වනු ලබන නොයෙක් පාඨමාලා හදාරන 40,000කට වැඩි සිසුන් සංඛ්‍යාවක් විවෘත විශ්වවිද්‍යාලය තුළ අධ්‍යාපනය හදාරනු ලබයි. පාඨමාලා සඳහා පාඨමාලා ද්‍රව්‍ය ප්‍රකාශයට පත් කිරීම සහ අත් පත්‍රිකා, වාර්ෂික වාර්තා, අධ්‍යයන සඟරා ආදිය මුද්‍රණය කිරීමට පහසුකම් සැලසීම මුද්‍රණාලයේ මූලික කාර්ය භාරය වේ. මීට අමතරව, පරිපාලන අංශ සඳහා අවශ්‍ය නොයෙක් රාජකාරී ලේඛන මුද්‍රණය කිරීම මුද්‍රණාලයට පවරා ඇත.

තවද, උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථානයේ අනුමැතිය සහිතව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වෙනත් විශ්වවිද්‍යාල සහ වෙනත් රාජ්‍ය ආයතන විසින් ඉල්ලුම් කර ඇති ද්‍රව්‍ය මුද්‍රණය කිරීම මුද්‍රණාලය විසින් බාරගෙන ඇත.

මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලද පාඨමාලා ද්‍රව්‍ය සහ වෙනත් ද්‍රව්‍ය - 2020

	පාඨමාලා ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව	පාඨමාලා අත්පොත් පිටපත් සංඛ්‍යාව	වෙනත් ද්‍රව්‍ය පිටපත් සංඛ්‍යාව
ජනවාරි	74,209	1,100	9,802
පෙබරවාරි	48,125	0	15,192
මාර්තු	10,885	-	-
අප්‍රේල්	කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය වසා තබන ලදි.		
මැයි			
ජූනි	16,705	-	275
ජූලි	12,985	400	555
අගෝස්තු	14,322	4,800	42,102
සැප්තැම්බර්	36,476	-	50
ඔක්තෝබර්	38,022	-	3,600
නොවැම්බර්	570	-	48,020
දෙසැම්බර්	2,260	-	5,525
එකතුව	**254,559**	**6,300**	**125,121**

<u>උපදේශන සහ බාහිර සම්පත් මධ්‍යස්ථාන කාර්ය භාරය</u>

විස්තරය	පිටපත්
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2018 වාර්ෂික වාර්තාව - කැළණිය විශ්වවිද්‍යාලය	60
ශාස්ත්‍රවේදී උපාධි සහතිකය	100
වාර්ෂික වාර්තාව – CUCTA	75
දම්සරණිය සඟරාව	500
වාර්ෂික වාර්තාව – විශ්වවිද්‍යාල වෘත්තීය සමිතිය	175
උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථාන හැඳුනුම්පත්	1000
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා උත්සවය සඳහා සහතිකපත්‍ර	275
උසස් අධ්‍යාපනය පිළිබඳ CORE සමූහයේ වාර්තාව	300
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති උපාධියේ ප්‍රකාශන ග්‍රන්ථය	100

මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය

මධ්‍යම පොත් බෙදාහැරීමේ ඒකකය මඟින් නියමිත කාලයේදී ප්‍රදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල ලියාපදිංචිකිරීම් පැවැත්වීමේදී පාඨමාලා ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදා හැරීම මෙන්ම පාඨමාලා ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කරයි. ලියාපදිංචි වූ සිසුන් වෙනුවෙන් පාඨමාලා ද්‍රව්‍ය ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා සියලුම පීඨ වෙත සේවා සපයන්නා ලෙස මෙම ඒකකය කටයුතු කරයි. මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය රාක්ක 576කින් සමන්විත වන අතර එක් රාක්කයක් 1.5 m^3 වේ. සෑම රාක්කයක් තුළම පාඨ ග්‍රන්ථ විධිමත්ව ගබඩා කළ හැකිය.

අරමුණු :

- මුද්‍රණ කටයුතු සම්පූර්ණ වූ වහාම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයෙන් සියලුම පාඨමාලා ග්‍රන්ථ එක් රැස් කර ගැනීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන 9 හා අධ්‍යයන මධ්‍යස්ථාන 18 වෙත පාඨමාලා ග්‍රන්ථ බෙදා හැරීම.
- කාර්ය භාරය :මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය පහත කාර්යයන් සිදු කරනු ලැබේ.
    - සියලුම මුද්‍රිත පාඨමාලා ග්‍රන්ථ ගබඩා කිරීම.
    - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විවෘත විවෘත විශ්වවිද්‍යාලයීය ලොරි රථ සහ කොන්ත්‍රාත් පදනම මත කුරියර් සේවා හරහා දිවයින පුරා පිහිටා ඇති ප්‍රදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන වෙත පාඨමාලා ග්‍රන්ථ බෙදා හැරීම.
    - ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවලින් ආපසු එවන ඕනෑම පාඨමාලා ග්‍රන්ථයක් බාර ගැනීම.
    - නව පාඨමාලා ග්‍රන්ථවල සෑම පිටපතක්ම ප්‍රධාන පුස්තකාලය වෙත සැපයීම.

පීඨ/ යටිතල පහසුකම්/ සම්පත්

- හොඳ පරිසර ස්වභාවයක් සහිතව පාඨමාලා ග්‍රන්ථ ගබඩා කිරීම සඳහා **45x20 m^2** ක ඉඩ ප්‍රමාණයෙන් යුත් ගොඩනැගිල්ලක්

- ඉහත සඳහන් අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකයට අනුයුක්තව 12 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සේවය කරයි.

- මධ්‍යම පොත් බෙදා හැරීමේ ඒකකය තුළ රාක්ක 576ක් ඇති අතර රාක්කයක ප්‍රමාණය 1.5 ම්3 ක් වේ.

- මෙම ඒකකය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය වෙත සම්බන්ධ කර ඇත.

- ස්ථීර කාර්ය මණ්ඩල සාමාජිකයින් 6 දෙනෙකුගෙන් සමන්විත වේ. (කළමනාකරණ සහකාර - 2, වැඩ සහායක - 03, සනීපාරක්ෂක කම්කරු -01, ගබඩා භාරකරු -01, එක් වැඩ සහායක තනතුරක පුරප්පාඩුවක් පුරවා නොමැත)

- කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයින් 06 දෙනෙකුගෙන් සමන්විත වේ. (ව්‍යාපෘති සහකාර 03දෙනෙක් හා මෙහෙයුම් සහකාර 03දෙනෙක්)

6.6 ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ 2018 දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය පිහිටුවන ලදි. මෙය 2015 මාර්තු මස විශ්වවිද්‍යාලයට පවරන ලදි. අපගේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ දුරස්ථ අධ්‍යාපනයේ සහ දිවයිනෙන් පිටත ප්‍රමුඛපෙලේ පහසුකම් සපයන්නා බවට පත් වීමයි.

එම දැක්ම සමඟ, මාර්ගගත අධ්‍යාපනයට සහය දැක්වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලීය ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවය පහත සඳහන් පහසුකම් වලින් සමන්විත වේ.

- මාර්ගගත අන්තර්ගත සංවර්ධනය සහ කළමනාකරණය
- වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම්
- මාර්ගගත විභාග
- වැඩමුළු සහ පුහුණුව

2020 වර්ෂය අතරතුර, ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය විසින් මාර්ගගත අන්තර්ගත සංවර්ධනය, පවත්වාගෙන යාම හා ආශ්‍රිත නොයෙක් බාහිර සංවිධාන සඳහා අයවැය යෝජනා සැලසුම් කිරීම හා සකස් කිරීම මෙන්ම මාර්ගගත විභාග පවත්වාගෙන යාම සිදු කරන ලදි. රට තුළ දැනට පවතින වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය මාස කිහිපයකට වසා තැබීම නිසා මෙන්ම අරමුදල් සැපයීම සඳහා අදාළ ආයතන විසින් මුහුණ දී ඇති මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය විසින් විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කරන ආයදුම්කරුවන් සඳහා මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පහසුකම සපයන ලදි.

6.7 ජාත්‍යන්තර සබඳතා ඒකකය

ජාත්‍යන්තර සබඳතා ඒකකය 2013 ඔක්තෝබර් මස ස්ථාපිත කරන ලදී. එය සංශෝධිත 1990 අංක 01 දරන විවෘත විශ්වවිද්‍යාල ආඥාපනතේ 19 වන කොටස සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 කොටස යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල සභාව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2016 අංක 9 දරන අතුරු ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වේ.

ජාත්‍යන්තර සබඳතා අංශය උපකුලපතිගේ සෘජු අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂවරයෙකුගේ මෙහෙයවීම මත ක්‍රියාත්මක වේ. එහි පරිපාලන සහ මූල්‍ය කටයුතු කළමනාකරණ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ජාත්‍යන්තර සබඳතා අංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන අතර උපකුලපතිගේ නිර්දේශය මත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මත පත් කරනු ලබයි.

ජාත්‍යන්තර සබඳතා උපායමාර්ග සකස් කර ගැනීමේ දී සහ ලෝකයේ ඇති වෙනත් විශ්වවිද්‍යාල හෝ අනෙකුත් ආයතන සමඟ විධිමත් සබඳතා පාර්ශ්වකාරිත්වයන් ඇතිකර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය විශිෂ්ට උපදෙස් සැපයීම සහ මගපෙන්වීම සිදු කරයි.

ජාත්‍යන්තර සබඳතා අංශයේ අරමුණු පහත සඳහන් වේ.

(අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ආයතන, පීඨ, සනාථන සභාව හා පාලක සභාව සඳහා උපාය මාර්ග හා විශේෂිත නිර්දේශ සකස් කිරීම.

(ආ) විදේශීය ආයතන සමඟ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් ඇතිකරගත් විධිමත් ද්වීපාර්ශ්වික හා බහුපාර්ශ්වික ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් වැඩි දියුණු කිරීම හා සමාලෝචනය කිරීමට පහසුකම් සැලසීම.

(ඇ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් සඳහා ජාත්‍යන්තර සහයෝගිතා පර්යේෂණ සහ අධ්‍යයන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(ඈ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය සඳහා ජාත්‍යන්තරව පිළිගත් පර්යේෂකයින් හා ගුරුවරුන් ලෙස තම හැකියාවන් වැඩි දියුණු කර ගැනීම සඳහා අවස්ථා සැලසීම.

(ඉ) ජාත්‍යන්තර ව්‍යාපෘති හා වෙනත් ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා දායක වීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලයට සහාය වීම.

(ඊ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට, තොරතුරු බෙදා හැරීම හා ගෝලීයව දායකත්වයක් සැපයීම සඳහා අවස්ථාවන් ලබා දීම.

(උ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් වෙත විදේශීය වෘත්තීය අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම.

(ඌ) විදේශීය ශිෂ්‍යයින්, ගුරුවරුන් හා වෙනත් අමුත්තන් වෙත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටින කාල සීමාව අතරතුර අවශ්‍ය සහයෝගය ලබා දීම.

(එ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ වැඩසටහන් විදේශවල ප්‍රවර්ධනය කිරීම සහ සබඳතා ගොඩනගා ගැනීම.

(ඒ) ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් සහ විදේශ වල සිටින ලාංකීය දූත කණ්ඩායම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ජාත්‍යන්තර සබඳතා අංශය 2013 සිට 2020 දක්වා පසුගිය වසර හතක කාල සීමාව තුළ ක්‍රියාකාරකම් බොහෝමයක් සඳහා සක්‍රීය ලෙස දායක විය. පහත සඳහන් වන්නේ එම ක්‍රියාකාරකම්වල කෙටි සාරාංශයකි.

ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සබඳතා සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද අභිප්‍රාය ලිපි

අනු අංක	ආයතනයේ නම	රට	අත්සන් කරන ලද වර්ෂය
01	ඔකයමා විශ්වවිද්‍යාලය	ඉන්දියාව	2020
02	උත්තරකාන්ද් විවෘත විශ්වවිද්‍යාලය	ඉන්දියාව	2020
03	ක්වන්ට්ලෙන් පොලිටෙක්නික් විශ්වවිද්‍යාලය	කැනඩාව	2020
04	ඖෂධවිද්‍යාව පිළිබඳ ජගඩ්ගුරු ශ්‍රී ශිවරත්‍රීශ්වර විශ්වවිද්‍යාලය	ඉන්දියාව	2020

අනුමැතිය අපේක්ෂිත අවබෝධතා ගිවිසුම්

අනු අංක	ආයතනයේ නම	රට	වලංගු කාල සීමාව
01	භාරතීදාසන් විශ්වවිද්‍යාලය, තිරුචිරප්පල්ලි	ඉන්දියාව	වසර 5
02	කොරියානු ජාතික විවෘත විශ්වවිද්‍යාලය	කොරියානු ජනරජය	වසර 5
03	ක්වන්ට්ලෙන් පොලිටෙක්නික් විශ්වවිද්‍යාලය	කැනඩාව	වසර 3
04	විවෘත අධ්‍යාපන සම්පත් පදනම	නවසීලන්තය	වසර 3
05	එසෙක්ස් විශ්වවිද්‍යාලය	එක්සත් රාජධානිය	වසර 5
06	සීෂෙල්ස් විශ්වවිද්‍යාලය	සීෂෙල්ස්	වසර 5
07	ෂැංහයි විවෘත විශ්වවිද්‍යාලය	චීනය	වසර 3
08	ඔකයමා විශ්වවිද්‍යාලය (අවබෝධතා ගිවිසුම හා සම්මුතිය)	ඉන්දියාව	වසර 5

වර්තමාන අවබෝධතා ගිවිසුම් හා සම්මුති සමලෝචනය කිරීම හා අළුත් කිරීම

ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල, බෙල්ජියම- 2020/10/17 වන දින කල් ඉකුත් වීමට නියමිත වේ.

ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනය, පිලිපීනය - 2020/ 10/ 30 වන දින කල් ඉකුත් වීමට නියමිත වේ.

ERASMUS- EUSL බලශක්ති හවුල්කාරීත්ව ගිවිසුම හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විද්‍යාවේ කාන්තාවන් (OWSD) , UNESCO - IRU යටතේ මුල් කාලීන වෘත්තීය කාන්තා විද්‍යාඥයින්ගේ වැඩසටහන මගින් මෙම ප්‍රදානය කරන ලද ගිවිසුම්වල අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සපයන ලදි.

දැනට වසරකට වඩා වැඩි වැඩි කාලයක් ගත වන වර්තමාන අවබෝධතා ගිවිසුම්/ සම්මුති අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කරග ගැනීම සඳහා ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යෝජනා ඉදිරිපත් කරන ලදි. 2020 සැප්තැම්බර් මස අධ්‍යාපන අමාත්‍යාංශයේදී පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදි.

සහයෝගි පර්යේෂණ හා අධ්‍යයන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය වෙත අවස්ථා ලබා දීම.

මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම

Split-site PhD වැඩසටහන සඳහා මාර්ගෝපදේශ

බාහිර හවුල්කරුවන් හා බාහිර විද්වතුන් සඳහා මාර්ගෝපදේශ

2020 : ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද - බාහිර පර්යේෂණ හවුල්කරුවන්/ විද්වතුන්

	අනුබද්ධිත විදේශීය විශ්වවිද්‍යාලය	රට	අදාළ විද්වතාගේ නම	කාල සීමාව
01	COMSATS විශ්වවිද්‍යාලය ඉස්ලාමාබාද්, ලාහෝර් විශ්වවිද්‍යාලය	පකිස්තානය	ආචාර්ය. මුහම්මද් යාර්	වසර 1
02	ටොරොන්ටෝ විශ්වවිද්‍යාලය	කැනඩාව	ආචාර්ය.පොන්නි අරසු	වසර 2

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට, තොරතුරු බෙදා හැරීම හා ගෝලීයව දායකත්වයක් සැපයීම සඳහා අවස්ථාවන් ලබා දීම.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා e-newsletters: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත පැමිණෙන විදෙස් අමුත්තන් හා සම්බන්ධ උත්සව මෙන්ම විදෙස් රටවල අධ්‍යයන අවස්ථා සම්බන්ධ තොරතුරු බෙදා හැරීම සඳහා e-newsletters දෙකක් ආරම්භ කරන ලදි.

සියලුම පීඨ මණ්ඩලවල න්‍යාය පත්‍ර විෂයක් ලෙස ජාත්‍යන්තර සබඳතා ඒකකයේ ක්‍රියාකාරකම්: 2020 කළමනාකරණ මණ්ඩලයේදී ලබා ගන්නා ලද තීරණයකට අනුව න්‍යාය පත්‍ර විෂයක් ලෙස ජාත්‍යන්තර සබඳතා ඒකකයේ ක්‍රියාකාරකම් සියලුම පීඨවල වාර්තා වී ඇත. කාර්ය මණ්ඩලය අතර අවස්ථාවන් හා වැදගත් සිදුවීම් පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම ජාත්‍යන්තර සබඳතා ඒකකයේ වැඩි දියුණුව සඳහා ප්‍රතිචාර ලබා ගැනීම මෙමගින් සිදු කෙරේ.

වෙබ් සම්මන්ත්‍රණය (Webinar) : 2020

වෙබ් සම්මන්ත්‍රණ මාතෘකාව	ඉදිරිපත් කරන්නා	අනුබද්ධිත ආයතනය
Horizon 2020- Green Deal Call – tips for participation	ආචාර්ය. ජෝර්ජ් බොනාස්	ශ්‍රී ලංකා නවෝත්පාදන හවුල්කාරිත්වය EU - Sri Lanka Innovation Partnership (EU- SLIP)

ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහසුකම් සපයන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ පැවැත්වීමට නියමිත විදේශීය වැඩමුළු

වැඩමුළුව/ සම්මන්ත්‍රණයේ නම	නියෝජිතයා	අනුබද්ධිත ආයතනය
34 වන විවෘත විශ්වවිද්‍යාල ආසියානු සංගමයේ වාර්ෂික සම්මේලනය	විදේශීය හා දේශීය සහභාගීවන්නන්	විවෘත විශ්වවිද්‍යාල ආසියානු සංගමය, ඉන්දුනීසියාව

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වැඩසටහන් විදෙස් රටවල ප්‍රවර්ධනය කිරීම හා සබඳතා ගොඩනගා ගැනීම

විදේශීය ශිෂ්‍යයින් සඳහා තොරතුරු යාවත්කාලීන කිරීම: ජාත්‍යන්තර සබඳතා ඒකකයේ වෙබ් පිටුවේ විදේශීය ශිෂ්‍යයින් සඳහා වැදගත් තොරතුරු යාවත්කාලීන කර ඇත. විවෘත විශ්වවිද්‍යාලයීය වැඩසටහන් සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින විදේශීය ශිෂ්‍යයින් සඳහා මගපෙන්වීමක් ලබා දීම වෙනුවෙන් FAQ (Frequently Asked Questions) කොටසක්ද වැඩි දියුණු කර ඇත.

ප්‍රවර්ධන ද්‍රව්‍ය නිර්මාණය කර බෙදා හැරීම: විදේශීය ශිෂ්‍යයින් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සීමාවාසික පුහුණුව, අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් පිළිබඳ ප්‍රවර්ධන ද්‍රව්‍ය අධ්‍යයන ජාලය වෙත නිර්මාණය කර බෙදා හරින ලදි. ''Overseas Students, Scholars and Fellow Program'' E-Flyer සඟරාව ආසියානු හා වෙනත් ලෝක ව්‍යාප්ත විශ්වවිද්‍යාල 400ක් තුළ බෙදා හරින ලදි.

"Overseas Ready" වැඩසටහන් : ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් විදේශීය ශිෂ්‍යයින් වෙත පිරිනැමිය හැකි අධ්‍යයන වැඩසටහන් පිළිබඳව පීඨවලින් තොරතුරු එක් රැස් කිරීම සිදු කරයි.

බෲනායි දරුසලම් විශ්වවිද්‍යාලය සමඟ පැවති හමුව

බෲනායි දරුසලම් විශ්වවිද්‍යාලයේ ඒකාබද්ධ විද්‍යා පීඨයේ පීඨාධිපති සමඟ 2020 අගෝස්තු මස හමුවක් පැවැත්විණ. Smart Farming, සහල් පර්යේෂණ හා ශිෂ්‍යය හුවමාරුව සඳහා ඇති අවස්ථාවන් පිළිබඳ ඔහු විසින් සඳහන් කරන ලදි. විධිමත් සහයෝගීතාවයක් ගොඩනඟා ගන්නා අතරම සහයෝගී පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට තීරණය කරන ලදි. බෲනායි දරුසලම් විශ්වවිද්‍යාලය සමඟ සහයෝගී පර්යේෂණ වැඩසටහන් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අනාගත PhD ඉල්ලුම්කරුවන් කිහිප දෙනෙක් සිටිති.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් වෙත විදේශීය වෘත්තීය අවස්ථාවන් ගවේෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම

විදේශීය අධ්‍යයන ආයතනවල ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් පිළිබඳ වැඩසටහන: උපාධිධාරීන් සහ ආයතනය අතර සබඳතාවය පවත්වාගැනීම සඳහා ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් මෙම වැඩසටහන වැඩි දියුණු කරන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන්ගෙන් ඔවුන්ගේ තොරතුරු එක් රැස් කිරීම හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පිළිබඳ ඔවුන්ගේ අදහස් සටහන් කරගැනීම සඳහා ගූගල් මඟින් සමීක්ෂණ ප්‍රශ්නාවලියක් පවත්වන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් 34 දෙනෙකු අතුරින් තෝරාගත් 6 දෙනෙකු සමඟ මාර්ගගත සම්මුඛ පරීක්ෂණ පවත්වා වාර්තාවක් සකස් කරන ලදි. විදේශීය උපාධිධාරී තානාපතිවරුන් (Alumni Ambassador) පත්කිරීම දැනට සිදු කෙරෙමින් පවතී.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පිළිගැනීම ඉහළ නැංවීම: ජර්මානු අධ්‍යාපන පද්ධතිය විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සඳහා ලබා දී ඇති German Academic Exchange Service (DAAD) පිළිගැනීම ශ්‍රී ලංකාවේ අනෙකුත් රාජ්‍ය විශ්වවිද්‍යාලවලට වඩා අඩු බව ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් පිරිසක් විසින් දැනුම් දෙන ලදි. එය ඔවුන්ට අවාසි සහගත තත්ත්වයක් වේ. මෙම තත්ත්වය සමාලෝචනය කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා German Academic Exchange Service (DAAD) සහ ජර්මනියේ විදේශ අධ්‍යාපන මධ්‍යම කාර්යාලය (ZAB) සමඟ නිරන්තර සාකච්ඡාවල නිරත වේ. මේ සඳහා සියළුම උපාධි වැඩසටහන් වෙනුවෙන් ඇතුළත්වීමේ සුදුසුකම් පිළිබඳ යාවත්කාලීන වාර්තාවක් සකස් කරන ලදි.

ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් සහ විදේශ වල සිටින ලාංකීය දූත කණ්ඩායම් සමඟ සබඳතා සම්බන්ධීකරණය කිරීම.

රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල හමුවීම: ඇෆ්ගනිස්තානු ඉස්ලාමීය ජනරජයේ තානාපතිගේ ආරාධනය පරිදි උපකුලපති සහ ජාත්‍යන්තර සබඳතා ඒකකයේ අධ්‍යක්ෂ ඔහු හමු විය. මෙම හමුවීමේදී ඇෆ්ගනිස්තානු විශ්වවිද්‍යාල සඳහා ආධාර සැපයීම හා ශිෂ්‍යත්ව ලබා දීම පිළිබඳව සාකච්ඡා කරන ලදි. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය මඟින් පිරිනමන සංවර්ධන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ව්‍යාපාර පරිපාලනපති උපාධිය සම්බන්ධයෙන් ඔහු විසින් උනන්දුවක් දක්වන ලදි.

මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති සහ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීම හා ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම ජාත්‍යන්තර සබඳතා ඒකකය සාකච්ඡා කරමින් පවති.

COL-L3F ව්‍යාපෘතියේ ආයතනගතකරණය: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය උපකුලපති විසින් පත් කරන ලද ව්‍යාපෘති කණ්ඩායමක් මඟින් මෙම වැඩසටහන පාලනය වේ. එය දැනට ජාත්‍යන්තර සබඳතා ඒකකය යටතේ ආයතනගත කර ඇති අතර ව්‍යාපෘති කණ්ඩායමේ ඉල්ලීම මත එහි ක්‍රියාකරකම් කළමනාකරණ මණ්ඩලය මඟින් අධීක්ෂණය කරනු ඇත.

විදේශීය ශිෂ්‍යයින්, ගුරුවරුන් හා වෙනත් අමුත්තන් වෙත ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තුළ රැඳී සිටින කාල සීමාව අතරතුර අවශ්‍ය සහයෝගය ලබා දීම.

2020 - ජාත්‍යන්තර සබඳතා ඒකකය මගින් පහසුකම් සපයන ලද නියෝජිතයින්

අනු අංකය	රට	නියෝජිතයින්	අනුබද්ධිත ආයතනය
01	නේපාල දූත පිරිසගේ සංචාරය	ආචාර්ය. එලන් කාම්, මහාචාර්ය. දීප් බහදූර් අධිකාරී, මහාචාර්ය. සුහාන් ආචාර්ය, ආචාර්ය. ධනපති සුබේධි	ඔස්ලෝ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය, ට්‍රිබුආන් විශ්වවිද්‍යාලය, කත්මණ්ඩු විශ්වවිද්‍යාලය
02	බෙල්ජියමේ දූත පිරිසගේ සංචාරය	ආචාර්ය. විම් ලුආවෑර්ත් හා ආචාර්ය. ක්‍රිස්	ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහල

බෙල්ජියමේ ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහලෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත පැමිණි පර්යේෂණ ශිෂ්‍යාවක් වන ලොටා ඔලවිදෙස් කොරියෝර් මෙය සඳහා බෙල්ජියම වෙත යාමට වීසා ලබා ගැනීම සඳහා අවශ්‍ය වෛද්‍ය වාර්තාව ලබා ගැනීමට ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් සහාය ලබා දෙන ලදි. මෙම ශිෂ්‍යාව කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් විදෙස් ගමන් සඳහා පනවන ලද සීමාවන් හේතුවෙන් මාස 4ක කාලයක් දිවයිනේ රැඳී සිටීමට සිදුවීම නිසා පීඩාවට පත් විය. අවසානයේ, 2020 ජූලි මස 27වන දින ඇය බෙල්ජියම වෙත නැවත පිටත්ව යන ලදි.

2020 සංවිධානය කරන ලද විශේෂිත දේශන (මෙම සියලුම දේශන සජීවීව විකාශය වූ අතර එහි වීඩියෝ දර්ශන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය ඔස්සේ නැරඹිය හැක)

අනු අංකය	විශේෂිත දේශන මාතෘකාව	ඉදිරිපත් කරන්නා	විශ්වවිද්‍යාලය
01	දියුණු වෙමින් පවතින රටවල් සඳහා සහනශීලී සෞඛ්‍ය සේවා විසඳුම්	ආචාර්ය මුහම්මද් යාර්	කොස්මට්න් විශ්වවිද්‍යාලය ඉස්ලාමාබාද්, ලාහෝර් විශ්වවිද්‍යාලය



1. ආචාර්ය. මුහම්මද් යාර් සමඟ පැවති හමුව - පර්යේෂණ සහයෝගීතාකරු



2. සුභාංගි සූඩ් මෙය සමඟ පැවති හමුව - Coursera for Campus



3. ආචාර්ය. මුහම්මද් යාර් විසින් පවත්වන ලද විශේෂ දේශනය



4. ලියුවන් හා ලිම්බර්ග් විශ්වවිද්‍යාල විදුහලේ ආචාර්ය. විම් ලුආවෑර්ත් සමඟ පැවති හමුව



5. නේපාල දූත පිරිසේ සංචාරය



5.1 නේපාල දූත පිරිසේ සංචාරය



5.1 නේපාල දූත පිරිසේ සංචාරය



6. ඔකයමා විශ්වවිද්‍යාලය සමඟ අත්සන් කරන ලද අභිප්‍රාය ලිපි



6.1 ඔකයමා විශ්වවිද්‍යාලය සමඟ අත්සන් කරන ලද අභිප්‍රාය ලිපි



6.2 ඔකයමා විශ්වවිද්‍යාලය සමඟ අත්සන් කරන ලද අභිප්‍රාය ලිපි

6.8 ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

ඉංජිනේරු තාක්ෂණ පීඨය විසින් ව්‍යාපාර සබඳතා හා වාණිජකරණ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ලෙස පීඨය තුළ ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම් පුහුණු කිරීම වෙනුවෙන් 2014 දෙසැම්බර් මස 15 වන දින ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදි. ඉංජිනේරු තාක්ෂණ පීඨය වෙනුවෙන් බාහිර ව්‍යාපාරික සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ව්‍යාපාර සහයෝගීතාකරුවන්ට පර්යේෂකයින් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතා ගොඩනඟා ගැනීමට සහයෝගය දක්වනු ලබයි. විශ්වවිද්‍යාලය තුළ වඩාත් තොරතුරු සහිත කාර්යාලය බවට පත්වීම සඳහා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය ඉතා උනන්දුවෙන් කටයුතු කරයි.

2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා කාලය තුළ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත දැක්වේ.

(1) පර්යේෂණ කටයුතු වැඩි දියුණු කිරීම හරහා ව්‍යාපාර සඳහා සහාය වන බාහිර සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

කොස් (Jack Fruit Feed) සහ නැවුම් සත්ව ආහාර (fresh fodder) භාවිතා කරමින් එළදෙනුන්ගේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම සම්බන්ධව පර්යේෂණ සිදු කිරීම සඳහා මින්නේරියාවේ සමූපකාර කෘෂිකාර්මික සමිතියට සහාය වන ලෙස Heal Lanka (Pvt) Ltd සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ සරත් ප්‍රනාන්දු මහතා විසින් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වෙත ඉල්ලීමක් සිදු කරන ලදි.

Nestle Lanka PLC සමඟ සහයෝගීතාවය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පර්යේෂණ මගින් නිපදවන, වෙළඳපොළ වෙත නිකුත් කිරීම සඳහා දියුණු කළ හැකි නිෂ්පාදන පිළිබඳව විමසීම සඳහා Nestle Lanka PLC සමාගම විසින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත පැමිණෙන ලදි.

(2) බුද්ධිමය දේපළ ආරක්ෂණය හා වාණිජකරණ ක්‍රියාකාරකම්

අද වන විට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් පේටන්ට් බලපත්‍ර අයදුම්පත් ගොනු කිරීම සඳහා සහාය ලබා දී ඇති අතර ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පේටන්ට් බලපත්‍රයේ තත්ත්වය පිළිබඳ වාර්තා තබා ගැනීම සහ පහසුකම් සැපයීම සිදු කරනු ලබයි.

- ත්‍රිමාණ මුද්‍රිත Ready-To-Wear ඇඳුම් එකතුව.
- Fiber optics rave party wear ඇඳුම් එකතුව.
- කඩදාසි සැකසීම සඳහා කඩදාසි මැහුම් යන්ත්‍රයක් සකස් කරන ලද අතර එය හරහා අලෙවි කෙරේ.
- උපකරණයක් හරහා ක්‍රමවත්ව පාංශු පරීක්ෂණ සිදු කිරීම ප්‍රවර්ධනය කිරීමෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
- වඳුරන් පලවාහැරීම සඳහා ‘‘Monkey referent gun’’
- විසිතුරු ඕකිඩ් පැල

වාණිජකරණ ක්‍රියාකාරකම්



(අ) ගෘහස්ථ සැරසිලි සඳහා විසිතුරු ඕකිඩ් පැල

විසිතුරු ඕකිඩ් ව්‍යාපෘතියේ අරමුණ වන්නේ උද්භිද විද්‍යා අධ්‍යනාංශයේ ආචාර්ය. දර්ශනී වීරහේවා විසින් සිදු කරන ලද පර්යේෂණය වාණිජකරණය කිරීමයි. LED ආලෝකකරණය සහ වාෂ්පීකරණය (in-pot vaporizer) භාවිතා කරමින් අවම නඩත්තු කිරීමකින් සමන්විත විසිතුරු ගෘහස්ථ ඕකිඩ් පැල සඳහා "අලෙවිකරණය කළ හැකි මූලාකෘතියක්" ගොඩ නැගීම ව්‍යාපෘතියේ අරමුණයි. එම මූලාකෘතිය සම්පූර්ණ කරන ලදී. දැනට අපි බලපත්‍ර ලත් ගිවිසුමක් යටතේ නිෂ්පාදනයක් නිපදවා අලෙවි කිරීම සඳහා හවුල්කරුවෙකු සොයමින් සිටිමු.

(ආ) නවෝත්පාදන ආහාර නිෂ්පාදන

අප විසින් කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු අධ්‍යනාංශය සමඟ එක්ව නවෝත්පාදන ආහාර නිෂ්පාදන වැඩි දියුණු කරමින් පවතී. එම නිෂ්පාදන වන්නේ,

(i) O - FRUTZ HAPPY MEAL (ඉහළ පෝෂ්‍ය පදාර්ථ අඩංගු සම්පූර්ණයෙන් ස්වාභාවික උදෑසන ආහාරය)

මෙම නිෂ්පාදනය වේලන ලද පළතුරු සහ සහල් පිටි මිශ්‍රණයකි. පළතුරු වල වර්ණය, රසය, ස්වභාවය සහ පෝෂක අන්තර්ගතය ආරක්ෂා කරමින් වියළීම සිදු කරන ලදී. ඉන්පසු සුදුසු ලෙස වියළීම සිදු කරන ලද පළතුරු පෙති සහ සහල් පිටි එකට මිශ්‍ර කර අවසාන නිෂ්පාදනය, ආහාර සඳහා ගුණාත්මක ද්‍රව්‍ය භාවිතයෙන් ඇසුරුම් කරන ලදී. ඉන් අනතුරුව පෝෂක සංයුතිය සහ එය භාවිතයට ගත හැකි, පරිභෝජනයට සුදුසු හෝ විකිණිය හැකි කාලය (shelf life) විශ්ලේෂණය කරන ල



(ii) Jackfruit Kokiz - කොස් භාවිතා කරමින් සාදන ලද කොකිස්

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් කොස් ඇට භාවිතා කරමින් මෙම කොකිස් නිෂ්පාදනය කරන ලදී. මෙහි සාම්පල නිෂ්පාදනය කරන ලද අතර ප්‍රථමයෙන් රසය පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කරන ලදී. මේ පිළිබඳව අදහස් ලැබී ඇති අතර වැඩි දියුණු කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම නිෂ්පාදනය සඳහා සංවේදක විශ්ලේෂණය (Sensory analysis) සිදු කරන ලදී.







(3) ක්ෂේත්‍ර චාරිකා

ක්ෂේත්‍ර චාරිකා සඳහා ඇති අවස්ථාවන් හඳුනාගැනීමට ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය මඟින් බොහෝ සංවිධාන හා පුද්ගලයින් සම්බන්ධ කරගනිමින් පවතී.

ගොවි ජනතාවගේ ගැටළු අවබෝධ කර ගැනීම සහ ගොවි හා කර්මාන්තවල නිෂ්පාදන හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නව විසඳුම් යෝජනා කිරීම සඳහා ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් මැදිරිගිරිය සහ අනුරාධපුර කාබනික බෝග වගා සමුපකාර සමිතිය වෙත ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදි. වඳුරන් සහ මොණරුන් සඳහා වන විකර්ෂක තුවක්කුවේ විකිණිය හැකි නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීමද මෙම චාරිකාවේ අරමුණක් වේ. මෙම චාරිකාව 2020 අගෝස්තු 10 වන දින සිදු කරන ලදි.




(4) තාක්ෂණ ප්‍රවණතා පිළිබඳ සම්මන්ත්‍රණය

(අ) ''කෘතිම බුද්ධිය" පිළිබඳ සම්මන්ත්‍රණය

මෙම සම්මන්ත්‍රණය 2020 ජනවාරි 04 වන දින රාත්‍රී 8.30 සිට සවස 4.30 දක්වා විදුලි හා පරිගණක ඉංජිනේරු අධ්‍යනාංශයේ පරිගණක විද්‍යාගාරයේදී පැවැත්විණ. ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් විදුලි හා පරිගණක ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය සමඟ සහයෝගීතාවයෙන් මෙම සම්මන්ත්‍රණය සංවිධානය කරන ලදි. දර්ශන අබේරත්න මහතා මෙහි කථිකයා විය. මේ සඳහා පහසුකම් සපයන ලද්දේ නෝර්වේ ඇඩ්ගර් විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය හදාරනු ලබන දෙවන වසර ශිෂ්‍යයෙක් වන අතර විශ්වවිද්‍යාලයීය කෘතිම බුද්ධි පර්යේෂණ මධ්‍යස්ථානයේද (CAIR) සාමාජිකයෙකු වේ.




(ආ) "බුද්ධිමය දේපළ අයිතිවාසිකම්" පිළිබඳ සම්මන්ත්‍රණය

"බුද්ධිමය දේපළ අයිතිවාසිකම්" පිළිබඳ වැමුළුව 2020 සැප්තැම්බර් 29 වන දින ප.ව. 1.00 සිට ප.ව 4.00 දක්වා ඉංජිනේරු තාක්ෂණ පීඨ රැස්වීම් ශාලාවේදී පැවැත්විණ. මෙම වැඩමුළුව ව්‍යාපාර සම්බන්ධික්කරණ මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලදි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා කළමනාකරු ත්‍රිෂාන් පෙරේරා මහතා මෙම වැඩමුළුවෙහි කථිකයා විය. අපගේ බුද්ධිමය දේපළ ආරක්ෂා කරගන්නේ කෙසේද යන්න පිළිබඳව ඔහු විසින් පැහැදිලි කරන ලදි.

(5) නවෝත්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීම සහ උපකරණ මිලදී ගැනීම

කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට යාබද ගොඩනැගිල්ලේ සෞඛ්‍ය විද්‍යා අධ්‍යනාංශය විසින් මින් පෙර භාවිතා කරන ලද දැනට භාවිතා නොකරන කාමර කිහිපයක් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් හඳුනා ගන්නා ලදි. උපකරණ අළුත්වැඩියා කිරීම හා මිලදී ගැනීම සඳහා AHEAD අරමුදල හරහා ප්‍රතිපාදන වෙන් කර ඇත. මෙම මධ්‍යස්ථානය ඉහළ වටිනාකමකින් යුත් උපකරණවලින් සමන්විත වේ.

AHEAD ව්‍යාපෘතියෙන් ලැබී ඇති රුපියල් මිලියන 10ක ප්‍රතිපාදනවලින් කොටසක් නවෝත්පාදන මධ්‍යස්ථානයේ සංවර්ධනය සඳහා යොදා ගැනේ. මධ්‍යස්ථානය සම්පූර්ණයෙන්ම ස්ථාපිත කිරීමෙන් පසු එහි අපේක්ෂිත වාර්ෂික ආදායම රුපියල් මිලියන 1ක් වේ. රුපියල් මිලියන 4ක ප්‍රදානයේ පළමු අදියර ලැබී ඇති අතර Block 34හි ගොඩනැගිල්ල මධ්‍යස්ථානය සඳහා තෝරාගෙන ඇති අතර ලේසර් කටර්, ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍ර සහ වෙනත් අවශ්‍ය උපකරණ මධ්‍යස්ථානය සඳහා මිලදී ගනු ලැබේ.

(6) කෙටි පාඨමාලා

උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථානය යටතේ ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් ''තාක්ෂණ ව්‍යවසායකයින් සඳහා ඇන්ඩ්‍රොයිඩ් යෙදුම් සංවර්ධනය'' පිළිබඳ කෙටි පාඨමාලාවක් පවත්වන ලදි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථානය යටතේ OUSL SLASSCOM Industry Bootcamp පවත්වනු ලබයි.

(7) හරිත ව්‍යාපෘති

ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය විසින් පහත සඳහන් ව්‍යාපෘතිවල සහයෝගී පර්යේෂණ සහ වැඩි දියුණු කිරීම සඳහා Heal Lanka (Pvt) Ltd සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ සරත් ප්‍රනාන්දු මහතා සමඟ කටයුතු කරනු ලබයි.

1. ගවයින් සඳහා ලබා දෙන ආහාර - Green Fodder
2. කොස් භාවිතයෙන් නිපදවන ගව ආහාර
   කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු අධ්‍යනාංශය විසින් ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානය සමඟ මෙම පර්යේෂණය සිදු කරයි.
3. Lime Pulp
4. සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන උද්‍යාන කටයුතු සඳහා භාවිතා වන මෙවලම් Fully Automated Vertical Garden Kit



5. ස්වයංක්‍රීය හරිතාගාර - Automated greenhouse
6. පොල් වතුර භාවිතා කරමින් නිපදවන විනාකිරි
7. ස්වයංක්‍රීයව බිම්මල් වර්ධනය කිරීමේ පෙට්ටිය - Automated Mushroom Growth Box
8. මී වද සඳහා - Bee Flow Hive Box
9. මදුරුවන් සඳහා - Mosquito referent box

6.9 අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය

අධ්‍යාපන තාක්ෂණික අංශය (ET) (වර්තමානයේ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය - CETMe) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලයකින් විවෘත හා දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයකි. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියලුම අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යාමේදී මෙම මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තත්ත්ව සහතික කිරීමේ මාර්ගෝපදේශ සකස් කිරීම, ඉගෙනුම් සම්පත් (මුද්‍රණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා මාර්ගගත) සැලසුම් කිරීම හා වැඩි දියුණු කිරීමේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විවිධ ඉගෙනුම ලබන්නන් සඳහා උසස් තත්වයේ ඉගෙනුම් සම්පත් සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සහාය වීම මෙම මධ්‍යස්ථානය මඟින් කටයුතු කෙරේ. මෙම මධ්‍යස්ථානය විසින් පීඨ 6ටම දැනට මාර්ගගත පාඨමාලා ඇතුලු ඉගෙනුම් සම්පත් සංවර්ධනය කිරීමට සහාය ලබා දෙමින් සේවාවන් සපයනු ලබයි.

සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලින් සෘජුවම සම්බන්ධවෙමින් සපයන (face to face) ඉගැන්වීම් මෙන් නොව මෙහි ඇති ඉගෙනුම්/ ඉගැන්වීමේ සම්පත් දුරස්ථව ඉගෙනුම ලබන ශිෂ්‍යයින්ට ලබා ගත හැකි ප්‍රධාන ඉගෙනුම් ද්‍රව්‍ය වේ. අධ්‍යාපන තාක්ෂණයෙහි වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය 1980 දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ආරම්භයේදී පිහිටුවන ලද අතර 1987 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ආඥා පනත 1 යටතේ අධ්‍යයන අංශයක් ලෙස 1988දී (රූපසටහන 1) අධ්‍යාපන තාක්ෂණ අංශයක් බවට පරිවර්තනය විය.



රූපසටහන 1 : ලාල් ගුණවර්ධන මහතා, ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සේවය කළ පළමු ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරී

1993දී ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සියේ (JICA) මූල්‍ය ආධාර ඇතිව ඉදිකරන ලද නවීනතම චිත්‍රාගාර සංකීර්ණය සමඟ එය තවදුරටත් ශක්තිමත් කරන ලදි. (රූපය 2අ සහ ආ)



රූපසටහන 2 (අ): පාලක මැදිරිය





රූපසටහන 2 (ආ): ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සියේ (JICA) මූල්‍ය ආධාර ඇතිව ඉදිකරන ලද නවීනතම චිත්‍රාගාර සංකීර්ණය

අධ්‍යාපන තාක්ෂණික මාධ්‍යය මධ්‍යස්ථානයේ නිෂ්පාදන ඒකකයේ චිත්‍රාගාරය දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (DEMP 2003-2004)- රූපසටහන 3(අ) සහ 2 (ආ) ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (OUSLCE) යටතේ වැඩි දියුණු කරන ලද ඩිජිටල්කරණය කරන ලද සහ අධි-විභේදන (high-definition) රූපවාහිනී චිත්‍රාගාරයක් බවට පරිවර්තනය කරන ලදි. උසස් තත්වයේ අධ්‍යාපනික ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් නිෂ්පාදනය කිරීමේදී මෙම මධ්‍යස්ථානය අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහයෝගය දක්වනු ලබයි.



රූපසටහන 3(අ): 1993දී චිත්‍රාගාර සංකීර්ණයේ පාලක මැදිරිය





රූපසටහන 3(ආ): OUSL-CE Project ව්‍යාපෘතියේ සහාය ඇතිව උපකරණ ඩිජිටල්කරණය කිරීමෙන් පසු පාලන මැදිරිය

1994දී පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම මඟින් විවෘත හා දුරස්ථ ඉගෙනුම් විශ්වවිද්‍යාලයක් ලෙස විවෘත හා දුරස්ථ ඉගෙනුම් පර්යේෂණවල වැදගත්කම හඳුනා ගැනීමට මග පාදන ලදි.1996දී මෙම අංශයට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමත් සමඟ මෙම ප්‍රවේශය තවදුරටත් ශක්තිමත් වූ අතර විවෘත හා දුරස්ථ පර්යේෂණ පැවැත්විය යුතු ආකාරය ක්‍රමයෙන් හඳුනාගත් අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ප්‍රජාව ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගන්න ලදි.

නව තාක්ෂණික සංවර්ධනයන් සඳහා පහසුකම් සැලසීම සඳහා 2011දී අධ්‍යාපන තාක්ෂණික අංශයේ ව්‍යූහාත්මක වෙනස්කම් සිදු වී ඇති අතර එය වෙනම ඒකක 2ක් සහිත අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය ලෙස ප්‍රතිව්‍යූහගත කරන ලදි. අධ්‍යයන හා පර්යේෂණ ඒකකය සහ නිෂ්පාදන ඒකකය එම ඒකක වේ.

අධ්‍යයන හා පර්යේෂණ ඒකකය

- පාඨමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මාර්ගෝපදේශ සහ තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණ සකස් කිරීම. (මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා මාර්ගගත)
- ස්වයං උපදේශන ලේඛන රචනා කිරීම, ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් නිෂ්පාදනය කිරීම, මාර්ගගත පාඨමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය මෙන්ම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ විවෘත අධ්‍යාපන සම්පත් නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. (රූපසටහන 4)
- උපදේශාත්මක ඉගෙනුම් සම්පත් (මුද්‍රණ, ශ්‍රව්‍ය දෘශ්‍ය හා මාර්ගගත) වැඩි දියුණු කිරීමේදී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පහසුකම් සැපයීම හා සහාය දැක්වීම.
- විශ්වවිද්‍යාලයේ සියලුම මාර්ගගත පාඨමාලා සකස් කිරීම, සමාලෝචනය කිරීම හා ඇතුළත් කිරීම (upload)
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සියලුම පාඨමාලා සංස්කරණය කිරීම
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාඨමාලා ද්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් සහ මාර්ගගත පාඨමාලාවල ගුණාත්මක ප්‍රමිතීන් සහතික කිරීම සහ
- විවෘත හා දුරස්ථ ඉගෙනුම් සහ අධ්‍යාපන තාක්ෂණයට අදාළ පර්යේෂණ පැවැත්වීම හා පහසුකම් සැපයීම



රූපසටහන 4: ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්



2013දී SAARC රටවල හවුල්කරුවන් සඳහා පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්



පළමු විදෙස් වෘත්තීය සංවර්ධන වැඩසටහන - 2014 දී මාලදිවයින් ජාතික විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදි

නිෂ්පාදන ඒකකය (මාධ්‍ය මන්දිරය)

අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍ය මධ්‍යස්ථානයෙහි නිෂ්පාදන ඒකකය (මාධ්‍යය මන්දිරය) අංගසම්පූර්ණ ඩිජිටල් අධි-විභේදන රූපවාහිනී චිත්‍රාගාරයක්, හඬ කැවීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය චිත්‍රාගාර සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ඉගෙනුම් සම්පත් නිෂ්පාදනය කිරීම සඳහා පශ්චාත් නිෂ්පාදන ඒකකවලින් සමන්විත වේ. වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය හා ත්‍යාග ප්‍රදානෝත්සවය ඇතුළුව විශ්වවිද්‍යාලයේ සියලුම වැදගත් උත්සවවල ශ්‍රව්‍ය දෘශ්‍ය ආවරණය සිදු කිරීමද මෙහි වගකීමක් වේ. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යය සඳහා ග්‍රැෆික් සහ සජීවිකරණ සැලසුම් කිරීම වෙනුවෙන් අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයේ දෘශ්‍ය කලා අංශය මඟින් සිදු කරනු ලැබේ. වීඩියෝ නිෂ්පාදන සඳහා ආධාරක (props) ඔවුන් සැලසුම් කරනු ලබයි. නිෂ්පාදන ඒකකය ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලයකින් සමන්විත වන අතර එය වසර 40ක කාලයක් පුරාවට එක් රැස් කරන ලද විවිධ වීඩියෝ දර්ශන එකතුවක් වේ.

අධ්‍යාපන තාක්ෂණයේ සහ මාධ්‍යය ක්ෂේත්‍රයේ වර්ධනයත් සමඟ අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයද ඊට අනුකූලව කටයුතු කරයි. 2018 දී මධ්‍යස්ථානය විසින් ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් ඩිජිටල් ගබඩාවන් 2ක තැන්පත් කිරීමට මූලිකත්වය ගෙන ඇත.

"Open Cast" විශේෂයෙන් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන්නන්ට ඔවුන්ගේ අන්තර්ජාල පාඨමාලා හරහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් වෙත පිවිසිය හැකි අතර "*OpenUtube*" යනු ගෝලීය ප්‍රජාවට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සම්පත් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන විවෘත (open access repository) ප්‍රවේශයකි.

විශේෂිත ශ්‍රව්‍ය නාලිකාවක් ස්ථාපිත කිරීමට මධ්‍යස්ථානය දැනටමත් පියවර ගෙන ඇති අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ගුවන්විදුලි වෙබ් අඩවිය හරහා පුළුල් ලෙස විසිරී සිටින ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ඉගෙනුම ලබන්නන් වෙත සන්නිවේදනය වැඩි දියුණු කිරීම සඳහා සමීප සම්බන්ධතා ඇති ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ඉගෙනුම් ප්‍රජාවක් ගොඩනැගීමට කටයුතු කරයි.

"Open Knowledge Movement" යන තේමාව යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 2014 සිට විවෘත අධ්‍යාපන සම්පත් නිර්මාණය කිරීම හා ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීමට මූලිකත්වය ගෙන තිබේ. දැනට පවතින මුද්‍රිත පාඨමාලා ද්‍රව්‍ය/ ඉගෙනුම් සම්පත් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විවෘත අධ්‍යාපන සම්පත් බවට පරිවර්තනය කිරීම සහ මෙම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සම්පත් ගෝලීය ප්‍රජාවට කිසිදු පිරිවැයකින් තොරව ප්‍රවේශ වීමේ හැකියාව ලබා දීමට අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් කටයුතු කරනු ලැබේ.

අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයේ විසින් පාඨමාලා නිර්මාණය කිරීම, මාර්ගගත පාඨමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, මාර්ගගත උපදේශනය සහ ඉගැන්වීම මෙන්ම චිත්‍රපට හා රූපවාහිනී නිෂ්පාදන පිළිබඳව කෙටි පාඨමාලා පිරිනමනු ලබයි. මෙම ඒකකය මඟින් රූපවාහිනී චිත්‍රාගාර පහසුකම් කුලියට ලබා දීම සහ ආදායම් උත්පාදනය කිරීමේ ව්‍යාපෘති හරහා සේවා සැපයීම මඟින් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙත අදායම් ලබා දීම සිදු කරනු ලබයි.

පසුගිය දශක හතර තුළ අධ්‍යාපන තාක්ෂණික හා මධ්‍යය මධ්‍යස්ථානය විසින් පර්යේෂණ, වීඩියෝ සහ බහුමාධ්‍යය නිෂ්පාදන මෙන්ම ඡායාරූපකරණය යන ක්ෂේත්‍රවල ජාත්‍යන්තර, ජාතික සහ ආයතනික සම්මාන දිනා ගෙන ඇත.

මේ වන විට මෙම අංශය පහත සඳහන් ජයග්‍රහණ ලබා ඇත.

- පර්යේෂණ සඳහා ජාත්‍යන්තර සම්මාන 5ක් සහ ආයතනික සම්මාන 4ක් (රූපසටහන 5)
- වීඩියෝ නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර සම්මාන 10ක්, ජාතික සම්මාන 3ක් සහ ආයතනික සම්මාන 2ක් (රූපසටහන 6)
- ඡායාරූපකරණය සඳහා ආයතනික සම්මාන 1ක්
- හොඳම බහු මාධ්‍යය නිෂ්පාදනය සඳහා ආයතනික සම්මාන 1ක්



රූපසටහන 5: ඉන්දුනීසියාවේ, යොගියකර්තා හිදී 2017 සැප්තැම්බර් 29 වන දින පැවති ආසියානු විවෘත විශ්වවිද්‍යාල සංගමයේ 31 වන වාර්ෂික සම්මේලනයේදී 2017 හොඳම පුහුණුවීම් රිදී සම්මානය



"Tree of Life" සඳහා 1994 හොඳම අධ්‍යාපනික වීඩියෝ වැඩසටහන වෙනුවෙන් UNDA සම්මානය සහ "Knights of the sea" සඳහා 1996 රන් සම්මානය දිනා ගන්නා ලදි. මෙම නිෂ්පාදන 2ම අධ්‍යාපන තාක්ෂණික අංශයේ හිටපු අධ්‍යක්ෂ, ආචාර්ය බුද්ධි වීරසිංහ විසින් තිර රචනය කර අධ්‍යක්ෂණය කරන ලදි.



ගාමිණී එස් අල්ගම මහතා විසින් තිර රචනය හා අධ්‍යක්ෂණය කර දුලීප් සමරසිංහ මහතා විසින් සංස්කරණය කළ "Buds that Bloom" අධ්‍යාපනික වීඩියෝ චිත්‍රපටය නිෂ්පාදනය සඳහා 1996 දෙසැම්බර් මස ජපානයේ ටෝකියෝ නගරයේ පැවති Sony/ICD වීඩියෝ තරඟයේදී (1996) අධ්‍යාපනික වීඩියෝ චිත්‍රපටය සඳහා වන Grand Prix Award සම්මානය දිනා ගන්නා ලදි.

රූපසටහන 6: අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානය විසින් ලබා ගන්නා ලද සම්මාන

තවද, අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් ඡායාරූපකරණය හා සිතුවම් පිළිබඳ විශිෂ්ටත්වයක් දක්වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට දේශීයව හා ජාත්‍යන්තරව ප්‍රසිද්ධියක් ලබා දෙමින් ප්‍රදර්ශන කිහිපයක් සංවිධානය කර ඇත. (රූපසටහන 7)



2007



2014

ශාන්ත ජයලත් මහතා විසින් පවත්වන ලද චිත්‍ර ප්‍රදර්ශනය



2008



2010

දුලීප් සමරසිංහ මහතා විසින් පවත්වන ලද ඡායාරූප ප්‍රදර්ශනය

රූපසටහන 7: අධ්‍යාපන තාක්ෂණික හා මාධ්‍යය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලද ප්‍රදර්ශන

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම සහ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තා වූ ප්‍රමාණයන් කෙරෙහි බලපාන ලෙස ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම කළමනාකාරිත්වය

විසින් සිදු කළ යුතු වේ. නිගමන හා ඇස්තමේන්තුව ඓතිහාසික අත්දැකීම් සහ පවතින තත්ත්වයන් යටතේ සාධාරණ බවට විශ්වාස කරනු ලබන අපේක්ෂාවන් ඇතුළු අනිකුත් සාධක මත පදනම් වේ. ඇස්තමේන්තු සහ පාදක උපකල්පන ඉදිරියට සිදුවන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ.

ගිණුම් ඇස්තමේන්තු සඳහා වන ප්‍රතිශෝධන එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාලපරිච්ඡේදය තුළදී හඳුනාගනු ලබන අතර එසේ සිදු කරනුයේ එම ප්‍රතිශෝධනය එකී කාලපරිච්ඡේදයට සහ වෙනත් කිසියම් අනාගත කාල පරිච්ඡේදයක් සඳහා බලපානු ලබන්නේ නම් පමණි.

මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබූ ගිණුම් තුළ වඩාත්ම සුවිශේෂී බලපෑම් සහිත ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම පිළිබඳ ඉතාම වැදගත් තීරණ සහ අවිනිශ්චිතතා ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් තුළ ඇතුළත් කර ඇත.

4. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දැක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගැළපේ.

4.1 ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනය සඳහා පොදු පහසුකම් ලබාදීම සඳහා දරන ලද වියදම් සහ උපයෝගීතාවයන් ලබාදීමට දරන ලද පිරිවැය ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයෙන් ලැබීමට ඇති දෑ ලෙස ගිණුම්ගත කර ඇත.

4.2 අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර පවත්වාගෙන යනු ලැබූ බාහිර වැඩසටහන් කිහිපයක් හා උපදේශන ව්‍යාපෘති, විශ්වවිද්‍යාල මුද්‍රණාලය සහ උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථානය යටතේ ඇති මාධ්‍ය මැදුර මඟින් ලැබුණු ආදායම එකී ආදායම ලැබුණු කාලපරිච්ඡේදයට අදාළව ගිණුම්ගත කරන ලදී. උපදේශන හා බාහිර සම්පත් මධ්‍යස්ථාන මාර්ගෝපදේශ ප්‍රකාරව, එම මධ්‍යස්ථානයේ අතිරික්තයෙන් කොටසක් යෝග්‍ය සංවර්ධන අරමුදල් වෙත මාරු කර යවනු ලැබ ඇත.

4.3 අධ්‍යාපන දෙපාර්තමේන්තු, පීඨ හා ස්වයං අරමුදල් අධ්‍යයන වැඩසටහන් මධ්‍යස්ථානය (Centre for Self-funded Academic Programmes) (C-SAP) යටතේ ඇති විශ්වවිද්‍යාලයේ අනෙකුත් ආයතන මගින් පවත්වනු ලබන ස්වයං අරමුදල් අධ්‍යයන වැඩසටහන් මගින් ලැබුණු ආදායම, එකී ආදායම ලැබුණු කාලපරිච්ඡේදයට අදාලව ගිණුම්ගත කරන ලදි. (C-SAP) මාර්ගෝපදේශ ප්‍රකාරව C-SAP අතිරික්තයෙන් කොටසක් යෝග්‍ය සංවර්ධන අරමුදල් වෙත මාරු කර යවනු ලැබ ඇත.

4.4 බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝනය කිරීම හේතුවෙන් අයවියයුතු මුදල රුපියල් 61,188,815.54 කි.

4.5 භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන මුල් අවස්ථාවේදී වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ගිණුම් ගත කරන ලද අතර වියදම් කරන ලද මුදල් අනතුරුව වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට මාරු කර යවන ලදී. (සටහන 16)

4.6 දේපළ පිරියත හා උපකරණ

4.6.1 වත්කම් තක්සේරු කිරීම

i. වර්ෂය තුළදී මිලදී ගනු ලැබූ සියලුම වත්කම් මිලදීගත් පිරිවැය මත ආනුෂාංගික වියදම් සමඟ සටහන් කරනු ලැබේ.

ii. විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් මිලදී ගනු ලැබූ දේපළ පිරියත හා උපකරණ වටිනාකම් ව්‍යාපෘති අරමුදල් ගිණුමේ සිට බාහිර ප්‍රදාන මඟින් ප්‍රාග්ධන වියදම් දායකත්ව ගිණුමට මාරු කරන ලදී. (සටහන 17)

iii. පරිත්‍යාග ලෙස ලැබුණු දේපළ, පිරියත හා උපකරණ ප්‍රාග්ධනීකරණය කර අදාළ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ආදායම ලෙස ක්‍රමක්ෂය කරන ලදී. (සටහන 6)

iv. දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැය/ ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම මත දක්වනු ලැබේ. 1995.10.05 දිනැති අංක 649 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛය ප්‍රකාරව වර්ෂයකට පහත සඳහන් අනුපාත මත සෘජු රේඛා ක්‍රමය මත ක්ෂයවීම් ගණනය කරනු ලැබේ.

ගොඩනැඟිලි	05%
ගෘහ භාණ්ඩ	10%
කාර්යාල උපකරණ	20%
පුස්තකාල පොත්	20%
මෝටර් වාහන	20%
විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ	20%
ලෝගු	20%
පිරියත හා යන්ත්‍රෝපකරණ	20%
ක්‍රීඩා භාණ්ඩ	20%

මිලදී ගත් දින සිට ක්ෂයවීම් අය කරනු ලැබේ.

v. ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම විශ්ව විද්‍යාල අභ්‍යන්තර කමිටුව විසින් 2018.12.31 දින වන විට සම්පූර්ණ කරන ලදි. ඒ අනුව, ඉඩම් හා ගොඩනැගිලි 2018.01.01 දිනට ගිණුම් වල ගලපන ලදි.

vi. ඉකුත් වර්ෂයේ ප්‍රත්‍යාගණන අතිරික්තය වත්කම්වල වටිනාකම මත සිදු කරන ලද නිවැරැදි කිරීම්වලට අනුව ගලපන ලදී.

vii. අනුරාධපුර, කුරුණෑගල, අම්පාර හා ගම්පහ ඉඩම් බදු ක්‍රමයට ලබාගෙන ඇත. අනුරාධපුර, අම්පාර ඉඩම්වල වටිනාකම් පිළිවෙලින් රුපියල් මිලියන 39ක් සහ රුපියල් මිලියන 11.55ක් වේ.

viii. කොළඹ, මඩකළපුව හා රත්නපුර (නව ඉඩම), කළුතර, නුවර, මාතර හා කෑගල්ල ඉඩම් නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලයට අයත් වේ. එවැනි ඉඩම්වල ප්‍රත්‍යාගනනය කරන ලද වටිනාකම, ගිණුම්වල ඉඩම් වශයෙන් දක්වා ඇත.

ix. ඉඩම් තක්සේරු කිරීම

- විශ්වවිද්‍යාලයට සතු ඉඩම් සෑම වසර 5කටම වරක් තක්සේරු කිරීම විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්තිය වේ.
- බදු ක්‍රමය යටතේ ඇති ඉඩම් තක්සේරු කර ගිණුම් සඳහා සටහන් ලෙස දක්වා ඇත.
- මූල්‍ය කල්බදු යටතේ ඇති ඉඩම් බදු ඉඩම් ලෙස දක්වා ඇති අතර බදු කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.
- විවෘත විශ්වවිද්‍යාලය සතු නොවන නමුත් අත්පත් කරගෙන ඇති ඉඩම්, ඉඩම් ලෙස ගිණුම්ගත නොකරන ලදි. එම ඉඩම්වල වටිනාකම පහත දක්වා ඇත.

මධ්‍යස්ථානය	ඉඩම් වටිනාකම (රු)
අම්බලන්තොට	4,000,000.00
බණ්ඩාරවෙල	17,000,000.00
ගාල්ල	59,452,000.00
රත්නපුර (පැරණි)	24,525,000.00
යාපනය	62,000,000.00
මොණරාගල	16,000,000.00
පොළොන්නරුව	16,000,000.00
පුත්තලම	4,179,000.00
වවුනියාව	27,900,000.00
කිලිනොච්චිය	17,600,000.00

4.6.2 ඉඩම් ලබා දීම

විශ්වවිද්‍යාලය විසින් සිය 385 වැනි සහා රැස්වීමේදී පර්චස් 15ක බිම් කොටසක් ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයට වෙන් කර දෙන ලදී. තවද සභාව විසින් සිය 408 වැනි රැස්වීමේදී පර්චස් 4.8ක බිම් කොටසක් ඉංග්‍රීසි පශ්චාත් උපාධි ආයතනයට ලබාදෙන ලදී.

4.7 කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන්

කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් වත්කම් උපයෝජනය කිරීම ආරම්භ කරනු ලබන අවස්ථාවේදී අදාළ වත්කම් ගිණුමට මාරු කරනු ලැබේ.

4.8 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායී ජීව කාලය මත පදනම්ව, ඒවා අවිනිශ්චිත/ නිශ්චිත ලෙස හඳුනාගෙන ඇති අතර, එවැනි වත්කම් ඵලදායී ජීව කාලයට ක්‍රමක්ෂය කර ඇත. (සටහන 6.1)

4.9 භාණ්ඩ ලේඛන

යල් පැන ගිය සහ භාවිතයට ගැනීම බහුලව සිදු නොවන භාණ්ඩ සඳහා නියමිත වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අඩුම පිරිවැය සහ ශුද්ධ ප්‍රත්‍යක්ෂ වටිනාකම මත භාණ්ඩ ලේඛන සකසනු ලැබේ.

භාණ්ඩ ලේඛන දැනට පවතින ස්ථානයට හා තත්වයන්ට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් සූත්‍රය යොදා ගනිමින් ගණනය කරනු ලැබේ.

- අමුද්‍රව්‍ය - පළමුව ලැබෙන ද්‍රව්‍ය පළමුව පිට කිරීමේ පදනම මත පිරිවැය තීරණය කරනු ලැබේ.

- නිමි භාණ්ඩ - සෘජු අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය මත.

4.10 ආයෝජන

කල් පිරෙන තෙක් තබා ගෙන ඇති මූල්‍ය ලේඛන යටතේ කෙටි කාලීන ආයෝජන කාණ්ඩගත කර ඇත.

4.11 ලැබිය යුතු දෑ

පසු ගිය අවුරුදු පහ තුළදී සිය ලියාපදිංචිය අලුත් නොකරන ලද ශිෂ්‍යයන් වෙතින් ලැබිය යුතු මුදල් අවලංගු කිරීමේ විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිය අනුව එකී අවුරුදු පහ අවසන් වන වර්තමාන අවුරුද්දේදී එම මුදල් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරන ලදී.

4.12 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සියලුම සේවකයන් තම පළමු සේවා වර්ෂය සම්පූර්ණ කරන ලද වර්ෂයේ සිට ඔවුන්හට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ගිණුම් තුළ සම්පූර්ණ ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කරනු ලැබේ. මෙම ප්‍රතිපාදන සඳහා බාහිර මූල්‍ය සම්පාදනයක් සිදු වන්නේ නැත.

4.13 වගකීම් හා ප්‍රතිපාදන

4.13.1 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලුම දන්නා වගකීම් ගණනයට ලක් කර ඇත.

4.13.2 අධිකරණයේ/කම්කරු විනිශ්චය සභාවේ විභාග වෙමින් පවතින නඩු හා සම්බන්ධ අසම්භාව්‍ය වගකීම් ගණනයට ලක් නොකරන ලදී.

4.13.3 2020 වර්ෂයට අදාළව ගණනය කරන ලද ශිෂ්‍ය ගාස්තු ආපසු ගෙවීම සඳහා වූ ප්‍රතිපාදන 2019 ශිෂ්‍ය ගාස්තු ආදායමට සාමාන්‍ය පරිදි අදාළ විය.

4.13.4 ශිෂ්‍යාධාර අරමුදලට මාරු කර යවන ලද ශිෂ්‍ය ගාස්තුවලින් සියයට 4ක ප්‍රතිපාදනය සමාලෝචන කාලපරිච්ඡේදයට අදාළ වියදමක් ලෙස හඳුනා ගන්නා ලදී.

4.14 ආදායම සහ වියදම

4.14.1 ආදායම හඳුනා ගැනීම

රජයෙන් ලැබෙන ප්‍රදාන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙතින් ලැබෙන ප්‍රදාන. පාඨමාලා ගාස්තු සහ අභ්‍යන්තර මූලාශ්‍රවලින් උපයා ගනු ලබන මුදල් ආදායමට ඇතුළත් වේ. ආයෝජන මත ලැබෙන පොලිය උපචිත පදනම මත ගණනය කරනු ලැබේ. රජයේ ප්‍රදාන ලැබෙන ආකාරය අනුව ගණනය කරන ලදී. ශිෂ්‍යයන් වෙතින් අයකරනු ලබන පාඨමාලා ගාස්තු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 10හි, 19 සහ 20 වගන්ති ප්‍රකාරව අදාළ සේවය ලබාදෙනු ලබන කාලපරිච්ඡේදයට අදාළ සමාලෝචන කාලය තුළ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

4.14.2 වියදම හඳුනා ගැනීම

ව්‍යාපෘති/ භාණ්ඩ ප්‍රකාරව වියදම විශ්ලේෂණය කරනු ලැබ ඇති අතරවිශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ සහ වාර්තා කිරීමේ පොදු ආකෘති පත්‍රය ප්‍රකාරව විවිධ වියදම් ශීර්ෂ යටතේ වියදම වර්ගීකරණය කරනු ලැබ ඇත.

5. ඉකුත් වර්ෂයට අදාළ ගැලපීම් අතීතයට බලපාන ලෙස නැවත ප්‍රකාශ කිරීම

පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම සඳහා අධි වෙන් කිරීම් කරන ලද රු.72,788,667.69 ක මුදල 2019 ගිණුම්වලට ඇතුළත් කර ඇත.

පුස්තකාල පොත් ක්ෂයවීම සඳහා අධි වෙන් කිරීම් කරන ලද රු.1,604,295.72ක මුදල 2019 ගිණුම්වලට ඇතුළත් කර ඇත.

ගොඩනැගිලි ක්ෂයවීම සඳහා ඌණ වෙන් කිරීම් කරන ලද රු.673,043.48ක මුදල 2019 ගිණුම්වලට ඇතුළත් කර ඇත.

රු.900.00ක් වූ නැවත ලැබුණු, කපා හරින ලද උත්සව අත්තිකාරම් මුදල පොදු සංචිත ගිණුමට මාරු කරන ලදි.

2019 අවසන් ගිණුම් නැවත ප්‍රකාශ කිරීම පහත දැක්වෙන පරිදි සාරාංශගත කර ඇත.

5.1 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

විස්තරය	මුදල (රුපියල්)
2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හිඟය	**(528,714,821.80)**
එකතු කළා: වැරදි අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීම	
අධි වෙන් කිරීම් - පුස්තකාල පොත්	1,604,295.72
	(527,110,526.08)
අඩු කළා : පරිත්‍යාග ක්‍රමක්ෂය අධි වෙන් කිරීම්	72,788,667.69
උාණ වෙන් කිරීම් - ගොඩනැගිලි	673,043.48
2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නැවත ප්‍රකාශ කරන ලද හිඟය	**(600,572,237.25)**

5.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශන

	2019/12/31 දිනට ශේෂය	පෙර වසර සඳහා වූ ගැලපීම	2019/12/31 දිනට නැවත ප්‍රකාශිත ශේෂය
දේපළ, පිරියත සහ උපකරණ			
ඉඩම්	10,860,077,500.00	248,656,000.00	11,108,733,500.00
වෙනත් දේපළ, පිරියත සහ උපකරණ	4,335,058,592.00		4,335,058,592.00
	15,195,136,092		**15,195,136,092**
ක්ෂයවීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන			
ගොඩනැගිලි	288,166,008.27	673,043.48	288,839,051.75
පුස්තකාල පොත්	212,417,257.66	(1,604,295.72)	210,812,961.94
වෙනත් දේපළ, පිරියත හා උපකරණ	367,620,686.69		367,620,686.69
	868,203,952.62		**867,272,700.38**
පරිත්‍යාග	627,172,169.93	72,788,667.69	**11,108,733,750.00**

❖ **ඉංග්‍රීසි පිටපතේ අත්සන යොදා ඇත.**

9.6 අයවැය හා තත්‍ය මුදල් සංසන්දනය කිරීම පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අවසාන ගිණුම් - 2020

විස්තරය	අයවැයගත මුදල		තථ්‍ය මුදල (රු.)	අවසාන අයවැය හා තථ්‍ය මුදල අතර වෙනස (රු.)
	මුල් (රු.)	අවසාන (රු.)		
ආදායම				
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	1, 740,000,000.00	1,920,000,000.00	1,920,000,000.00	-
ආයෝජන සඳහා පොලිය	118,000,000.00	118,000,000.00	40,531,325.81	(77,468,674.19)
ණය සහ අත්තිකාරම්වලින් පොලිය	5,000,000.00	5,000,000.00	3,458,171.68	(1,541,828.32)
ලියාපදිංචි ගාස්තු	20,000,000.00	20,000,000.00	7,560,100.00	(12,439,900.00)
සිසුන්ගෙන් ලැබෙන ආදායම	1,300,000,000.00	1,300,000,000.00	739,787,584.45	(560,212,415.55)
විභාග ගාස්තු/ සහතික පත්‍ර ගාස්තු	6,000,000.00	6,000,000.00	4,332,169.61	(1,667.830.39)
පුස්තකාල දඩ	800,000.00	800,000.00	91,770.00	(708,230.00)
නේවාසික ගාස්තු	4,000,000.00	4,000,000,00	504,350.00	(3,495,650.00)
ප්‍රකාශන/අයදුම්පත්‍ර අලෙවි කිරීම	40,000,000.00	40,000,000.00	50,422,798.00	10,422,798.10
දේපළවලින් ලැබෙන කුලිය/ වාහන කුලියට දීම	6,000,000.00	6,000,000.00	2,891, 988.66	(3,108,011.34)
විවිධ හා වෙනත් ආදායම්	104,000,000.00	104,000,000.00	85,662,959.32	(18,337,040.68)
මුළු ආදායම	**3,343,800,000.00**	**3,523,800,000.00**	**2,855,243,217.63**	**(668,556,782.37)**
වියදම				
පුද්ගලික වැටුප්	2,687,610,000.00	2,400,750,000.00	2,575,717,511.26	174, 967,511.26
ගමන් හා යැපීම්	8,100, 000.00	2,500,000.00	2,004,100.01	(495,899.99)
සැපයුම්	67,590,000.00	35,700,000.00	32,994,863.14	(2,705,136.86)
නඩත්තු සේවා	73,530,000.00	28,900,000.00	30,530,747.23	1,630,747.23
කොන්ත්‍රාත් සේවා	372,390,000.00	264,775,000.00	316,718,129.83	51,943,129.83
වෙනත් පුනරාවර්තන වියදම්	190,710,000.00	135,300,000.00	166,291,568.54	30,991,568.54
මුළු වියදම	**3,399,930,000.00**	**2,867,925,000.00**	**3,124,256,920.01**	**256,331,920.01**

❖ ඉංග්‍රීසි පිටපතේ අත්සන යොදා ඇත.

9.7 ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කිරීම

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ස්වභාවය අනුව වියදම් වර්ගීකරණය කිරීම (සංශෝධිත)

මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ	(රු) 2020	(රු) 2019 (නැවත සඳහන් කරන ලද)	2019.12.31 (රු) විගණනය කළ
පුනරාවර්තන ප්‍රදාන	1,920,000,000	1,600,000,000	1,600,000,000
පර්යේෂණ ප්‍රාග්ධන ප්‍රදාන	-	9,000,000	9,000,000
පරිත්‍යාග ක්‍රමක්ෂය	81,752,918	48,628,070	121,416,738
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	80,328,867	82,823,152	82,823,152
වෙනත් ආදායම්	883,885,954	1,381,713,880	1,381,713,880
වෙනත් අරමුදල්	33,907,723	17,897,924	17,897,924
මුළු මෙහෙයුම් ආදායම	2,999,875,461	3,140,063,026	3,212,851,693
මෙහෙයුම් වියදම්			
පුද්ගලික චේතන	2,575,717,511	2,702,299,986	2,702,299,986
ප්‍රවාහන	2,004,100	10,070,907	10,070,907
සැපයුම් සහ පාවිච්චි කරන ලද පාරිභෝගික ද්‍රව්‍ය	32,994,863	52,042,740	52,042,740
නඩත්තු	30,530,747	34,488,086	34,488,086
කොන්ත්‍රාත් සේවාවන්	316,718,130	341,998,119	341,998,119
පර්යේෂණ හා සංවර්ධන	4,360,141	18,188,262	18,188,262
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	417,440,219	347,404,842	348,336,094
වෙනත් මෙහෙයුම් වියදම්	167,560,604	232,095,880	232,095,880
මුළු මෙහෙයුම් වියදම	**3,547,326,316**	**3,738,588,822**	**3,739,520,074**
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/හිඟය	(547,450,855)	(598,525,796)	(526,668,381)
මූල්‍ය පිරිවැය	(1,555,230)	(2,046,440)	(2,046,440)
දේපළ පිරියත හා උපකරණ අලෙවිය මත අලාභය	-	-	-
මුළු මෙහෙයුම් නොවන ආදායම / (වියදම)	(549,006,085)	(600,572,237)	(528,714,821)
අතිරේක සාමාන්‍ය භාණ්ඩවලට පෙර ශුද්ධ අතිරික්තය/හිඟය	-	-	-
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ හිඟය	**(549,006,085)**	**(600,572,237)**	**(528,714,821)**

❖ ඉංග්‍රීසි පිටපතේ අත්සන යොදා ඇත.

9.8 පසුගිය වර්ෂ පහ තුළ මුල්‍යමය ලෙස වැදගත් සිදුවීම්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පසුගිය වර්ෂ පහ තුළ මුල්‍යමය ලෙස වැදගත් සිදුවීම්

විස්තරය	2016	2017	2018 (නැවත සඳහන් කරන ලද)	2019 (නැවත සඳහන් කරන ලද)	2020
ආදායම					
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන	1,000,000,000	1,112,575,000	1,320,000,000	1,600,000,000	1,920,000,000
පර්යේෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	5,811,159	15,666,226	9,425,000	9,000,000	-
ආයෝජන සඳහා පොලිය	71,304,546	108,059,176	113,333,807	93,743,600	40,531,326
ණය සහ අත්තිකාරම්වලින් පොලිය	2,497,350	2,660,334	3,299,244	3,376,124	3,458,172
දේපළවලින් ලැබෙන කුලිය	2,375,084	3,164,540	3,000,399	1,953,813	2,827,241
පැරණි ගබඩා අලෙවිය	-	351,087	1,973,022	783,820	4,100
විවිධ ලැබීම්	3,962,748	9,122,597	11,176,486	12,540,349	11,914,685
ලියාපදිංචි ගාස්තු	9,265,112	22,312,098	4,256,403	25,354,799	7,560,100
ඉගැන්වීම් ගාස්තු	812,814,777	1,201,227,143	812,508,895	1,214,557,500	739,787,584
විභාග ගාස්තු	2,243,569	4,305,118	1,696,349	4,754,172	4,332,170
ප්‍රකාශන/අයදුම්පත්‍ර අලෙවි කිරීම	19,636,985	26,998,669	27,612,887	14,199,170	50,422,798
පුස්තකාල දඩ	355,158	437,290	325,840	280,520	91,770
පරිපුරක ගාස්තු	-	3,490	3,500	3,500	-
නේවාසික ගාස්තු	1,081,250	2,125,375	1,546,050	1,633,500	504,350
කෙටි පාඨමාලා වලින් හා වෙනත් මූලාශ්‍රවලින් ලැබෙන ආදායම	45,709,739	75,891,900	46,000,262	29,136,288	51,397,032
වාහන කුලියට දීම	185,774	129,395	245,977	105,674	64,747
බැඳුම්කර උල්ලංඝනය කිරීමට අදාළව ලැබුණු ආදායම	7,877,124	4,653,994	5,227,117	8,427,337	22,386,910
ආධාර ක්‍රමක්ෂය කිරීම හා ප්‍රාග්ධන වියදම්	104,936,893	117,931,706	117,488,957	121,416,738	81,752,918
වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	69,939,331	80,944,065	79,925,309	82,823,152	80,328,867
මුළු එකතුව	**2,159,996,599**	**2,788,559,203**	**2,559,045,504**	**3,224,090,058**	**3,017,364,771**
වියදම					
සාමාන්‍ය පරිපාලන සහ කාර්ය මණ්ඩල සේවා	341,109,247	395,422,569	460,931,733	459,503,554	415,057,866

එකතු කළා : ක්ෂයවීම්	332,832,878	381,834,830	310,819,599	345,022,489	381,587,113
	673,942,125	**777,257,399**	**771,751,332**	**804,526,043**	**796,644,979**
ලැබිය යුතු මුදල් නොලැබීම් (ශිෂ්‍ය)	24,652,058	28,380,797	31,229,282	37,827,384	40,655,161
අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	-	-	14,294,118	2,382,353	2,382,353
ලැබිය යුතු මුදල් නොලැබීම (කාර්ය මණ්ඩල)	-	-	-	-	-
විනිමය අනුපාත වෙනස	-	-	-	11,706	
අධ්‍යයන සේවා	1,393,854,130	1,593,463,800	1,792,238,763	2,540,839,811	2,397,981,360
ඉගැන්වීම් සම්පත්	90,939,938	97,029,215	120,022,702	158,260,681	146,332,728
සෞඛ්‍ය සේවා	3,720,469	4,711,877	5,095,028	5,510,585	6,220,381
ඉඩම් හා ගොඩනැඟිලි නඩත්තුව	45,505,461	47,119,843	55,210,179	66,606,729	60,435,254
අනුෂාංගික කටයුතු	77,260,411	92,073,948	106,647,186	124,669,971	98,229,330
මුළු එකතුව	**2,309,874,592**	**2,640,036,879**	**2,896,488,590**	**3,740,635,263**	**3,548,881,546**

10 කොටස - විගණන වාර්තා

10.0 විගණන වාර්තා

10.1 විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/OU/FA/01/2020/16
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 දෙසැම්බර් 15 දින

17 DEC 2021

Registrar
The Open University of Sri Lanka

උපකුලපති,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

Registrar
For your reference.
17/12/2021

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :-
01. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම්- මුදල් අමාත්‍යාංශය
03. සභාපති- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

copy-
AIA

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/F/OU/FA/01/2020/16 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 දෙසැම්බර් 15 දින

උපකුලපති,
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

+94 11 2 88 70 28 34 | +94 11 2 88 72 23 | auditoffice@oyrnet.pro.lk | www.naod.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනයෙහි පිරිවැය රු.182,594,766 ක් වූ තොගය තුළ ඇතුළත් හානි වූ හා ගාටිතයෙන් ඉවත්කළ පිරිවැය රු.25,072,505 ක් වූ තොගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව ශිෂ්‍ය පාලන ගිණුමේ ශේෂය හා හඳුනාතොගත් ශිෂ්‍ය ආදායම ගිණුමේ ශේෂය අතර රු. 302,544,894 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය අනුව ලියාපදිංචිය අලුත් නොකර වර්ෂ 05 ඉක්මවූ ශිෂ්‍යයින්ගෙන් ලැබිය යුතු ශිෂ්‍ය ආදායම සෑම වසරකදීම ආදායමට එරෙහිව කපාහරින බව සඳහන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී වර්ෂ 5 ඉක්ම වූ ශිෂ්‍යයින්ගෙන් ලැබිය යුතු රු.40,655,161 ක ශිෂ්‍ය ආදායම කපා හැරීම සිදුකර තිබුණද ඒ සඳහා අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) ගෙවීම් වවුචරයක්, ලදුපතක් හෝ ජර්නල් වවුචරයක් මඟින් ලෙජර ගිණුමකට හර හෝ බැර සටහන් යෙදිය යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ OMIS පරිගණක පද්ධතියේ පැවති අඩුපාඩු හේතුවෙන් ක්ෂය ගිණුම් හා ක්ෂය වෙන්කිරීමේ ගිණුම් වලට Day end process transaction ලෙස පරිගණක ගිණුම් පද්ධතිය තුළින් සටහන් යෙදීම් සිදුවී නිබුණි. එලෙස ලෙජර ගිණුම්වලට සටහන් වී නිබුණු නමුත් නිවැරදි නොවුණු රු.25,692,337ක් වර්ෂය අවසානයේදී ජර්නල් සටහන් යොදා ක්ෂය ගිණුම් හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම් වලින් ඉවත් කර තිබුණි. තවද වැටුප්, තොග, වත්කම් යනාදී ලෙජර ගිණුම්වලටද මූලාශ්‍ර ලේඛන නොමැතිව, Day end process transaction ලෙස අගයන් සටහන් වී නිබුණු බවද නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මෙ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංගයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්ව මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කෑමී හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම, වියදම, වත්කම හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වෙතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ

අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබාධිත පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා යාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	(i) 2018, 2019 හා 2020 වර්ෂවලදී පිළිවෙලින් රු.19,517,405 ක්, රු.2,637,980 ක් හා රු. 2,891,380 ක් වූ හානි වූ පොත් තොග කපාහැරීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලයේ අනුමැතිය මත පමණක් කපාහැරීම් සිදුකර තිබුණි. තවද, තොග ඌනතා, අතිරික්තා සම්බන්ධයෙන්ද ආරම්භයේ සිටම මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. (ii) 2018 වර්ෂයේ ගාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පැවති වෙනස්කම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීම සඳහා උපකුලපතිතුමා විසින් මූලික විමර්ශණ මණ්ඩල දෙකක් පත්කර තිබුණද, 2021 අගෝස්තු මාසය වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු නිමකර නොතිබුණි.
(ii)	මුදල්රෙගුලාසි 394(ඇ)	වර්ෂ 08 ක සිට පැවතෙන අවලංගු චෙක්පත් කැන්පතු ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට රු.1,232,629ක් වූ ශේෂය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii)	මුදල්රෙගුලාසි 756	2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්, තවදුරටත් ගාවිතා කරනු ලබන පිරිවැය රු.181,639,603ක් වූ පුස්තකාල පොත්පත් ගාණ්ඩ සම්ක්ෂණයට ලක්කර නොතිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා ඇති රු.182,594,766 ක් වූ තොග ගණනය කිරීමේදී මුදුණාලයේ පැවති නොනිමි තොගය හා සියලුම ඒකකයන්ගේ තොග භෞතික සම්ක්ෂණයට ලක් කිරීම සිදුකර නොතිබුණි.
(ආ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන ගාණ්ඩාගාර වක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් රු.14,424,847,934 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සහ රු.18,968,248ක් වූ අස්පෘශ්‍ය වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කර නොතිබුණි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 354 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම ඝනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,601,385,340 ක් ගෙවා තිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීරිඩ්/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් 2020 දෙසැම්බර් 31 දින වන විට රු.94,679,223 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ ගැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ, අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ගාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන ප්‍රාදේශීය මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන 19 ක සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.584,909,510ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණද, එම ඉඩමගි නීත්‍යානුකූල අයිතිය විශ්වවිද්‍යාලයට ලබා ගැනීම සඳහා 2021 ජූලි 10 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 1992 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සේවය අත්හිටුවීම, සේවය අවසන් කිරීම, සේවයෙන් ඉවත් කිරීම, සේවය අතහැරයාම, වැඩ තහනම් කිරීම හා විශ්‍රාම යාම වැනි කරුණු හේතුවෙන් නිළධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.850,958ක් අයකර ගැනීම සඳහා 2021 අගෝස්තු මාසය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ බැදුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු. 19,884,652 ක මුදලින් කිසිදු මුදලක් ගිවිසුම් කඩකළ දින සිට විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි. නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,942,969 ක බැදුම්කර වට්නාකම් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව 2016 වර්ෂයේ සිට දිගින් දිගටම විගණනය වෙත දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර ද නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල 05 ක් ලෙස ස්ථාපනය කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (OMIS) පවතින අඩුපාඩු නිරාකරණය කිරීමට අදාළ නඩත්තු සමාගම්වලට නොහැකි වී තිබුණි. එම නිසා පවතින තොරතුරු පද්ධතියට වඩා කාර්යක්ෂම සහ විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස තොරතුරු තාක්ෂණ අංශය මගින් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරවා ගැනීමට විශ්වවිද්‍යාලය අධිකාරය යොමු කර ඇති බව උපකුලපතිවරයා විසින් දන්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ අඩුපාඩු නිවැරදි කර ගැනීමට හෝ නව තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරවා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.ඒ.සී.වික්‍රමරත්න
විගණකාධිපති

10.2 පිළිතුරු වාර්තාව

මගේ අංකය
எமது இல.
My No.
VV/AC/A.R./ 2020

ඔබේ අංකය
உமது இல.
Your No.
HED/F//OU/FA/01/2020/16

දුරකථනය
தொலைபேசி
Telephone
853615
853777
856281
856282

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
இலங்கைத் திறந்த பல்கலைக்கழகம்
THE OPEN UNIVERSITY OF SRI LANKA

තැපැල් පෙට්ටිය 21
නාවල
නුගේගොඩ
அஞ்சற் பெட்டி 21
நாவல
நுகேகொட
Post Office Box 21
Nawala
Nugegoda

2021 ජනවාරි 20

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) භාවිතයෙන් ඉවත් කරන ලද තොගය නිවැරදිව ගිණුම්ගත කිරීමට 2021 මූල්‍ය වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ.

(ආ) ශිෂ්‍ය ආදායමට අදාල සියළු ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම ශිෂ්‍ය පාලන ගිණුම් හරහා සිදුකරනු ලබයි. ශිෂ්‍යයන් විසින් බැංකුව හරහා සිදුකරනු ලබන තැන්පතු OMIS පරිගණක පද්ධතියට ඇතුලත් කිරීමේදී පළමුව හඳුනා නොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමට බැර කරනු ලබයි. ඉන්පසුව එම ගිණුම හර කර ශිෂ්‍ය පාලන ගිණුම් හරහා එක් එක් ශිෂ්‍යයාගේ ගිණුමට වෙන් වෙන්ව බැර කරනු ලබයි. ඒ අනුව එක් එක් ශිෂ්‍යයාව නිවැරදිව හඳුනාගන්නා තුරු ශිෂ්‍යයන්ගෙන් රැස්කරන ලද මුදල් තාවකාලිකව සටහන් කර තබන ලෙජර් ගිණුම් හඳුනා නොගත් ශිෂ්‍ය ආදායම් ගිණුම් ලෙස නම් කර ඇත. නමුත් මෙම ගිණුමේ සඳහන් ලැබීම් ශිෂ්‍යයන්ගෙන් ලද ආදායමක් වන බැවින් වර්ෂ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී ලැබිය යුතු ශිෂ්‍ය ආදායමින් එම ගිණුමේ ශේෂය අඩුකර ගිණුම්ගත කරනු ලැබේ.

(ඇ) 2014 වර්ෂයේ සිට ලියාපදිංචිය අලුත් නොකර වර්ෂ 5 ඉක්මවූ ශිෂ්‍ය ලැබීම් සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැරීමට මුදල් මණ්ඩලය හරහා 405 වෙනි පාලක සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී. මෙය මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 4.11 යටතේ ද දක්වා ඇත.

ඒ අනුව, විශ්වවිද්‍යාලය 2020 වසරේදී ලියාපදිංචිය අලුත් නොකල වර්ෂ 05 ක් ඉක්මවූ ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු මුදල වූ රු. 40,655,161.00 ක් කපා හැරීමට කටයුතු කරන ලදී.

(ඇ) OMIS පද්ධතියේ වත්කම් ලේඛනය වර්ෂ කිහිපයක් නිවැරදිව යාවත්කාලීන නොවූ බව නිරීක්ෂණය වූ අතර, එම පද්ධතිය තුල පවතින සීමාවන් හේතුවෙන් එය පසුව නිවැරදි කිරීමට ද නොහැකි විය. එම නිසා පරිගණක පද්ධතිය මඟින් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව සිදු නොවේ.

ඒ අනුව පරිගණක පද්ධතිය මඟින් ලබා දෙන ක්ෂය ගණනය කිරීම් ජනල් සටහන් මඟින් ඉවත්කර, නිවැරදිව ගණනය කරන ලද වාර්ෂික ක්ෂය අගය ජ'නල් සටහන් මඟින් පරිගණක පද්ධතියට ඇතුලක් කිරීම සිදුකරයි.

වැටුප් සඳහා වන පරිගණක පද්ධතිය (Payroll System) හා ඉන්වෙන්ට්‍රි මොඩියුලය මඟින් සෘජුව සිදුකරනු ලබන මාරුකිරීම් (Day end Process Transaction) ලෙස සටහන් වී ඇත. නමුත් වැටුප්, තොග හා වත්කම්වලට අදාල මූලාග්‍ර ලියවිලි ගිණුම් අංශය සතුව පවතින බැවින් විගණනයට අවශ්‍ය නම් එම තොරතුරු ලබා දිය හැකිය.

1.3 විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන් වගකීම්

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

---

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1

2.1.1

2.1.2

2.1.3

2.2

2.2.1

2.2.2

	නීතිරීති/ විධානයට යොමුව	විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මූදල් රෙගුලාසි සංග්‍රහයේ 102, 103, 104 හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛය	(i)ශිෂ්‍යයන් වෙත අධ්‍යයන කටයුතු වෙනුවෙන් බෙදා හැරීමට මුද්‍රණය කරන ලද පොත් විෂය නිර්දේශයන් වෙනස්වීම්, අන්තර්ගත කරුණු කාලයට අනුව යල්පැනීම ආදී කරුණු හේතුවෙන් ඉවත් කිරීමට සිදුවේ. මෙම පොත් හානිවූ තොග ලෙස සැලකිය නොහැක. එමනිසා, එසේ ඉවත් කරන ලද පොත් තොග විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැති මත ගබඩාවලින් ඉවත් කිරීමට කටයුතු කර ඇත. (ii) 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව පැවති වෙනස්කම් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීම සඳහා උපකුලපතිතුමා විසින් මූලික විමර්ශන මණ්ඩල දෙකක් පත් කරනු ලැබූ අතර එම වෙනස්කම් පැවති අංශ වනුයේ තොරතුරු තාක්ෂණ අංශය, භාෂා අධ්‍යයන අංශය හා විභාග අංශය යන අංශයන්ය. මෙම විමර්ශන මණ්ඩලවලට පත්කල පරිපාලන නිලධාරීන් වෙනත් විශ්වවිද්‍යාල වෙත අභ්‍යන්තර ස්ථාන මාරු ලැබීම හේතුවෙන් එම විමර්ශන මණ්ඩල සඳහා නැවත නිලධාරීන් පත් කිරීමට සිදුවූ අතර 2020/2021 වසර තුලදී කෝවිඩ් වසංගතය හේතුවෙන් විශ්වවිද්‍යාලයේ කටයුතුවල ප්‍රමාදවීම් සිදුවිය. නමුත් මේ වනවිට එම විමර්ශන වාර්තා ලැබී ඇති අතර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී.
(ii)	මූදල් රෙගුලාසි 394 (ඇ)	අවලංගු වෙක්පත් තැන්පතු ශේෂය විශ්වවිද්‍යාල ආදායමට ගැනීමට 2021 වසරේදී කටයුතු කර ඇත.
(iii)	මූදල් රෙගුලාසි 756	පුස්තකාල පොත් සංඛ්‍යාව හෞතිකව ගණනය කර ඇතත් එම පොත්වල වටිනාකම ගණනය කිරීමේ කටයුතු 2020 වර්ෂය අවසන් වන විටත් නිම කිරීමට නොහැකි වූ බැවින් ගිණුම්වල හෙළිදරව් කිරීමට නොහැකි විය.

(අ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ස්ථාවර වත්කම් සඳහා වූ පරිගණක ගත පද්ධතියේ පවතින අඩුපාඩු හේතුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමේ ගැටළු මතුවී ඇත. විශ්වවිද්‍යාලය විසින් ස්ථාපනය කරනු ලබන නව පරිගණක පද්ධතිය මඟින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට අදහස් කර ඇති අතර, එම පද්ධතිය මඟින් ස්ථාවර වත්කම් ලේඛනයේ දුර්වලතා මහහරවා ගැනීමට හැකිවේ යන්න අපගේ බලාපොරොත්තුවයි.
(ඇ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	අධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩ නියමාවලියට (Work norm) අනුකූලව අධ්‍යයන අංශ ප්‍රධාන සහ පීඨාධිපතිගේ අධීක්ෂණය යටතේ තම කාලසටහනට අනුව අධ්‍යයන කාර්යයන් කිරීම සිදු කරයි. ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන සලසා නිබුණද, අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සටහන් කරනු නොලැබේ. මෙය මෙම විශ්ව විද්‍යාලයේ පමණක් නොව සෑම විශ්ව විද්‍යාලයකම සිදුවන බව විමසා බැලීමේදී දැන ගත හැක.
(ඇ)	2003 ජූනි දිනැති අංක: පීපීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛනයේ 8.2.2. වගන්තිය	2020 වර්ෂයේදී කිසිදු කෙටිකාලීන ආයෝජනයක් සිදු කර නොමැත. රු. 670,222,783 ක මුදල එක් වර්ෂයක ආයෝජනයක් නොවන අතර වර්ෂ ගණනාවක ආයෝජනයන්හි එකතුවකි. මෙහිදී Generated Fund වල ආයෝජනය වන රු. 251,886,511 සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමේ ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත. භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීනව ආයෝජනය කිරීම ප්‍රමාද කල නොහැකි බැවින් භාණ්ඩාගාර නිළධාරීන්ගේ උපදෙස් මත ස්ථාවර තැන්පත්වල ආයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලීමේ ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇත.

2.2.3

2.2.4

2.3 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳිනු ලබන ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන වල මෙතෙක් නීත්‍යානුකූල ගිම්කම් ලබා නොමැති ඉඩම් සම්බන්ධයෙන් වර්තමාන තත්වය විමසීම සඳහා 2020.09.07 දින උපකුලපති තුමා ඇතුළු නිළධාරී මණ්ඩලය හා ඉඩම් කොමසාරිස් ජනරාල්තුමිය (එවක සිටි) ඇතුළු එම දෙපාර්තමේන්තුවේ නිළධාරී මණ්ඩලය සමඟ විශේෂ සාකච්ඡාවක් ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයේ දී පවත්වන ලදී. එම සාකච්ඡාවේදී, විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කරනු ලබන මෙතෙක් නීත්‍යානුකූල ගිම්කම් නොලද සියලු ඉඩම් විශ්වවිද්‍යාලය වෙත පවරා දීම සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 6 (I) වගන්තිය ප්‍රකාරව විශේෂ බදු ක්‍රමයකට යටත්ව අධ්‍යාපන අමාත්‍යාංශයේ කැබිනට් අනුමැතියක් මඟින් විශ්වවිද්‍යාලය වෙත පවරා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල්තුමිය එකඟ විය.

ඒ අනුව කැබිනට් පත්‍රිකාව පිළියෙල කිරීමේ මූලික පියවර වශයෙන් විශ්වවිද්‍යාලය විසින් නීත්‍යානුකූල ගිම්කම් ලබා නොමැති ඉඩම් කැබලි 25 ක ප්‍රමාණයක විස්තර හා අදාළ ලිපිලේඛන රේඛීය අමාත්‍යාංශය වෙත 2020.12.22 යොමු කරනු ලැබූ අතර විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳින ලබන ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරා දීමට අදාළ කැබිනට් පත්‍රිකාව පිළියෙල කිරීමේ ප්‍රගතිය සම්බන්ධව පසුවිපරම් නොකඩවා සිදු කරන ලදී.

ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් භුක්තිවිඳිනු ලබන එකී ඉඩම් කැබලි විසිපහෙන් (25) දාහතක (17) අයිතිය විශ්වවිද්‍යාලය වෙත ලබා ගැනීමේ යෝජනාව කැබිනට් මණ්ඩල අනුමැති සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යොමු කරනු ලැබිය. 2021/07/19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එම ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා දීමට අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවූ අතර ඉඩම් කොමසාරිස් ජනරාල් මඟින් අදාළ ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට අවශ්‍ය වන කටයුතු සිදුවීමට නියමිත අතර ඊට අදාළ පසුවිපරම් සිදුකරනු ලැබේ.

එසේම විශ්වවිද්‍යාලය විසින් භුක්ති විඳිනු ලබන අනෙකුත් ඉඩම් ද විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් සිදු කෙරෙමින් පවතී.

(ආ) අය නොවූ ණය ශේෂයන්ගෙන් රු. 174,406.00 මුදලක් අදාල පුද්ගලයාගේ අර්ථසාධක අරමුදලින් අඩුකර විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත.

රු. 147,790.00 ණය ශේෂයන් අයකර ගැනීමට අදාල පුද්ගලයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇත. රු. 380,972.00 ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අදාල පුද්ගලයන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා අප වෙත ලැබී නොමැති අතර, එම පත්‍රිකා ලැබුණු පසු ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී එම ණය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) (1) **ජේ.ඒ.එස්.ඩී. සේතුංග**

වර්තමාන ලිපිනය සොයා ගන්නා ලද අතර ගෙවීමට ඇති මුදල පිළිබඳව දැනුම් දෙන ලදී. ඊට පිළිතුරු වශයෙන් නීතිඥයකු මඟින් තමා එගකිම භාර නොගන්නා බව දන්වා ඇත. නඩු පැවරීමේ කාලාවරෝධනය මීට වසර බොහෝ ගණකට පෙර අවසන්ව ඇති බැවින් නඩු පැවරිය නොහැක. එහෙත් ඇයගේ අර්ථසාධක අරමුදලේ ඇය විසින් ගෙවිය යුතු මුදලට වඩා වැඩි ශේෂයක් ඇති බැවින් එම්ගින්

මෙම මුදල අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ කටයුතු කිරීමට නියමිතව ඇත.

(i) එච්.කේ.ඩී.ඒ.ටී.එන්.අන්නක්කගේ
(ii) එම්.කේ.එම්.පී.සී.රාජපක්ෂ
(iv) එස්.දළුවත්ත
(v) පී. සමරනායක
(vi) වී.ජී.එස්. ඒකනායක
(vii) ඩබ්ලිව්. එස්. ටී. ෆොන්සේකා

මුල් ණය කරුවන්ගේ හා ඇපකරුවන් ගේ ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා නඩු පැවරීමට හා ගිවිසුම් වටිනාකම අය කර ගැනීමට නොහැකි වී ඇත.

මෙම නිලධාරීන්ගේ හා ඔවුන්ගේ ඇපකරුවන් ගේ වර්තමාන ලිපිනයන් වෙනත් මූලාශ්‍රයන් මගින් සොයා ගැනීමේ උත්සාහය, මෙතෙක් සාර්ථක නොවුණු බව සඳහන් කරමි. ඒ සඳහා හැකි සෑම උත්සාහයක් ම ගැනීමට කටයුතු කරන බවද දන්වමි.

(viii) ඒ.ඒ.සී. කාංචනා

මුල් ණයකරු හා ඇපකරුවන්ට එරෙහිව 2019.07.11 දින නඩු දෙකක් පවරා ඇත. (නඩු.අංක M/3489/19 හා M/4490/19). ඒකපාර්ශ්වික නඩු තීන්දුවක් දීමේ තීරණය 2021.03.05 ලැබී ඇත. එම ලියකියවිලි නීතිපති දෙපාර්තමෙන්තුව වෙත යොමු කර ඇත. විදේශ අමාත්‍යාංශය මගින් එන්තරවාසි යවා ඇත. එන්තරවාසි නැවත ගරවා එවීමේ දිනය 2021.08.24 වේ.

ඇයගේ අර්ථසාධක අරමුදලේ ඇති ශේෂය වූ රු.2,403,150.24 මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2020.09.15 දින යවා ඇත. ඒ අනුව ගිවිසුමේ වටිනාකම අඩුකර විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කරනු ඇත.

(ix) එස්.යූ. මුණසිංහ

ඔහුගෙන් අයවිය යුතු මුදල වන රු. 293, 680.00 මුදල් අර්ථසාධක අරමුදලේ ශේෂයෙන් (රු.464,871.05) අඩුකර ගැනීමට අවශ්‍ය ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2020.09.22 දින යවා ඇත. ඒ අනුව ගිවිසුමේ වටිනාකම අඩුකර එම මුදල් විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කරනු ඇත.

(x) යූ.ජී. ජයසේකර

2014.04.30 දින ගල්කිස්ස දිස්ත්‍රික් උසාවියේ නඩු පවරා ඇත. නඩු අංකය 7362/14/M. විශ්වවිද්‍යාලයට වාසිදායක වන පරිදි 2019.12.19 දින තීන්දුව ලබා දී ඇත. එහෙත් ඔහු විසින් එම තීන්දුවට එරෙහිව අභියාචනයක් ගල්කිස්ස සිවිල් අභියාචනාධිකරණයේ ගොනුකර අත. මෙතෙක් එම අභියාචනය විභාග කිරීමට දිනයක් නියම කොට නැත.

(xi) ජේ.සී.ඩී. පිරිතිවිරාජ්

මුල් ණයකරු හා ඇපකරුවන්ට එරෙහිව 2021.05.20 දින නඩු දෙකක් පවරා ඇත. (නඩු.අංක M/4412/21 හා M/4413/21). නඩම විභාගයට ගැනීමට දින නියම කර නැත. ඔහුගේ අර්ථ සාධක අරමුදලේ ශේෂය අඩුකර ගැනීමට ද කටයුතු කර ඇත.

(2) අර්ථසාධක අරමුදලේ ඇති ශේෂය අඩුකර ගැනීම

(i) ඒ.ඒ.සී. කාංචනා

ඇයගේ අර්ථසාධක අරමුදලේ ඇති ශේෂය වූ රු.2,403,150.24 මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2020.09.15 දින යවා ඇත. ඒ අනුව ගිවිසුමේ වටිනාකම අඩුකර විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කරනු ඇත.

(ii) එස්.යූ. මුණසිංහ

ඔහුගෙන් අයවිය යුතු මුදල වන රු. 293, 680.00 මුදල අර්ථසාධක අරමුදලේ ශේෂයෙන් (රු.464, 871.05) අඩුකර ගැනීමට අවශ්‍ය ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2020.09.22 දින යවා ඇත. ඒ අනුව ගිවිසුමේ වටිනාකම අඩුකර එම මුදල විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කරනු ඇත.

(iii) ඩබ්ලිව්.එම්.ඒ.ඩී.සී. ප්‍රනාන්දු

බැදුම්කරයේ ඉතිරි වටිනාකම වූ රු.784,450.64 ක මුදල ඇයගේ අර්ථසාධක අරමුදලේ ශේෂයෙන් (රු. 1,465, 899.82) අයකර ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2020.08.28 දින යවා ඇත. ඒ අනුව ගිවිසුමේ වටිනාකම අඩුකර එම මුදල විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කරනු ඇත.

(iv) වී. සෙල්වසුදර්ශන්

ගිවිසුම වටිනාකමේ ඉතිරි මුදල වූ රුපියල් 980,272.00 ඇයගේ අර්ථ සාධක අරමුදලෙන් දැනටමත් අඩු කිරීමට කටයුතු කළ බව වාර්තා වෙයි. එම මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලය වෙත එවීමට නියමිතව ඇත.

(ඇ) නව තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමේ කටයුතු මේ වන විටත් ක්‍රියාත්මක වේ. එම පද්ධතියේ ආරම්භය ලෙස ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු 2020 දෙසැම්බර් මාසයේ සිට නව පද්ධතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. අනෙකුත් කටයුතුද අදියර වශයෙන් නව පද්ධතිය මඟින් ඉදිරියේදී ක්‍රියාත්මකවනු ඇත.

මහාචාර්ය පී.එම්.සී. නිලකරත්න
උපකුලපති